SINHALI - 65

# ඉස්ලාම් හි කාන්තා පිරිසිදුකම

සෙයික් මුහම්මද් බින් සාලිහ් අල් උතෛමීන්

ඉංග්‍රීසි පරිවර්තනය
ආචාර්ය සාලිහ් අස් සාලිහ්

සිංහල පරිවර්තනය
එස්. එම්. මන්සූර්

The Co-operative office for Call & foreigners Guidance at Sultanah

**The Co-operative Office for Call & foreigners Guidance at Sultanah**
Under the supervision of Ministry of Islamic Affairs and Endowment and Call and Guidance
Tel. 4240077 Fax 4251005 P.O. Box 92675 Riyadh 11663 E-mail: Sultanah22@hotmail.com

ඉස්ලාම් හි

# කාන්තා පිරිසිදුකම


සෙයික් මුහම්මද් බින් සාලිහ් අල් උථෛමීන්

ඉංග්‍රීසි පරිවර්තනය
ආචාර්ය සාලිහ් අස් සාලිහ්

සිංහල පරිවර්තනය
එස්. එම්. මන්සූර්



ප්‍රකාශනය
කැඳවීමේ හා මඟ පෙන්වීමේ සහයෝගී කාර්යාලය
අල් බදීයාහ් - සමාජ ඒකකය
රියාද් - සවුදි අරාබියාව

# පටුන


පෙරවදන ---------- 1

ඉංග්‍රීසි පරිවර්තකයාගේ පෙරවදන ---------- 4

හැඳින්වීම ---------- 7

1 - ඔසප් වීම යනු කුමක් ද? ---------- 9

2 - ඔසප් වීම: සිදුවෙන නවතින කාලය ---------- 10

ඔසප් වීම පවත්නා කාල සීමාව ---------- 11

ගර්භනී ස්ත්‍රියකගේ ඔසප් වීම ---------- 15

3 - ඔසප්වීමෙ හි ඇතිවෙන වෙනස්වීම් ---------- 18

4 - ඔසප් වීම හා සම්බන්ධ නීතිරීතීන් ---------- 20

1. සලාත් (නැමදීම) ---------- 20
2. අස්සවම් (උපවාසයේ යෙදීම) ---------- 22
3. තවාෆ් (කැබාව වටේ වාමාර්තව යාම)---------- 23
4. සමුගැනීමේ තවාෆයෙන් නිදහස් කිරීම ---------- 24
5. මස්ජිද(පල්ලි)යේ නැවතී සිටීම ---------- 24
6. නීත්‍යානුකූල ව සංසර්ගයේ යෙදීම ---------- 25
7. දික්කසාදය ---------- 26
8. දික්කසාදයට අදළ ඉද්දාව සහ ඔසප්වීම හා ඇති සබඳකම -- 28
9. නිදහස් ගර්භාශය ---------- 29
10. ගුස්ල් (ජල ස්නානය) අනිවාර්ය වීම ---------- 30

5. - ඉස්තිහා දාහ් ---------- 32

6. නිෆාස් යනු කුමක් ද?---------- 37

7. - ඔසප් වීම වැළැක්වීම: උපත් පාලනය හා ගබ්සාව ---------- 41

8. - ප්‍රශ්නෝත්තර ---------- 47

# පෙරවදන

මනුෂ්‍යයන්ගෙන් එක් පළුවක් පිරිමියා නම් අනෙක් පළුව ස්ත්‍රිය වෙයි. මේ අතින් පිරිමියා සතු සියලු ම අයිතිවාසිකම් හා යුතුකම් ස්ත්‍රියට ද සතු ය. මෙම අයිතිවාසිකම් ලබාගැනීමේ දී හා යුතුකම් ඉටුකිරීමේ දී ඔවුනොවුන්ට ම ආවේනික වූ ස්වාභාවික ලක්ෂණයන්, හැඟීම් හා ශාරීරික වෙනස්කම් තිබෙන බව අමතක නො කළ යුතුය. එවිට, මෙම දෙපාර්ශවය අතර ගැටීමක් ඇතිවන්නේ නැත: ප්‍රශ්න මතුවන්නේ ද නැත. ජීවිතය ඉතා සාර්ථක එකක් වෙයි, ඉන්ෂාඅල්ලාහ් !

එහෙත්, ස්ත්‍රී පුරුෂයන් සම්බන්ධ ව යම් යම් ආගම් අනුව පමණක් නොව, නූතන ප්‍රතිපත්තියන්ට අනුව ද හැසිරෙන ආකාරය කාගේත් මවිතයට ලක්වෙයි. එක් ආගමක්, එක් පැත්තකින් ස්ත්‍රිය දෙවියන්ගේ ස්ථානයට ගෙනගොස් දේවත්වය ඇරුඬ කොට පෙන්නූ අතර, අනෙක් පැත්තෙන් 'දේවදාසිය' නම් වූ ගණිකාවකගේ පහත් තත්ත්වයට ගෙන ආවේ ය. තවත් ආගමක් 'ස්ත්‍රියට ආත්මයක් තිබේ දැයි' වූ පුදුමාකාර පර්යේෂණයක යෙදුණේ ය. වෙනත් ආගමක් ස්ත්‍රිය යක්ෂණියකට ආරූඪ කළේ ය.

නූතන ප්‍රතිපත්ති - ස්ත්‍රිය විඳිනා දුකෙන් බේරා, ඇයගේ අයිතිවාසිකම් ලබා දී, ඇයට උසස් තත්ත්වයක් ඇතිකරලීමට තැත් කළ බව සත්‍යයකි. ඒ අතින් සාමාජීය, ආර්ථික, දේශපාලනමය හා තවත් යම් යම් දේ තුළින් ඇයට සෑහෙන තරමක ස්ථානයක් ලැබුනු බව නොරහසකි. නමුත්, එම ප්‍රතිපත්ති, ස්ත්‍රියට 'පිරිමින්ට වඩා වෙනස් වූ ශාරීරික ලක්ෂණ' ඇති බව හෝ 'ස්ත්‍රීභාවයක්' ඇති බව හෝ වටහා ගත්තේ නැත: නැතිනම් ඒවා වටහා ගත්තත්, ඒවා තුළින් ස්ත්‍රියගේ ස්වභාවය දෙස බැලුවේ නැත.

මෙ නිසා, ස්ත්‍රියකගෙන් කලවේලාවන් නොතකා බර වැඩ ගනු ලැබුවේ ය: පිරිමියාට සමාන ව ඇය ද තම ශරීර ශක්තිය යොදා වැඩ කළයුතු බව බලකරනු ලැබුවා ය. එක් පැත්තකින් ඇයට මෙම වේදනා විඳින්නට වූ අතර, අනෙක් පැත්තෙන් ඇය පිරිමින් සමඟ කරට කර දී නොයෙක් කාර්යයන් හි නියුතුවීම නිසා ඇය තුළ තිබුණු ලැජ්ජා බිය ගතිය ටිකින් ටික ඈත්වන්නට වුණි. එහි ප්‍රතිඵලය වූයේ සැමතැන විෂමාචාරය පැතිර යාමය.

අපි කවුරුත් සදාචාරාත්මක, ආධ්‍යාත්මික, ධර්මිෂ්ට මානව සමාජයක් නගා සිටුවීමට උත්සාහ කළ යුතු වෙමු. එවිට සියලු ම මිනිසුන්ගේ, ස්ත්‍රී පුරුෂයන්ගේ ජීවිතය සුඛිත මුදිත වෙයි: සදාචාරය රැකෙයි: යහපත් ගතිගුණ රජ කරයි. නමුත්, එය එසේ නොකර ආර්ථිකය පදනමක් කොට මානව සමාජය නගා සිටුවීම නිසා අද සෑම දෙයක ම මූල්‍යමය හැඟීමක් ඇති වී ඇත: සෑම කෙනෙක් ම මුදල් ලාභ පාඩුව තුළින් මිනිස් ජීවිතය බැලුවේ ය. එයින්, ජීවිතයේ සෑම අංගයක් ම විනාශ මුඛයට පත් වී ඇත. විශේෂයෙන් පවුල් ජීවිතය කඩාකප්පල් විය.

පවුලේ සැමියා උපයන මුදල බිරිඳ නාස්ති නොකර අවශ්‍යතාවයන් දැන හැඳින වියදම් කළ යුතුයි: තම දූ දරුවන්ගේ සදාචාරය, අධ්‍යාපනය, හික්මීම යනාදිය සිතට ගෙන කටයුතු කිරීම ද බිරිඳකගේ කාර්ය භාරයකි. පවුලේ සැමියා පටන් කුඩා දරුවා දක්වා ආදරය, කරුණාව හා යහපත් බැඳීම ඇති කිරීමේ මූලික තැන ගතයුත්තේ ද බිරිඳ ය. මෙලෙස හැදෙන වැඩෙන පවුලක් වාසනාවන්ත පවුලක් වනවාට සැක නැත.

එහෙත්, යම් පවුලක අඹු සැමි දෙදෙනා ම රැකියාවට ගොස් සවස තම නිවෙසට එනවිට, එම දෙදෙනා ම දැඩි විඩාවට පත් වන්නේ ය: කවරෙකු කාගේ අවශ්‍යතාවයන් ආදරයෙන් ඉටුකළ යුතු දැයි ප්‍රශ්නය කවදා හෝ මතුවෙයි. එයින් දෙදෙනාගේ සිත ගත දෙක ම බිඳ වැටෙයි: ඔවුන් ගේ සාමය හා සමගිය අඩුවෙයි: සමහරවිට ඔවුනතර අඬදබර ද ඇතිවන්නට පුළුවන. මේ සමග ඔවුන් ගේ දූ දරුවන්ගේ ඕනෑ එපාකම් ද සොයා බලන්න නොහැකි වනු ඇත. මීට ව්‍යතිරේකයක් වශයෙන් සැකසුනු සමහර පවුල් නැතුවා නොවේ. නමුත් අද පොදුවේ දක්නට ලබෙන තත්ත්වය මෙයයි.

මේ ගැන නොතකා, සමහරු මෙම මාවතේ ම තම 'ස්ත්‍රී අයිති වාසිකම් ලබා ගැනීමේ අරගලය' කරගෙන යෑම කණගාටුදායක කරුණකි. සමහර විට, ස්ත්‍රීන් විඳින දුක ඔවුන්ට එලෙස අරගලයක් පවත්වා ගෙන යන්න දිරි දුන්නා විය හැක. මෙයින්, තව තවත් විෂමාචාරය පැතිරී මානව සංහතිය තව තවත් අවුල් වෙනවා මිස යහපත් තත්ත්වයක් ඇති වන්නේ නැත. අද නැතත් හෙට මෙය පසක් කර ගන්නවාට සැක නැත.

ඉස්ලාමය ස්ත්‍රියගේ ස්වභාවය නිසියාකාර ව වටහාගෙන කවදත් යහපත් ව ජීවත්වීමට මග පෙන්වයි. එය, හින්දු ආගමේ මෙන් ස්ත්‍රියට දේවත්වය දී උසස් කළේ නැත: 'දේවදාසිය' කියා කුණු කූඩයට දැම්මේ ද නැත.

අල්ලාහ් මෙසේ පවසයි:
**"ඔවුහු ඔබගේ සළුපිළි වැනි ය: ඔබ ද ඔවුන්ගේ සළු පිළි වැනිය."**

(අල් කුර්ආන් 2 : 187)

"පුරුෂයන්ට භාර්යාවන් කෙරේ අයිතිවාසිකම් ඇති සේ, භාර්යාවන්ට ද ස්වාමි පුරුෂයන් කෙරෙහි (අයිතිවාසිකම්) ඇත්තේ ය."

(අල් කුර්ආන් 2 : 228)

මෙලෙස පැවසූ කුර්ආනය අනුව ක්‍රියාත්මක වූ ඉස්ලාමය ස්ත්‍රී පුරුෂයන් ඔවුනොවුන්ගේ ස්වාභාවික තත්ත්වයට එකඟ ව ඔවුනොවුන්ගේ අයිතිවාසිකම් ලබාගෙන යුතුකම් ඉටුකිරීමට ප්‍රායෝගික ව මගපෙන්වා ඇත.

එක් පැත්තකින් ස්ත්‍රී පුරුෂයන්ගේ යහපත් ජීවිතයට මග පෙන් වූ ඉස්ලාම්, අනෙක් පැත්තෙන්, ස්ත්‍රියගේ ශාරීරික යම් යම් දේ ද නිසියාකාරව වටහාගෙන, කිනම් පිළිවෙතක් පිළිපැද්දොත් හොඳාකාර ව එම කටයුතු කෙරේ ද යන්නට ද මග පෙන්වා ඇත.

එයට අදාළ අදහස් සියල්ල ම එක් රැස්කොට 'ඉස්ලාම් හි කාන්තා පිරිසිදුකම' නමින් පොතක් ව ඔබ අතට පත්කර ඇත. මෙය, සෙයික් මුහම්මද් බින් සාලිහ් අල් උථෛමීන් තුමාගේ **'අද්දිමාඋ අත්තබීඉය්‍යතු ලින්නිසාඋ'** කෘතියේ ඉංග්‍රීසි පරිවර්තනය සිංහලට පරිවර්තනය කරනු ලැබුවකි. මෙය සිංහලට පරිවර්තන කළ ශ්‍රී ලාංකික එස්. එම්. මන්සූර් මහතාටත්, පරිවර්තනයේ දී ඔහුට නන් අයුරින් සහය වූ එම්. යූ. එම්. රහ්බි මහතාටත් අපගේ කෘතඥතාවය පළ කර සිටිමු.

මෙම පොත එක් එක් ස්ත්‍රියක් ම කියවා, මෙහි ඇති අදහස් සිතට ගෙන, තම ජීවිතයේ පිළිපැදිය යුතුයි නම් වූ චේතනාවෙන් හා ආශාවෙන් ය සිංහලට පරිවර්තනය කළේ. යහපත්

ස්ත්‍රීන්ට අල්ලාහ් දෙලොවෙහි ම අගනා දායාදයන් දිය යුතු බවට අපි ප්‍රාර්ථනා කරමු. ඔහු කරුණාන්විත යː ඔහු කරා පිය නඟන සියල්ලන්ට ම ඔහුගේ දායාදයන් නොඅඩුව ලැබෙයි.

අල්ලාහ්ගේ නබි, මුහම්මද් (සල්) තුමාටත්, එතුමාගේ නෑදෑහිත මිතුරන්ටත්, එතුමාගේ යහමග ගමන් කළ/කරන සියලු දෙනාටත්, ඔහුගේ ශාන්තිය හා සමාදානය ලැබේවා!

පැසසුම් සියල්ල අල්ලාහ්ට පමණී. ඔහුගේ අනුග්‍රහය නොලැබ කවුරු හෝ වේවා කවදත්, කොහේදීත් විමුක්තිය ලබා ගන්නේ නැත.

• **ප්‍රකාශකයෝ**

**රියාද්**
**සවුදි අරාබියාව**
**1995 - 01 - 01**

# ඉංග්‍රීසි පරිවර්තකයාගේ පෙරවදන

بسم الله الرحمن الرحيم

إنَّ الحمْدَ للهِ تعالى نَحْمَدُهُ ، ونستعينُ بهِ ونَستَغْفِرُهُ ، ونعوذُ بالله تعالى من شرورِ أنفُسِنا وسيِّئاتِ أعمالِنا من يهْدِهِ الله تعالى فلا مُضِلَّ له ، ومن يُضْلِلْ فلا هاديَ له.وأشهدُ أن لا إلهَ إلاّ الله وحدَهُ لا شريكَ له. وأشهَدُ أنَّ محمّداً عبدُهُ ورَسولُهُ، صلى الله عليهِ وآلِهِ وسلَّمَ.

මහා කාරුණික අති දයාන්විත අල්ලාහ්ගේ නාමයෙන් ආරම්භ කරමි.

අල්ලාහ්ට පමණය, සියලු ම පැසසුම් හිමිවන්නේ, ඔහු ප්‍රශංසාකර, ඔහුගේ සහාය පතන අතර අපගේ පාපයන් හට ඔහුගේ සමාව ද අයැද සිටිමු. ඉතා ශ්‍රේෂ්ඨ වූ අල්ලාහ් වෙතින් පව් හා නින්දිත ක්‍රියාවන්ට ලක් නොවී සිටීමට ද ආරක්ෂාව පතා සිටිමු. අල්ලාහ් පෙන්වන යහමග කවරෙකුට ලැබෙන්නේ ද, එම තැනැත්තා වැරදි මාර්ගයක ගෙන යෑම කිසිවෙකුට කළ නොහැක: එමෙන් ම, අල්ලාහ් ගේ යහමග කවරෙකුට නොලැබෙන්නේ ද, එම තැනැත්තා යහමගට ගෙන ඒමද කිසිවෙකුටත් කළ නොහැක. තව ද, නැමදීමට හා අවනතවීමට ඇති එකම දෙවියා අල්ලාහ් බව මම සාක්ෂි දරමි; මුහම්මද් (සල්) තුමා අල්ලාහ්ගේ දාසයා හා වක්තෘවරයා බව ද මම සාක්ෂි දරමි. අවසාන වක්තෘවරයා වූ මුහම්මද් (සල්) තුමාටත්, එතුමාගේ උතුම් වූ පවුලේ සාමාජිකයින්ටත්, හිත මිතුරන්ටත්, අනුගාමිකයින්ටත් අල්ලාහ්ගේ ශාන්තිය හා සමාදානය ලැබේවා!

﴿ يا أَيُّها الذينَ آمنوا اتَّقوا الله حقَّ تُقاتِهِ ولا تَموتُنَّ إلاّ وأنتم مُسلِمون﴾[آلِ عمران الآية ١٠٢]

"ඊමාන්ධාරීනි*! ඔබ අල්ලාහ් ට (අවනත වී, ඔහු අනුමත කළ දේ කිරීමෙනුත්, තහනම් කළ දෙයින් වැළකී සිටීමෙනුත්) බියවිය යුතු ආකාරයට බියවන්න. තව ද ඔබ මුස්ලිම්වරුන් විලසින් ම මිස මිය නොයන්න."

(අල් කුර්ආන් 3 : 102)

﴿يا أَيُّها النَّاسُ اتَّقوا ربَّكُمُ الّذي خَلَقَكُمُ من نفسٍ واحِدَةٍ ، وخَلَقَ مِنها زوجَها وبَثَّ مِنْهُما رِجالاً كثيراً ونِساءً ، واتَّقوا الله الَّذي تساءَلُونَ بِهِ والأَرحامَ إنَّ الله كَانَ عليْكُم رقيباً﴾

---

* ඊමාන්, ඊමාන්ධාරීන්, මූ'මින්වරු යන වචනවලින් සඳහන්වන්නේ කුමක් ද යනු අවසාන පිටුවේ විස්තරකොට ඇත. මෙම පොතේ එන වචන එන සෑම තැනකදීම, එම විස්තරය සිතේ තබාගෙන කියවන්න.

"මිනිසුනි! ඔබ සියල්ල එක් ප්‍රාණයකින් මැවුවා වූ ඔබගේ ස්වාමියාට ඔබ සැම බියවන්න. තවද, එම ප්‍රාණය තුළින් ම ඔහුගේ සහකාරිය ඔහු මැවුවේ ය. ඉනික්බිති ව, එම ප්‍රාණ දෙක මගින් (ලොවෙහි) අපමණ පුරුෂයින් ද, ස්ත්‍රීන් ද පැතිර හැරියේ ය. එහෙයින් ඔහුට පමණක් බියවන්න. ඔහු තුළින්ම ය ඔබ එකිනෙකා (තමන්ගේ උරුමයන්) ඉල්ලා සිටින්නේ. තව ද, (ඔබගේ) ලේ ඥාතීන්ට දයාන්විත වන්න. නියත වශයෙන් ම අල්ලාහ් ඔබ නිරීක්ෂණය කරමින් සිටී."

(අල් කුර්ආන් 4 : 01)

﴿ يا أيُّها الَّذين آمنواْ اتَّقُواْ الله وقولواْ قولاً سَديداً ، يُصْلِحْ لكُمْ أعمالَكُم ويَغْفِرْ لَكُمْ ذُنُوبَكُمْ ، ومن يُطِعِ الله ورسُولَهُ فقدْ فازَ فَوْزاً عَظِيماً ﴾ [ الأحزاب ، الآية ٧٠،٧١]

"ඊමාන්ධාරීනි! අල්ලාහ්ට බියවන්න. තවද, අවංක වචනයන් (පමණක්) පවසන්න. අල්ලාහ් ඔබගේ ක්‍රියාවන් යහපත් කරයි: තව ද, ඔබගේ පාපයන්ට සමාව දෙයි. කවරෙකු අල්ලාහ්ට සහ ඔහුගේ වක්තෘවරයාට අවනත වන්නේ ද, හෙතෙම විශිෂ්ට ජයක් අත්පත් කරගනී."

(අල් කුර්ආන් 33 : 70,71)

أما بعد ..

فإنَّ أصدق الحديثِ كتابُ الله تعالى ، وخيرَ الهدي هدْيُ محمدٍ صلى الله عليه وآله وصَحْبِهِ وسلَّمَ ، وشرَّ الأمورِ محدثاتُها ، وكُلَّ مُحْدَثَةٍ بدعةٍ ، وكُلَّ بدعةٍ ضلالة ، وكُلَّ ضلالَةٍ في النار ،..

ඉක්බිති ව දැනගන්න...........

" වාක්‍යයන් අතරින් වඩා හොඳ වාක්‍යය දේව වාක්‍යය (කුර්ආනය) වෙයි. මග පෙන්වීම් අතරින් වඩාත් නිවැරදි ම මගපෙන්වීම මුහම්මද් (සල්) තුමාගේ මග පෙන්වීම වෙයි. දීන් (ඉස්ලාම් ) හි ඉතාමත් නින්දිත කාර්යයන් වන්නේ (ඉස්ලාමයේ සත්‍ය ඉගැන්වීම්වලට පටහැනි ව) අලුතින් ඇතිකරනු ලබන කාර්යයන් (බිද් අත්) ය. එක් එක් අලුත් කාර්යයක් ම නොමග යවන්නකි. නො මග යවන සියල්ලක් ම අපාගින්න දක්වා ඇද යන සුළු ය."

(මූලාශ්‍රය: මුස්ලිම්)

ඔබගේ දෑතෙ හි ඇති මෙම පොත, කාන්තාවන් සිය පවිත්‍රතාවය කෙසේ පවත්වා ගත යුතු ද යන්න ඉස්ලාමය තුළින් පෙන්වා දෙන විශේෂ කෘතියකි.

නොයෙක් ස්ත්‍රීන් විටින් විට මේ ගැන අසන්නට වූ හෙයින්, ශුද්ධ වූ කුර්ආනය ද නබි (සල්) තුමාගේ සත්‍ය වදන් ද පදනම් කොට, සවිස්තර ව ලිවීම වැදගත් බවත් අවශ්‍ය බවත් මට වැටහුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සෙයික් මුහම්මද් බින් සාලිහ් අල් උසෛමීන් තුමාගේ 'අද්දිමඋ අත්තබඉයියතු ලින්නිසාඋ' නමින් අරාබි භාෂාවෙන් රචිත වූ පොත ඉංග්‍රීසියෙන් පරිවර්තනයකොට, එයට අදාළ සමහර ප්‍රශ්න හා පිළිතුරු ද එක්කොට, ඔබ අතට පත්කිරීමට හැකි විය, අල්හම්දුලිල්ලාහ්.

මෙය තෘප්තිමත් ව නිමකර ගැනීමට උදව්කළ අල්ලාහ්ට මගේ ඉමහත් ප්‍රශංසාව හිමි වේ. මෙය නිසිලෙස සකස්කර ගැනීමට දිරිදුන් සෙයික් මුහම්මද් බින් සාලිහ් අල් උථෛමීන් තුමා හට මගේ අවංක කෘතඥතාවය හිමිවෙයි. මෙම කාර්යයෙ හි සෘජුව සහ වක්‍රාකාර ව උදව් උපකාර කළ සියලු දෙනාගේම උත්සාහය පිළිගෙන ඔවුන්ට තමාගේ ආශීර්වාදයත් හා අනුග්‍රහයත් පිරිනමන මෙන් අල්ලාහ්ගෙන්- ඔහුගේ උතුම් නාමයන් හා ගුණාංගයන් මෙනෙහි කරමින් ආයාචනා කර සිටිමි.

හිජ්රි 11. 07.1413.
ක්‍රි. පූ. 04. 01 1993.

අල්ලාහ්ගේ කරුණාව අයැද සිටින,
**ආචාර්ය සාලිහ් අස් සාලිහ්.**

මහා කාරුණික අති දයාන්විත
අල්ලාහ්ගේ නාමයෙන් .........

# හැඳින්වීම

ප්‍රශංසා සියල්ල අල්ලාහ්ට පමණක් හිමි වෙයි. අපි, ඔහු ප්‍රශංසාකර, ඔහුගේ සහාය ද අපගේ පාපයන් හට සමාව ද අයැද සිටිමු. අති ශ්‍රේෂ්ඨ වූ අල්ලාහ් වෙත පව් හා නින්දිත ක්‍රියාවන්ට ලක්නොවී සිටීමට ද ආරක්ෂාව පතා සිටිමු. අල්ලාහ් පෙන්වන යහමග කවරෙකුට ලැබෙන්නේ ද, එම තැනැත්තා වැරදි මාර්ගයක යොමු කිරීම කිසිවෙකුට කළ නොහැකිය. එමෙන් ම අල්ලාහ්ගේ යහමග කවරෙකුට නොලැබෙන්නේ ද, එම තැනැත්තා යහමගට යොමු කිරීම ද කිසිවෙකුටත් කළ නොහැකිය. තව ද, නැමදීමට හා අවනත වීමට ඇති එක ම දෙවියා අල්ලාහ් (සු.ව)[1] බව මම සාක්ෂි දරමි: මුහම්මද් (සල්) තුමා අල්ලාහ්ගේ දාසයා හා වක්තෘවරයා බව ද මම සාක්ෂි දරමි: අල්ලාහ්ගේ සලවාත්[2]ය හා සමාදානය ඔහුගේ නබිවරයා වූ මුහම්මද් (සල්) තුමාට ලැබේවා!

ස්ත්‍රීන්ගේ ඔසප් වීම තුන් ආකාරයකින් ඇති වන බව පැහැදිලි ය.

1. නියමිත කාලයේ ඇතිවෙන ඔසප් වීම
2. ඉස්තිහාදාහ් (නියමිත කාලයට අමතරව ස්ත්‍රීයකගේ ගර්භාශය තුළින් ලේ පිටවීම)
3. නිෆාස් (දරු ප්‍රසූතයට පසු ලේ පිටවීම)

මේවා සම්බන්ධ ව කුර්ආනය සහ සුන්නාහ් ව පදනම්කොට විස්තර ලබා ගැනීම ඉතා අවශ්‍ය ය: ප්‍රයෝජනවත් ය.

එයට හේතුව නම්:

අ) අල්ලාහ්ගේ අණසක සියල්ල ලබාගත හැකි මූලාශ්‍රයන් කුර්ආනය හා සුන්නාහ් වෙයි.

ආ) සලාතයට - නැමදීමට - අවශ්‍ය දේ (ඔසප් වීමෙන් පිරිසිදුවීමේ පිළිවෙළ) දැනගැනීමෙ හි මෙම (ඉස්ලාමයේ) මූලාශ්‍රයන් අනුව විස්තර ලබාගන්නා විට යම් සැනසීමක්, පහසුවක් හා සතුටක් ලැබෙන බව ඕනෑම කෙනෙකුට ප්‍රත්‍යක්ෂ වනු ඇත.

(ඇ) වෙනත් කිනම් අන්දමකින් ලබාගන්නා විස්තරයන් වුව ද ඒවා සාපේක්ෂ වශයෙන් කුර්ආනයෙන් හා සුන්නාහ්වෙන් ලබාගන්නා විස්තරයට වඩා පරිපූර්ණ නොවන්නේ ය.

---

1. (සු. ව.) : **සුබ්හානහු වතආලා:** 'කීර්තිය හා ශ්‍රේෂ්ඨත්වය ඇත්තා වෙයි' යනු මෙහි අදහසයි.
2. **සලවාත්:** 'අල්ලාහ්ගේ ශාන්තිය ඔහුගේ වක්තෘ වූ මුහම්මද් (සල්) තුමාට ලැබේවා!' යනුවේ. මෙහි තේරුම: අල්ලාහ්ගේ පැසසුම හා අදහසේ උසස් ස්ථානයේ වැජඹ සිටින මලායිකාවරුන්ට එතුමා ගැන කියා දීම ද වේ. මලක්වරු හා සියලු ම ඊමාන්ධාරීන් නබිතුමා වෙත සලවාත් කියයුතු ය.

﴿ إنّ الله وملائكتَهُ يُصلُّون على النَّبيِّ يا أيُّها الَّذينَ آمنوا صَلُّوا عَلَيهِ وسَلِّموا تَسليماً ﴾ [ الأحزاب، الآية ٥٦ ]

"අල්ලාහ් සහ ඔහුගේ මලායිකාවරු නබිතුමා වෙත සලවාත් නම් වූ ශුභපැතුම් කරන්නේ ය. ඊමාන්ධාරීනි! ඔබ ද එතුමා වෙත සලවාත් හා සලාම් කියන්න."

(අල් කුර්ආන් 33 : 56)

මෙම මූලාශ්‍රයන් වූ කුර්ආනයට හා සුන්නාහ්ට පසුව පිළිගත හැක්කේ, මෙම මූලාශ්‍ර දෙකට කිසිදෙයක් සම්බන්ධ ව විරුද්ධ නොවූ සහාබාවරුන් (නබි (සල්)[3] තුමාගේ මිතුරන්) ගෙන් උගතුන් ව සිටිය අයගේ කියමන් ය. සමහර විට, මෙම ගණයට නොවැටෙන සහාබි කෙනෙක් විසින් වෙනත් අදහසක් කියා ඇත්තේ නම්, එය කුර්ආනයට හා සුන්නාහ්ට ඉතා සමීප වූ අදහසක් ද යනු පරීක්ෂාකර බැලීම ඉතා අවශ්‍ය වේ.

අල්ලාහ් මෙසේ පවසයි:

﴿ فإن تنازعتم في شيء فردُّوهُ إلى الله والرسول ، إن كُنتُم

تؤمنون بالله واليوم الآخر ذلك خيرٌ وأحسنُ تأويلاً ﴾

**" ඉක්බිති ව, යමක් පිළිබඳ ව යම් මත භේදයක් පැන නැගුනහොත්, ඔබ සත්‍ය වශයෙන් ම අල්ලාහ් සහ කියාමත් - පරමාන්ත - දිනය විශ්වාස කරන්නේ නම් එම ආරවුල අල්ලාහ් සහ නබිවරයා වෙත යොමු කරන්න. එක ම නිවැරදි හා සුදුසු ම මාර්ගය එය යි. (අවසානයේදී සලකන විට) විශිෂ්ටතම මාර්ගයත් එයයි."**

**(අල් කුර්ආන් 4 : 59)**

මම මෙවැනි සිතැති ව, ඔසප් වීම සම්බන්ධ ව ඇති ඉස්ලාමීය නීතිරීතීන් එක්රැස්කොට ඔබ අතට පත් කරමි. පහත සඳහන් ප්‍රධාන මාතෘකා යටතේ එයට අදාළ විස්තර සියල්ල අඩංගු වී ඇත.

1. ඔසප් වීම යනු කුමක් ද?
2. ඔසප් වීම ඇතිවෙන කාලය
3. ඔසප් වීමෙ හි ඇති වෙනස්කම්
4. ඔසප් වීම ගැන වූ නීති රීතීන්
5. ඉස්තිහාදාහ් ව හා එයට අදාළ නීති රීතීන්
6. නිෆාස ය හා එයට අදාළ නීති රීතීන්
7. ඔසප් වීම ක්‍රමවත් බවට පත්කරන උපායයන්

---

3. (සල්): සල්ලල්ලාහු අලෛහි ව සල්ලම්: 'අල්ලාහ්ගේ ශාන්තිය හා සමාදානය මුහම්මද් නබිතුමා වෙත ලැබේවා!' යනු මෙහි අදහස වෙයි.

1

# ඔසප්වීම යනු කුමක් ද?

අරාබි භාෂාවෙන් 'හෙල්' (ඔසප් වීම) යන්නෙ හි තේරුම යමක් වැක්කිරීම, ගැලීම හෝ වැගිරීම වහනය වීම නම් වේ. ඉස්ලාමය අනුව, යම් බාහිර හේතුවක් නොමැති ව කිසියම් නියමිත කාලයක් තුළ ස්ත්‍රීන් ගෙන් ස්වාභාවික ව පිටවෙන රුධිරය යනු මෙහි තේරුම වේ. එහෙයින් ස්වාභාවික ව ම ඇතිවෙන මෙම රුධිර පිටවීම සමග එක්තරා රෝගයක් හෝ තුවාලයක්, ගබ්සාවක් නැතහොත් දරු ප්‍රසූතයක් තුළින් හෝ පිටවෙන රුධිර සසඳා බැලීම නොකළ යුතු යි.

ස්ත්‍රීන්ට ඇතිවෙන මෙම ඔසප් වීම - ඔවුන්ගේ ශාරීරික තත්ත්වය, පරිසරය, ක්ෂණික ව ඇතිවෙන බාහිර බලපෑම් නැතිනම් වෙනස්කම් අනුව වෙනස්වන සුළු ය.

මේ සම්බන්ධ ව, අපගේ බුද්ධිය අප හට ඉතා වැදගත් කරුණක් ඒත්තු ගන්වයි.

එනම්:-

මවකගේ ගර්භාශය තුළ ඇති එම කළලයට ඉතා කරුණාවන්ත කෙනෙකුට වුව ද එක් වේලක පෝෂණදායක ආහාරයක් සැපයිය නොහැකිය යන්නයි. මෙවන් තත්ත්වයක, කරුණා දයාව හා යමක් නිසිලෙස මැවීමේ ශක්තිය ද ඇති අල්ලාහ් විසින්, ලේ ගමන් කිරීමේ ක්‍රමවත් පිළිවෙළක් (ස්ත්‍රිය තුළ) ඇති කර ඇත්තේ ය. එම ක්‍රමය තුළින් නිෂ්පාදිත පෝෂණදායක ආහාරය පෙකනි වැල ඔස්සේ ගර්භා ශයෙ හි ඇති ජීවයට ලැබෙන්න සලසා ඇත. ස්ත්‍රියක් ගැබ්ගත් විට ඔසප් වීම නැවතීමට හේතුව මෙයයි. මෙකල් හි ස්ත්‍රියක් රුධිර පිටවීමට ලක්වන්නේ කලාතුරකිනි.

# 2

# ඔසප් වීම: සිදුවෙන, නවතින කාලය!

## වයස් සීමාවක් තිබේ ද?

එක් ස්ත්‍රියකට අවුරුදු දොළහටත් පනහටත් අතර කාලය තුළ ඔසප් වීම සිදුවෙයි. එහෙත්, ඇයගේ ශාරීරික තත්ත්වය, පරිසරය හා අවට තත්ත්වය අනුව මෙය නියමිත කාලයට පෙර හෝ පසුව හෝ සිදු වෙන්නට ද පුළුවන. කීර්තිධර ඉස්ලාමීය විද්වත්හු ඔසප් වීම සම්බන්ධ ව නියමිත වයස් සීමාවක් ඇත්තේ ද යන්නෙහිත්, මෙම ඔසප්වීමේ කාල සීමාවට පෙර හා පසුව පිටවෙන රුධිර සම්බන්ධ ව, එය ඔසප් වීමක් නිසා පිටවෙන රුධිර ද, නොඑසේනම්, වෙනත් කාරණයක් නිසා පිටවෙන රුධිර ද යන්න පිළිබඳ ව වෙනස් වූ අදහස් දරති.

මෙම වෙනස් වූ අදහස් සම්බන්ධ ව ඉමාම් අද් දාරිමී[4] තුමා මෙසේ පැවසුවේ ය:

"මට නම් මේ සියල්ල ම වැරදි බව පෙනේ! හේතුව, ස්ත්‍රියක ගේ වයස ගැන නොතකා, ඇයට රුධිර පිටවුනේ ද නැද්ද යන්න බැලීමය අප විසින් කළයුත්තේ. එවිට රුධිර පිටවුණු බව අපට වැටහෙන්නේ නම් එය ඔසප් වීමෙන් පිට වූ රුධිර බව පිළිගත යුතු ය. සියල්ල දන්නේ අල්ලාහ් පමණී."

ඉමාම් අද් දාරිමී තුමාගේ අදහස පිළිගත යුතු සත්‍යයකි. සෙයිකුල් ඉස්ලම් ඉබ්නු තෛමියියා[5] (රහ්) තුමා ද මෙම අදහස ම දරන්නේ ය.

එමනිසා, ස්ත්‍රියක් තමාට රුධිර පිටවෙන බව දුටුවහොත් එය ඔසප් වීමෙන් සිදුවෙන බව වටහාගත යුතුය. ඇයගේ වයස අවුරුදු නවයට වඩා අඩු බව හෝ පනහට වඩා වැඩි බව හෝ තිබීම මෙහිලා ප්‍රශ්නයක් ලෙස නොසැලකිය යුතු ය. එයට හේතුව, අල්ලාහ් සහ ඔහුගේ නබි (සල්) තුමාට අනුව යම් ස්ත්‍රියකට රුධිර පිට වූ බව දැනගතහොත් එය ඔසප් වීමෙන් සිදුවෙන බව වටහාගත යුතු බව ය. එසේ නැතිව, ඔසප් වීම ආරම්භ වීමට හා නැවතීමට නියමිත වයස් සීමාවක් අල්ලාහ් හෝ නබි (සල්) තුමා හෝ පවසා නැත. මෙයට අදළ වයස් සීමාවක් ගෙන දැක්වීමට නම් කුර්ආනයේ හා සුන්නාහ්වේ සාක්ෂි ලබාගැනීම අනිවාර්ය ය. නමුත් එවැන්නක් ඒවායේ ද දක්නට නැත.

---

4. **අද් දාරිමී:** මෙතුමා ඉස්ලාමීය විද්වතුන් අතරින් ප්‍රකට කෙනෙකි. හිජ්රි 181 හි උපත ලැබූ මෙතුමාගේ අදහස් ඉමාම්වරුන්වන මුස්ලිම්, අබුදවුද්, තිර්මිදි යනාදීන් තම ග්‍රන්ථවල විශේෂයෙන් සඳහන්කොට ඇත. මෙතුමා අධික ලෙස දුර බැහැර ගමන් ගිය කෙනෙකි. තව ද, මෙතුමා අගනා ඉස්ලාමීය උපදෙස් රාශියකට මූලිකයෙක් ද වෙයි. හිජ්රි 255 දී මෙතුමා කාලක්‍රියා කළේ ය.

5. **ඉබ්නු තෛමියියා:** ඉස්ලාමීය විද්වතෙක් වන මෙතුමා ක්‍රි. ව. 1263 දී උපන්නේ ය. මෙතුමා ඉස්ලාමයේ නොයෙකුත් අංශයන් ගැන මනා අවබෝධයකින් හෙබි කෙනෙකි. නබි (සල්) තුමාගේ සුන්නාහ්වට සම්පූර්ණ ලැදිකමක් දැක් වූවා පමණක් නොව, එය ආරක්ෂා කරගැනීමට ද වෙහෙස වූ කෙනෙකි. මෙතුමා අනේක වාරයන් හි හිරේට යන්න හේතු වූවත් වූ දර්ශනිකයන් හා වෙනත් උගතුන්, ඉස්ලාමය තුළට පිටස්තර දේ එක්කිරීමට තදින්ම විරුද්ධ වූවෙකි. තව ද, මෙතුමා මහා සිරියාවෙන් ආ තාතාරීන්ගේ ආක්‍රමණ උත්සාහය පරදවා මුස්ලිම්වරුන් බේරාගැනීමෙහි හැසුරුනේ ඉතා දක්ෂ ලෙසය. ඉස්ලාමය තුළට පිටස්තර දේ එක්කිරීමට විරුද්ධ ව මෙතුමා දුන් 'ෆත්වා' (ඉස්ලාමීය නීතිමය තීන්දුව) නිසා හිරේ තබනු ලැබ දමස්කස් හිර අඩස්සියේ සිටිය දී, ක්‍රි. ව. 1328 දී මරණයට පත් වූයේ ය. අදත් යමෙක් ඉස්ලාමීය දැනුම ලබා ගැනීමට එතුමාගේ ලියවිලි ඉතාමත් ප්‍රයෝජනවත් වන්නේය. අල්ලාහ්ගේ ආශිර්වාද එතුමාට ලැබේවා!

## ඔසප් වීම පවත්නා කාල සීමාව

එක් ස්ත්‍රියකට ඔසප් වීම ඇතිවුවහොත් එය කොපමණ කලක් පවත්නේ ද යන්නෙ හි ඉස්ලාමීය විද්වතුන් අතර විවිධ මත දක්නට ඇත. සමහර විද්වතුන්, "ඔසප් වීම සාමාන්‍ය වශයෙන් හෝ දැඩි වශයෙන් හෝ ඇතත් එයට අදාළ දින ගණන මෙපමණය' යි සීමාවක් නැත" යනු කියයි. මෙම පොතේ කර්තෘ "මෙම අදහස (මීට ඉහත) අද් දාරිමී තුමා දැරූ අදහසටත්, සෙයිකුල් ඉස්ලාම් ඉබ්නු තෛමියියා (රහ්) තුමා පිළිගත් අදහසටත් එකඟය" යනු කියයි. මෙයමය නිවැරිදි අදහස වන්නේ. හේතුව, මෙම අදහස කුර්ආන්, සුන්නාහ් සහ සමාන අදහස්වලට අදාළ සාක්ෂි තුළින් ඔප්පුවන බැවිනි.

**පළවෙනි සාක්ෂිය:**

අල්ලාහ් පවසයි:

﴿ ويسألونَكَ عن المحيضِ قل هُو أذًى فاعتزلوا النساءَ في المحيضِ ولا تقرَبُوهُنَّ حتى يطْهُرن ﴾ [ البقرة ، الآية ٢٢٢ ]

**" ඔවුහු ස්ත්‍රීන්ගේ මාස් ශුද්ධිය ගැන විමසති. ඊට මෙසේ පවසන්න: එය අපිරිසිදු තත්ත්වයකි. එහෙයින් ස්ත්‍රීන්ගේ මාස්ශුද්ධි කාලයේ ඔවුන්ගෙන් ඈත් වී සිටින්න."**

(අල් කුර්ආන් 2 : 222)

ඔසප් වීම පවතින කාලයේ දී කාන්තාවෝ ස්වභායෙන් ම අපිරිසිදු (කිල්ල) තත්ත්වයක පසුවන්නෝ ය. එනිසා ඒ කාලවල දී නීත්‍යානුකූල ලිංගික සංසර්ගයෙන් පිරිමින් ඈත් වී සිටිය යුතු බවට අල්ලාහ් නියෝගකොට ඇති බව මනාව පැහැදිලි වේ. මෙය නිසිලෙස අපි වටහාගත යුතුය. එසේ නැති ව එක් රැයක්, එක දවසක්, දවස් තුනක්, දවස් පහලොහක් යනුවෙන් කාල සීමාවක් ඔහු ඇතිකළේ නැත. ඔසප් වීම (අපිරිසිදු තත්ත්වය) ඇත, නැතහොත් එය නැත (එනම් පිරිසිදු ව සිටින්නීය.) යනු සම්බන්ධ ව අල්ලාහ් ඇතිකර දී ඇති ක්‍රමය අපට සෑහෙන සාක්ෂියක් ව ඇත්තේ ය.

**දෙවෙනි සාක්ෂිය:**

තම භාර්යාව වූ ආයිෂා (රලි)[6] තුමියට 'උම්රා'[7] වෙනුවෙන් 'ඉහ්රාම්'[8] ඇඳගත් පසුව ඔසප් වීම ඇතිවුවහොත් කුමක් කළ යුතු දැ' යි, නබි (සල්) තුමා දුන් විස්තරය පිළිගත හැකි හදීස් ග්‍රන්ථයන් හි සඳහන් වී ඇත. එයින් පැහැදිලි වන්නේ කුමක් ද කියා බලමු.

එතුමා මෙසේ පැවසුවේ ය.

"(එහි) වන්දනා කරුවෙක් ඉටුකළ යුතු කාර්යයන් සියල්ල ම ඉටු කරන්න. එහෙත්, (ඔසප් වීමෙන්) පිරිසිදු වනතුරු කඃබාව තවාෆ් කිරීම (වටේ යෑම) නොකරන්න."[9] ඇය (ආයිෂා), "මම නහ්ර් දින (දුල් හජ් 10 වෙනි දින) පිරිසිදු වූයෙමි"යි කීවා ය."

---

6. **(රලි) රලියල්ලාහු අන්හු/අන්හා:** අල්ලාහ් එතුමා/එතුමිය පිළිගනිත්වා!
7. **උම්රා:** මක්කම කරා යන ගමන. මෙම ගමනෙහි දී කඃබාව හත් වරක් තවාෆ් කිරීම (කඃබාව වටේ යෑම), සෆා මර්වා කඳුගැට අතර හත් වරක් සර් කිරීම යනාදිය ඉටුකළ යුතුය.
8. **ඉහ්රාම්:** මෙහි වචනානුසාරයෙන් වූ තේරුම වනාහි 'පිරිසිදු වීම: ශුද්ධවන්තකම' යනාදිය වෙයි. නබි (සල්) තුමාගේ සුන්නාහ් ව අනුව, යම් වර්ගයකට අයත් ඇඳුම් ඇඳ, යම් යම් ක්‍රියාවන්ගෙන් ඈත් වී සිටීම මෙම වචනයෙන් අදහස් වෙයි. මෙය නබි (සල්) තුමා නියමකළ 'මවාකීත්' නම් වූ ස්ථානයන් හි සිට ක්‍රියාවට නගනු ලැබේ.
9. **මූලාශ්‍රය:** සහීහුල් බුහාරි (අරාබි - ඉංග්‍රීසි) වෙළුම: 1, පි: 182-3 හදීස් අංකය: 302.

තවත් සත්‍ය හදීසයක් පහත සඳහන් විස්තරය දෙයි:

"නබි (සල්) තුමා ඇය (ආයිෂා තුමිය)ට පැවසුවේ යː "ඔබ ඔසප් වීමෙන් පිරිසිදු වනතෙක් සිටින්න. පසුව, 'අත්තන්ර්ම්' (මක්කමේ එක් ස්ථානයක්) වෙත යන්න. එහි දී ඉහ්රාම් ඇඳ (උම්රා ඉටුකළ පසු) එවැනි ස්ථානයක අප සමග එක්වන්න."[10]

නබි (සල්) තුමා ආයිෂා (රලි) තුමිය හජ් කර්තව්‍යයන් ඉටු කිරීමෙන් නවත්වාලීමට හේතු වූයේ, එවිට ඇය කෙරෙහි පැවතුන පවිත්‍රතාවයට අදාළ කරුණු බව පැහැදිලි වේ. ඒ හැර, ඇයට ඔසප් වීම තුළින් පිටවෙන රුධිර සම්බන්ධ ව කාල සීමාවක් ගැන එතුමා කිසිවක් නොකීවේ ය. එහෙයින්, මේ සම්බන්ධ වූ ඉස්ලාමීය නීති රීතීන් ඔසප් වීමෙන් රුධිර පිටවීම හා එසේ නැති (රුධිර නොපිටවෙන) තත්ත්වය අනුව ඇති බව පෙනීයයි.

## තුන්වෙනි සාක්ෂියː

ස්ත්‍රීන්ගේ ඔසප් වීම පටන් ගැනෙන නවතින වයස සම්බන්ධ ව සමහර නීති වේදීන් යම් යම් තක්සේරු කිරීම් කර ඇතː. විස්තර ද දී ඇත. එහෙත් අල්ලාහ් අනාවරණය කළ කුර්ආනයේ හෝ නබි (සල්) තුමාගේ සුන්නාහ්වේ හෝ ඒ ගැන සඳහන් වී නැත. මෙම තක්සේරු කිරීම් හා විස්තර මනාව දැනගෙන, මෙය අල්ලාහ් වෙනුවෙන් වූ අවනතවීම් හි පිළිපැදිය යුතු අනිවාර්ය කාර්යයන් නම් අල්ලාහ් හා ඔහුගේ නබි (සල්) තුමා මේ ගැන සෑම කෙනෙකු ම දැනගැනීම පිණිස මනාලෙස පැහැදිලි කර දෙන්නට ඉඩ තිබුණි. මන්ද, අල්ලාහ්ට අවනත වීමේ අනේක කාර්යයන් හි ඉස්ලාමීය නීතිය එතරම් වැදගත් ව තිබීම එයට ප්‍රධාන හේතුවක් වන නිසා ය. ඔසප් වීම - එයට අදළ නීතිරීති හා විස්තර මත රැඳී පවතින්නේ සලාතය ඉටු කිරීම, උපවාසයේ යෙදීම, විවාහ වීම, දික්කසාද කිරීම, ප්‍රවේණිය (Inheritence) යනාදිය ඒවාට අදළ නීතිරීති මත රැඳී පවතිනවා මෙන් ය.

අල්ලාහ් සහ ඔහුගේ නබි (සල්) තුමා පහත සඳහන් කාර්යයන් සම්බන්ධ ව මෙසේ විස්තරකොට ඇති බව අපි දනිමුː

* සලාතය - මෙයට ඇති ගණන, වේලාව, රුකූඋ, සුජුද් යනාදිය.
* සකාත්[11] - මේ සඳහා වූ සම්පත්, දේපල වර්ගː නිසාබ්[12] නම් වූ ප්‍රමාණය, මෙය ලබන්නන් ගැන වූ විස්තරය යනාදිය.
* උපවාසය - මේ සඳහා වූ කාලය, (උපවාසයේ යෙදී සිටිය යුතු) එක් දිනකට වූ වේලාව යනාදිය.
* හජ් - මෙයට අදළ යුතුකම් හා ක්‍රම යනාදිය.
* දෛනික ජීවිතයේ ඇති ආහාර පාන ගැනීම, නිද ගැනීම, තම බිරිඳ සමඟ සංසර්ගයේ යෙදීම, වාඩි වීම, තම නිවසට ඇතුළු වීම හා එයින් පිටවීම, දෙවිට පිළට යෑම, ඉස්තින්ජාර්[13] කිරීමෙ හි කොපමණ ගල්කැට පාවිච්චි කරන්නේ ද යනාදිය.

---

10. **මූලාශ්‍රයː** සහීහුල් බුහාරි (අරාබි - ඉංග්‍රීසි) වෙළුමː 3, පිː 9, හදීස් අංකයː 15.
11. **සකාත්ː** ඉස්ලාමයේ නීතිරීති වලට අනුකූල ව මුදල් හදල් ඇති මුස්ලිම් වරුන්ගෙන් රැස්කොට දුගී දුප්පත් අයට දෙනුලබන එක්තරා දීමනාවක්. ඉස්ලාමයේ ප්‍රධාන අනිවාර්ය කාර්යයන්ගෙන් මෙය ද එකකි.
12. **නිසාබ්ː** මුස්ලිම්වරයෙක් අවුරුද්දක් අවසාන වනවිට තමන්වෙත ඇති ඉතා අඩු ප්‍රමාණයේ සම්පත් හා දේපල මෙනමින් සඳහන් වේ. මෙසේ ඇති එම සම්පත් වර්ග හා ප්‍රමාණය අනුව මෙම සකාත් බද්ද අයකරනු ලැබේ. යමෙක් වෙත ඇති ශුද්ධ වාර්ෂික මුදල් වෙනුවෙන් 2.5% අය කෙරේ.
13. **ඉස්තින්ජාර්ː** කෙනෙකුගේ රහස් ප්‍රදේශයන් ඔත්ත ගණනේ ගල්වලින් (ගල් තුනකට නො අඩුව) පිරිසිදු කිරීමට මෙසේ කියනු ලැබේ. නබී (සල්) තුමා පැවසුවේයː "කවරෙකු හෝ තම රහස් ප්‍රදේශ ගල්වලින් පිරිසිදු කරන්නේ නම් ඔත්ත ගණනේ ගල් ගෙන පිරිසිදු කළ යුතුයි." (සහීහුල් බුහාරි, අරාබි - ඉංග්‍රීසි, වෙළුමː 1, පිː 114, හදීස් අංකයː 163)

මෙවැනි, ජීවිතයේ උපත සිට විපත දක්වා කළ යුතු ලොකු කුඩා සෑම දෙයක් ම කෙසේ කළ යුතු ද යන්න, අල්ලාහ් තම දහම තුළින් සම්පූර්ණ ව කියා දී ඊමාන්ධාරීන්ට පිහිට වී ඇත.

අල්ලාහ් පවසයි:

﴿ ونزّلنا عليكَ الكِتابَ تِبياناً لكلِّ شيءٍ ﴾ [ النحل،الآية ٨٩]

**"(නබී තුමාණෙනි!) ඔබ වෙත මෙම ග්‍රන්ථය අපි අනාවරණය කළෙමු. මෙය සියලු දේ ඉතා පැහැදිලි ව විස්තර කරයි."**

(අල් කුර්ආන් 16 : 89)

﴿ مَا كانَ حديثاً يُفترى ولكِنْ تصديقَ الذي بين يديهِ وتفصيلَ كل شيءٍ ﴾ [ يوسف، الآية١١١]

**"(කුර්ආනයෙ හි විස්තර කර ඇති) මෙම කරුණු ගොතා පවසන ලද ඒවා නොවේ. (කුර්ආනය වූ) මෙය මීට ප්‍රථම අනාවරණය කළ දිව්‍ය ග්‍රන්ථ (ආගම්) සත්‍ය බවට සාක්ෂි දැරීමක් ද, සියලු දේ විස්තර කිරීමක් ද වෙයි."**

(අල්කුර්ආන් 12 : 111)

එහෙත්, (ඔසප් වීම සම්බන්ධව වූ නීති වේදින්ගේ) තක්සේරු කිරීම් ගැන අල්ලාහ්ගේ කුර්ආනයේ හෝ නබි (සල්) තුමාගේ සුන්නාහ්වෙ හි කිසිවක් දක්නට නැත. එසේ හෙයින්, එම අදහස් වෙත කෙනෙකුගේ සිත යොමු නොකර ප්‍රතික්ෂේප කළ හැකි බවට පැහැදිලි ය. ඇත්ත වශයෙන් ම (ඉහත සඳහන් කළ පරිදි) මේ ගැන තීරණයක් ගන්නා විට ඔසප් වීමෙන් රුධිර පිටවී ඇති ද නැති ද යන්න පදනම් කරගත යුතු ය.

මේ ගැන අදහස් හුවමාරු කරන විට අපි එක් වැදගත් දෙයක් අමතක නොකළ යුතු යි. එනම්, අල්ලාහ් අනාවරණය කළ අල් කුර්ආනය, නබි (සල්) තුමාගේ සුන්නාහ්ව, හොඳහැටි දන්නා ඉජ්මාඃ[14]ව නැතහොත් පැහැදිලි කියාස්[15] යනාදියෙන් එකකින් වූ ඉතා පැහැදිලි සාක්ෂියක් නොමැති ව ඉස්ලාමීය තීරණයක් අනුමත කළ නොහැකි බව ය.

---

14. **ඉජ්මාඃ** : කුමන පරම්පරාවක වුව ද ඇත්තා වූ භක්තිමත්, යහපත් මාර්ගයේ යන මුස්ලිම් විද්වතුන් ගන්නා ඒකමතික අදහසට මෙම නම යෙදේ. යම් දෙයක් ගැන කුර්ආනයේ හෝ සුන්නාහ්වේ හෝ සෘජු ව (පැහැදිලි ව) සඳහන් කර නැති අවස්ථාවක දී ඉජ්මාඃ ව වලංගු ස්ථිර සාක්ෂියක් බවට ගනු ලැබේ. (ෆතාවා ඉබ්නු තෛමියියා, වෙළුම: 19, පි: 5-8, 192-202) නබි (සල්) තුමාගේ සත්‍ය හදීස් රැසක් අනුව, "තමාගේ සමාජයේ සිටින විද්වතුන් වැරදි මගක් පෙන්වීමෙහි ද වැරදි ක්‍රියාවන් හි ද ඒකමතික අදහසක් නොගන්නේ ය" යනු පවසා ඇත. මේ අනුව ය මෙම ඉජ්මාඃ ව ද පැවත එන්නේ. අල්ලාහ් මෙවැනි වැරදිවලින් මොවුන් ව ආරක්ෂා කරන්නේය. හේතුව, ඔවුහු නබි (සල්) තුමාට ඉතා සමීප වූ පරම්පරාවෙන් වූවන් හෙයින් ය. යමක් ගැන ඒකමතික අදහසකට - තීරණයකට - (ඉජ්මාඃවකට) ඒමෙ හි නබිතුමාගේ මිතුරෝ ඉතාමත් සුදුස්සෝ වන්නෝය.

15. **කියාස් :** යම් දෙයක් සම්බන්ධ ව කුර්ආනය, සුන්නාහ් ව, ඉජ්මාඃව තුළින් පැහැදිලි විස්තරයක් ද තීරණයක් ද නොලැබුණු විට එකල්හි යමක් සම්බන්ධව ගත් තීරණයකට සමාන තීරණයක් ගැනීමට මෙම නම භාවිතා කරනු ලැබේ. මෙසේ ගනු ලබන තීරණය කුර්ආන්, සුන්නාහ්, ඉජ්මාඃ යනාදියේ සාක්ෂි ඇති ව ගනු ලැබූ වෙනත් තීරණයකට එකඟ ව, සමාන ව තිබෙනු ඇත. උදහරණයක් වශයෙන්: 'මත් ද්‍රව්‍යයක් වූ මර්ජුවානා හරාම් යඃ නොගත යුත්තක් ය' නම් වූ සමානත්වයෙන් යුත් තීරණය, "මත් කරන දේ සියල්ල ම මත්පැන් වේ: මත්පැන් සියල්ලක් ම හරාම් (තහනම්) ය" (සහීහ් මුස්ලිම්, ඉංග්‍රීසි අනුවාදය, වෙළු : 3, පි: 1108, හදීස් අංකය: 4963) නම් වූ හදීසය අනුව ගත් තීරණයක් වේ. මර්ජුවානා නම් වූ මත් ද්‍රව්‍යයෙ හි මත් කරන ශක්තියක් ඇති හෙයින්, එය මත්පැන් සතයට අයත් එකක් බව සලකා (හරාම්) තහනම් කරනු ලබන්නේ ය." කියවන්න: ' The Evolution of Fiqh By abu ameenah Bilal Philips (1988) පි: 60, The Thouheed Publications, Riyadh, Saudi arabia.

සෙයිකුල් ඉස්ලාම් ඉබ්නු තෛමියියා (රහ්) තුමා තම වැදගත් තීරණයක මෙසේ සඳහන් කර ඇත:

".... මේ සමග ම මෙවැනි: ඔසප් වීම සම්බන්ධ ව අල්ලාහ් තම දේව ග්‍රන්ථය හා සුන්නාහ් ව තුළින් අනේක තීරණයන් දී ඇත. එහෙත්, මේ සම්බන්ධ ව අඩු වැඩි කාල සීමාවක් තක්සේරුකර අප හට දී නැත. තව ද, මේ ගැන මුස්ලිම් සමාජය අනිවාර්යයෙන් ම දැනගත යුතුව තිබියදීත්, ඔහු, ස්ත්‍රියක් ඔසප් වීම් දෙකක් අතර කොපමණ කලක් පිරිසිදුව සිටියි ද යනු සීමාකොට කීවේ නැත. වචනාර්ථය ගත් කළ ද 'හෛල්' (ඔසප් වීම) නම් වූ වචනය යම් තක්සේරුවක් හෝ වෙනත් විස්තරයක් හෝ නොදෙයි. එහෙයින්, යම් කෙනෙක් ඔසප් වීම සම්බන්ධ ව යම් නියමිත කාල සීමාවක් ඇති කිරීමට නම් ඔහු හෝ ඇය කුර්ආනයට හා සුන්නාහ්වට එකඟ නොවූ ක්‍රියාවක යෙදී සිටින බව පැහැදිලි වේ."

**සතරවෙනි සාක්ෂිය:**

අල්ලාහ් ඔසප් වීම වේදනාකාරී බවත්, අපිරිසිදු බවත් කියා ඇත. තව ද, එය ඇති වූ ස්ත්‍රියක් සමඟ ලිංගික ආශ්වාදයේ හැසිරිය නොයුතු බව ද කියා ඇත. ඔසප් වීම ඇති වූ කල්හි අපිරිසිදු තත්ත්වයක් ඇති බව අපි කවුරුත් දනිමු. මෙහි - දෙවෙනි හා පළවෙනි දින අතර, සතරවෙනි හා තුන්වෙනි දින අතර, දහසය වෙනි හා පහළොස්වෙනි දින අතර, දහ අටවෙනි දහහත්වෙනි දින අතර........ යනු කිසිම වෙනසක් නැත. ඒ මක්නිසාද යත්, ඔසප් වීම, 'ඔසප් වීම' නම් වූ තත්ත්වයෙ හි වේදනාවක් දෙන අතර අපිරිසිදු ව ද ඇති හෙයින් ය. මෙය, ඔසප් වීම ඇති වූ සෑම දිනයන්හි ම ඒකාකාර ව ඇත්තා වූ තත්ත්වය යි.

එම නිසා, ඔසප් වීමට සම්බන්ධ වූ ප්‍රායෝගික හේතූන් කරන කොට ගෙන දින දෙකට ම පොදු වූ තීරණයන් ඇති විට දිනකට එකක් වශයෙන් ඇති කරනු ලබන තීරණයන් කෙසේ අනුමත කළ හැකි ද? මෙය නිවැරදි යහපත් 'කියාස' යට පටහැනි වේ. දින දෙකට ම සමාන ව එම තීරණයන් ප්‍රයෝජනවත් කරගන්නා අදහස ශුද්ධ වූ කියාස් බවට පිළිගත නොහැකි ද? හේතුව, එම තීරණයන් සමාන ව ගෙන ඒමට අවශ්‍ය හේතූන් එම දින දෙකෙහි ම අඩංගු වී ඇත.

**පස්වෙනි සාක්ෂිය:**

ඔසප් වීම සම්බන්ධ ව යම් කාල සීමාවක් නියමකොට දෙන අයගේ එකඟවිය නොහැකි කැරලිකාර අදහස්වලට සාක්ෂි කිසිවක් දෙනු ලැබ නොමැත. මේ අදහස් ඉජ්තිහාද්[16] තුළින් ලබාගත් ඒවා ය. මේවා නිවැරදි හෝ වැරදි හෝ වෙන්න පුළුවන. මේවායෙ හි එක් අදහසක් තවත් අදහසකට වඩා උසස් හෝ වැදගත් හෝ නොවී ය. මෙවැනි ආරාවුල් ඇති දේ හී කුර්ආනය හා සුන්නාහ් වෙත අප සිත යොමු කිරීම අනිවාර්ය වේ.

දැන් මේ ගැන මනාව පැහැදිලි වනවා ඇත. එනම්, ඔසප් වීම සම්බන්ධයෙන් වූ නිවැරදි ම මතයනම් එයට අඩු වැඩි කාල සීමාවක් නැති බව ය. යම් ස්ත්‍රියක් (තුවාලයකින් හෝ එවැනි වෙනත් යමකින් හැර) ස්වාභාවික ව රුධිර පිටවීම දුටුවහොත් එය ඔසප් වීමෙන් බව සිතිය යුතු ය. මේ සම්බන්ධ ව කියනු ලබන කාල සීමාවන් ගැන හෝ වයස් සීමාවන් ගැන හෝ සිත යොමු නොකළ යුතු ය එහෙත්, රුධිර පිටවීම නොනැවතේ නම් නැතහොත් මසකට දවසක් දෙකක් රුධිර පිටවීමෙන් පසු ව එය නවතියි නම්, එම තත්ත්වයට පත්වෙන ස්ත්‍රිය 'ඉස්තිහාදහ්'* නම් වූවක සිටින බව අදහස් කළ යුතු ය.

සෙයිකුල් ඉස්ලාම් ඉබ්නු තෛමියියා (රහ්) තුමා මෙසේ පැවසුවේ ය:

---

16. **ඉජ්තිහාද් :** යම් අලුත් අවස්ථාවන් අනුව ඇතිවෙන තත්ත්වයකට හෝ ප්‍රශ්නයකට, ඉස්ලාමීක විද්වතුන් (ඉස්ලාමීය මූලාශ්‍රයන්ට සරිලන සේ) ගන්නා තීරණයන්, මෙම (ඉජ්තිහාද්) තීරණ බව කියනු ලැබේ.

* මේ ගැන ඉදිරි පිටුවල සඳහන් වෙයි.

"මූලික ව, ඉස්තිහාදහ් බවට තීරණයක් ගැනීමට අදාළ යම් සාක්ෂියක් නොලැබුණු කල් හි, ගර්භාශයෙන් පිටවෙන සියලු දේ ම ඔසප් වීමට සම්බන්ධ වූ බව ය."

තව ද, එතුමා පැවසුවේ යː

"(ස්ත්‍රියකගෙන්) පිටවෙන රුධිරය, තුවාලයකින් හෝ රුධිර වාහිනියකින් හෝ පිටවෙන බව නොවේ නම්, එය ඔසප් වීමෙන් පිටවෙන රුධිර බව පිළිගත යුතුය."

මෙතුමාගේ මෙම අදහස් ශක්තිමත් පදනමක් මත ගොඩනගා ඇත. එපමණක් නොව, මේවා වැටහීමෙන් යුතුව පිළිගෙන, පිළිපදින්න ද ඉතා පහසු ය. තව ද, මෙම අදහස් අනෙක් සියලු ම අදහස්වලට වඩා ඉහළින් තබා අනුමත කළ හැක. මෙයට හේතුව, මෙම අදහස් සහනය හා පිළිපැදීමට පහසුතාවය ඇති, ඉස්ලාමයේ ජීවයට හා හරයට සම්පූර්ණයෙන් ම එකඟ ව තිබීම වේ.

අල්ලාහ් මෙසේ පවසයි :

هُوَ اجْتَبَاكُمْ وَمَا جَعَلَ عَلَيْكُمْ فِي الدِّينِ مِنْ حَرَجٍ ﴾ [الحج، الآية ٧٨]

**"ඔහු (ඔහුගේ සේවය පිණිස) ඔබ ව තෝරා පත්කොට ඇත. තව ද, ඔහු දීන් හි - ජීවන සැලැස්මෙ හි - ඔබට දුෂ්කරතාවක් තබා නැත."**

**(අල් කුර්ආන් 22 : 78)**

නබි (සල්) තුමා මෙසේ පවසා ඇතː

"නියත වශයෙන් ම මෙම දීන් (නම් වූ ජීවන සැලැස්ම) (පිළිපැදීමට) ඉතා පහසු ය. කවරෙකු හෝ මෙම ජීවන සැලැස්ම පිළිපැදීමෙ හි තමා විසින් ම තමන්ට අධික බරක් පටවා ගන්නේ ද, ඔහුට මෙය එලෙස ම නොකඩවා පිළිපැදිය නොහැක. එහෙයින් ඔබ අන්තවාදියෙක් නොවන්න. එනමුත් (ඉතා යහපත්) අංග සම්පූර්ණත්වයට සමීපවන්නට උත්සුක වී, ඔබට දයාදයන් ලබාදෙන බවට වූ ශුභ ආරංචි ද ලබාගන්න."[17]

මෙලෙස පැවසූ නබි (සල්) තුමා තුළ, නිවැරදි විකල්ප අවස්ථාවන් දෙකක් ඇති කල වඩා පහසු අවස්ථාව තෝරා ගැනීමේ පුරුද්දක් දක්නට ලැබුණි.

## ගර්භණී ස්ත්‍රියකගේ ඔසප් වීම!

අනේක ස්ත්‍රීන් ගර්භණීන් වූ විට ඔවුන්ගේ ඔසප් වීම නතර වන්නේ ය. ඉමාම් අහ්මද්[18] (රහ්) තුමා, "ස්ත්‍රීන්ගේ ඔසප් වීම නැවතුනේ නම් ඔවුහු ගර්භණීන් බවට පත් වී ඇති බව දැනගත හැක." යනු කීවේ ය. ගර්භණී ස්ත්‍රියක් ප්‍රසූතයට ස්වල්ප වේලාවකට (දින දෙක තුනකට) පෙර ඇකිළීමත් සහිතව යම් වේදනාවක් ඇති වී රුධිර පිටවෙනවා දුටුවහොත්, එය

17. මූලාශ්‍රයː සහීහුල් බුහාරි (අරාබි - ඉංග්‍රීසි) වෙළුමː 1, පිː 34, හදීස් අංකයː 38.

18. ඉමාම් අහ්මද් ඉබ්නු හන්බල් (ක්‍රි. ව. 778-855) තුමා, එතුමා ජීවත් වූ කාලය තුළ හදීස් කට පාඩම් කොට, වාර්තා කරන්නන් අතර විශේෂ තැනක් ගත් කෙනෙකි. එතුමා හදීස් රැස් කිරීම, ඒවා වාර්තා කිරීම, එම හදීස්වලට විවරණ කිරීම යනාදියෙ හි ඉතා උනන්දුවක් දැක්වූයේ ය. කුර්ආනය හා හදීසය වටහා ගැනීමේ දී යම් දර්ශනික ප්‍රතිපත්තියක් අනුගමනය කරන තත්ත්වයක් උද වූ විට, එයට විරුද්ධ ව මෙතුමා නැගී සිටීම නිසා නොයෙක් කරදරවලට මුහුණ පාන්නට සිදුවිය. එතුමා නීතිය සම්බන්ධ ව දැරූ අදහස් හි කුර්ආන්, සුන්නාහ් සහ සහාබාවරුන්ගේ ඒකමතික අදහස් යනාදියේ සාක්ෂි ඇති තීරණයන්ට මූලික ස්ථානයක් දුන්නේ ය.

'නිෆාස්' බවට සිතිය යුතුය. සමහර විට, එම ස්ත්‍රිය තම ප්‍රසූතියට දින ගණනකට පෙර හෝ ප්‍රසූතියට ස්වල්ප වේලාවකට පෙර හෝ යම් වේදනාවක් නොමැති ව රුධිර පිටවෙන්න දුටුවහොත් එය 'නිෆාස්' නොවේ. මෙය නිෆාස් නොවේ නම් ඔසප් වීම බවට පිළිගත හැකි ද? ඔසප් වීමට අදාළ වූ සෑම නීතිමය තීරණයක් ම අනුගමනය කළ හැකි ද? වැනි ප්‍රශ්න මතුවෙන බව පෙනී යයි. මේ ගැන විද්වතුන් අතර මතභේද ඇත. කෙසේ වෙතත්, මේ ගැන ඇති නිවැරදි අදහස නම් මෙය ඔසප් වීමට අදාළ රුධිර බව ය. මෙයට හේතු ව, මේ සඳහා වූ ඇති සාමාන්‍ය තීරණය වේ. එනම්, ස්ත්‍රියක් තමාගෙන් පිටවෙන රුධිර ඔසප් වීමෙන් ඇති වූවක් බවට කියන අදහස වෙනස් කරන හේතුන් නැතිවිට එය ඔසප් වීමෙන් පිටවෙන රුධිර බව පිළිගත යුතු ය. ගර්භණී ස්ත්‍රියකට ඔසප් වීම ඇති නොවන බව පෙන්වන යම්කිසි අදහසක් කුර්ආනයේ හා නබි (සල්) තුමාගේ සුන්නාහ්වෙ හි නැත.

ඉමාම් මාලික්[19] (රහ්) තුමා දැරූ අදහස ද ඉමාම් ෂාෆිඊ[20] (රහ්) තුමා දැරූ අදහස ද මෙය ම වෙයි: සෙයිකුල් ඉස්ලාම් ඉබ්නු තෙමියියා (රහ්) තුමාගේ තේරීම ද මෙය ම වේ. ඉමාම් අහ්මද් (රහ්) තුමා ද මෙම අදහස පිළිගෙන ඇත.

එහෙයින්, පහත සඳහන් කාරණා දෙක හැර, ගර්භණී ස්ත්‍රියකගේ ඔසප් වීම සම්බන්ධයෙන් ද සාමාන්‍ය (ස්ත්‍රියකගේ) ඔසප් වීමට අදාළ සියලු නීතිරීතීන් ම අදාළ වේ.

---

19. ඉමාම් මාලික් ඉබ්නු අනස් ඉබ්නු ආමිර් (රළි) තුමා (ක්‍රි. ව. 717-801) මදීනාවෙ හි උපත ලැබුවේ ය. එතුමාගේ සීයා වන ආමිර් (රළි) තුමා නබි (සල්) තුමාගේ වැදගත් සහාභාවරුන්ගෙන් කෙනෙකි. ඉමාම් මාලික් තුමා අවුරුදු 40 ට අධික කාලයක් මදීනාවෙ හි හදීස් ඉගැන්විය. එතුමා නබි (සල්) තුමාගේ හදීස් ද, සහාභාවරුන්ගේ සහ ඔවුහු අනුගමනය කළවුන්ගේ අදහස් ද රැස්කොට ග්‍රන්ථයක් සකස් කළේ ය. එම ග්‍රන්ථය 'අල් මුවත්තා' නම් වේ. මෙය ඉංග්‍රීසියෙන් ද පරිවර්තනය කොට ඇත. මෙම ග්‍රන්ථයට අපකීර්තියක් ඇති කරන හිතැතිව එංගලන්තයේ සිටින සූෆිවරයෙක් මෙයට හැඳින්වීමක් ලියා ඇත. භාවයෝග අදහස් දරණ සූෆිවාදය සමග ඉස්ලාමයට කිසිදු සම්බන්ධයක් නැත. මෙම සූෆි ශාඛාවට අයත් අය, "තමන්ට 'කස්ෆ්' නම් වූ ශුභාරංචි අල්ලාහ්ගෙන් කෙළින්ම ලැබෙන බවට වාද කරති. තව ද, ඔවුහු තමන්ගේ බලයට යටත් ව මෙම විශ්වය ම තබාගත හැකි බවත්, "අල්ලාහ්ගේ ඒකීය භාවය යන්නෙහි තේරුම ඔහු සියලු දෙයකම එකග ව සිටින්නේ ය' යනු බවත් වාද කරති. නියත වශයෙන් ම අති ශ්‍රේෂ්ඨ වූ අල්ලාහ් 'අර්ස් හි ඉඳ සියලු දේ ම බලන්නේය: දැන ගන්නේ ය: වටලා සිටින්නේ ය. එසේ නැති ව, ක්‍රිස්තියානීන් හා අනෙක් කොටස් වලට අයත් අය වාද කරන ලෙස, 'අල්ලාහ් තමාගේ මැවීම් සමග එකට එක් වී සිටින්නේ ය' යනු කීම හෝ විශ්වාස කිරීම වැරදි ය. අල්ලාහ්ගේ ගුණාංගයන් සියල්ල ම අද්විතී ය: පරිපූරණත්වයෙන් යුක්ත ය: ඔහුගේ මැවීම්වලට සම්පූර්ණයෙන් වෙනස් වූවත් ය.

﴿ ليس كمثله شيء وهو السميع البصير ﴾

"(ලොවෙ හි ඇත්තා වූ) කිසිවක් ඔහුට සමාන නැත: ඔහු සියලු දේ අසන්නා හා බලන්නා වෙයි."
(අල් කුර්ආන් 65 : 1)

20 ඉමාම් මුහම්මද් ඉබ්නු ඉද්රීස් අෂ්ෂාෆිඊ (රහ්) තුමා (ක්‍රි. ව. 769-820) ගාස්සාවෙ හි උපත ලැබුවේ ය. එතුමා කුඩාකල ම අධ්‍යාපනය ලබා ගැනීම සඳහා එවකට මදීනාවෙහි සිටි ඉමාම් මාලික් (රහ්) තුමා වෙත ගියේ ය. තව ද, ඉමාම් අබූ හනීෆා (රහ්) තුමාගේ ප්‍රකට ශිෂ්‍යයෙක් වූ ඉරාකයේ ඉමාම් මුහම්මද් ඉබ්නු අල් හසන් තුමා ගෙන් ද එතුමා අධ්‍යාපනය ලැබුවේ ය. ඉමාම් ෂාෆිඊ (රහ්) තුමා ඉස්ලාමීය 'ෆික්හ්' නීතියට සම්බන්ධ වූ මූලික ප්‍රතිපත්ති ක්‍රමවත් ව සැකසූ ප්‍රථම ඉමාම් ලෙස ගෞරවයක් උසුලයි.

අ) දික්කසාදය: ගර්භණී නොවූ ස්ත්‍රියක් ඇයගේ ඉද්දා[21] වෙහි දී දික්කසාද කිරීම (ඇයගේ සැමියා ඇය සමඟ සංසර්ගයේ නොයෙදී පිරිසිදු තත්ත්වයේ සිටින විට හෝ ගැබ් නොගත් තත්ත්වයේ සිටින විට හෝ) හැර, ඇය ඔසප් වීමට ලක් වී සිටිය දී දික්කසාද නොකළ යුතුය යන්න අපි සැවොම දන්නා කරුණකි. ඉස්ලාමය අනුව එය නීති විරෝධී ක්‍රියාවකි.

අල්ලාහ් මෙසේ පවසයි:

﴿ إذا طَلَّقْتُمُ النِّساءَ فَطَلِّقُوهُنَّ لِعِدَّتِهِنَّ ﴾[ الطلاق، الآية ١]

**ඔබ ස්ත්‍රීන් දික්කසාද කරන්නේ නම් ඔවුන්ගේ ඉද්දා (කාලය තීරණය) කළ හැකි පරිදි (මාස් ශුද්ධිය නොමැති කාලවල) දික්කසාද කරන්න."**

(අල් කුර්ආන් 65 : 1)

ගර්භණී ස්ත්‍රියකගේ ඉද්දා කාලය ඇය ගර්භණී ව සිටින සම්පූර්ණ කාලයම වෙයි: එ කල් හි ඇයට ඔසප් වීම තිබුණත් නොතිබුණත් මෙහි කිසිදු වෙනසක් නොමැත. එම නිසා ඇයගේ දික්කසාදය රඳා පවතින්නේ ඇය ගර්භණීව සිටින කාලය සම්පූර්ණ වන තෙක් ය. මෙහි ඇයගේ ඔසප් වීම කෙරෙහි කිසිදු සම්බන්ධතාවයකුත් නොමැත.

ආ) අල්ලාහ්ගේ අණ පරිදි, ගර්භණී ස්ත්‍රියකගේ ඉද්දාව ඇයගේ දරු ප්‍රසූතයත් සමඟ නිම වෙයි. එම කාල සීමාව තුළ ඇයට ඔසප් වීම තිබුණත් නොතිබුණත් මෙයය, නීතිය වන්නේ.

අල්ලාහ් පවසන්නේ මෙයයි:

﴿ وأولاتِ الأحمالِ أجَلُهُنَّ أن يَضَعْنَ حَمْلَهُنَّ ﴾ [ الطلاق ، الآية ٤]

**"තව ද, ගර්භණීන්ට ඇති ඉද්දා සීමාව ඔවුන්ගේ දරු ප්‍රසූතයක් සමඟ නිම වෙයි."**

(අල් කුර්ආන් 65 : 4)

---

21. **ඉද්දා (නියමිත කාලය):** ඉද්දාව කුමක් ද යනු විග්‍රහ කරන හදීසයක් තුළින් එය මනාව වටහා ගත හැක. එම හදීසය මෙයයි :
"නබි (සල්) තුමා ජීවතුන් අතර සිටින කල, අබ්දුල්ලාහ් බින් උමර් (රළි) තුමා, තම බිරිඳ ඔසප් වී සිටිය දී දික්කසාද කළ බවට දැනුම් දුන්නේ ය. (එතුමාගේ පියාවන) උමර් ඉබ්නු කත්තාබ් (රළි) තුමා මේ ගැන නබි (සල්) තුමා වෙත දැනුම් දුන්නේ ය. එවිට නබි (සල්) තුමා, මෙසේ කීවේ ය:
"ඔහුට (ඔබගේ පුතාට මෙසේ) නියෝග කරන්න. ඇය ව නැවත ගෙන, ඇය පිරිසිදු වනතෙක් තබාගත යුතු ය. පසුව, (ඇය පිරිසිදු වූවායින් පසුව) අනෙක් ඔසප් වීම ඇති වී එයින් පිරිසිදු වනතෙක් සිටිය යුතු ය. ඊට පසු ව, ඔහු ඇය ව තමා සමඟ තබා ගැනීමට කැමති වූයේ නම් එය එසේ කළ හැකිය. සමහර විට, ඔහු ඇය ව දික්කසාද කරන්න කැමතිවූයේ නම්, ඇය සමඟ සංසර්ගයේ යෙදීමට පෙර දික්කසාද කළ හැකිය. ස්ත්‍රියක් දික්කසාද කිරීමට අල්ලාහ් නියමකර ඇති කාල සීමාව මෙයයි."
* *මූලාශ්‍රය: සහීහ් බුහාරි (ඉංග්‍රීසි-අරාබි) වෙළුම: 7, පි: 129, හදීස් අංකය: 178.*

# 3

# ඔසප් වීමෙ හි ඇතිවන වෙනස්වීම්!

ඔසප් වීමෙහි විටින් විට යම් යම් වෙනස්වීම් ඇතිවෙන බව අපට පෙනෙන්නට ඇත.

පළමුව වැඩිවීම හෝ අඩුවීම. සාමාන්‍යයෙන් දින හයකට පමණක් සීමාවෙන ඔසප් වීමේ කාලය දින හතකට දික්වීම. නැතහොත් දින හතක්වන තෙක් තිබිය යුතු ඔසප්වීම දින හයකින් නැවතීම යනාදිය උදහරණ වශයෙන් ගත හැක.

දෙවනුව: නියමිත කාලයට පෙර හෝ පසුව ඇතිවීම. උදහරණයක් වශයෙන් - ස්ත්‍රියකට සෑම මාසයක ම අවසානයේ දී ඔසප් වීම ඇතිවෙයි. පසුව, ඇයට මාසයේ ආරම්භයේ දී හෝ ඊට ප්‍රති විරුද්ධ ව එය සිදුවිය හැකි ය. මෙම තත්ත්වයන් දෙක සම්බන්ධ ව ඉස්ලාමයේ තීරණය කුමක් ද යන්නෙ හි විද්වතුන් අතර මතභේද ඇත. මේ සම්බන්ධ ව වූ නිවැරදි මතය කුමක්ද යත්, ඇය කුමන අවස්ථාවක රුධිර පිටවීම දකින්නේ ද එම අවස්ථාවේ සිට ඇට ඔසප් වීම පටන් ගත් බවත්, කුමන අවස්ථාවක රුධිර පිටවීම නවතින්නේ ද එම අවස්ථාවෙ හි ඇගේ ඔසප් වීම නතරවී ඈ පිරිසිදු වූ බවත් අදහස් කළ යුතුය. මේ හැර ඔසප් වීමෙහි වැඩිවීම හෝ අඩුවීම ගැන හෝ නියමිත කාලයට පෙර හෝ පසුව ඇතිවීම ගැන හෝ සිත් තැවුළටපත් නොවිය යුතු ය. මන්ද යත්, මීට පළමු විස්තරකළ පරිදි, ඔසප් වීමට අදළ නීතිරීතීන්, ඇත්ත වශයෙන් ම ඔසප් වීම නිසා පිටවෙන රුධිර මත රඳා පවතින බැවිනි.

තෙවනු ව, (සාමාන්‍යයෙන් කහ පාටට හුරු සැරව වැනි) සාමාන්‍ය කහ පාටැති හෝ 'කුද්රාහ්' නම් වූ සාමාන්‍ය කහ පාට හා කළු පාට අතරැති පැහැයක් හෝ යමක් පිටවීම. ඔසප් වීම ඇතිවිට මෙසේ යමක් පිට වෙයි නම් නැතහොත් ඔසප් වීම නැවතී පිරිසිදු වීමට පෙර මෙසේ යමක් පිටවෙයි නම්, එය ඔසප්වීම බව අදහස්කළ යුතුය. එමෙන් ම ඔසප් වීමට අදළ සියලු නීතිරීතීන් ම මෙයට ද අදළ බව පිළිගෙන හැසිරිය යුතුය.

සමහරවිට, මෙවැනි යමක් ඔසප් වීමෙන් පිරිසිදු වූ පසුව පිට වෙයි නම්, එම තත්ත්වය ඔසප් වීමේ තත්ත්වයක් බවට පිළිගත නොයුතුය යනු උම්මු අතියියාහ් (රලි) තුමියගේ අදහස් තුළින් දැනගත හැක.

එතුමිය මෙසේ කීවා ය:

"(පිරිසිදු වූවායින් පසුව) කහ පාටට හුරුව පිටවෙන කිසිවක් ඔසප් වීම මෙන් (සැලකිල්ලෙන් යුතුව) අපි සිතුවේ නැත."[22] 'පිරිසිදු වූවායින් පසුව' යනුවෙන් සඳහන් නොකර මෙයම බුහාරි[23] හදීස් ග්‍රන්ථයෙහි සඳහන් කොට ඇත. එහෙත්, ඉමාම් බුහාරි (රහ්) තුමා මෙම හදීසය 'ඔසප්වීම් කාලයන් අතරැති දිනයන් හි පිටවෙන කහ පාටට හුරු දේ' යන මාතෘකාව ඇති පරිච්ඡේදයට ඇතුල්කොට ඇත්තේය.

---

22. මෙය ඉතා යහපත් වාර්තාකරුවන්ගෙන් බව ඉමාම් අබුදවුද් තුමා සඳහන් කරයි.
23. මූලාශ්‍රය: සහීහුල් බුහාරි, (අරාබි-ඉංග්‍රීසි), වෙළුම: 1, පි: 194, හදීස් අංකය 323.

ඉමාම් බුහාරි (රහ්) තුමා, ආයිෂා (රලි) තුමියගේ තවත් හදීසයක් තුළින් මෙය තවත් පැහැදිළි ව කියන්නේය:

"සමහර ස්ත්‍රීන් (තමන් ඔසප්වීමෙන් පිරිසිදු වූයේ ද නැද්ද යනු දැනගැනීම පිණිස) කහ පාටට හුරු ව පිටවුණු දේ තැවරුණු ලකුණු ඇති ආරක්ෂක තුවා (pads) ආයිෂා (රලි) තුමියට යවන්නේ ය. (එවිට) ආයිෂා (රලි) තුමිය "ඔබ '**අල් කස්සතල් බර්ද්**' (ගර්භාශයෙන් සුදු පැහැති යමක් පිටවීම: (සුදුයාම) ආරක්ෂක තුවා (pad) සුදුව තිබීම) දකිනතෙක් හදිසි නොවන්න. 'ඔසප් වීම සම්පූර්ණයෙන් නවතිනතෙක්' යනු මෙහි තේරුමයි."[24]

සතරවෙනු ව, ඔසප් වීමෙහි යම් පිළිවෙළක් නොවීම. එනම් යම් දිනක රුධිර පිටවෙයි: එහෙත්, පසුදින එය නතරවෙයි. මේ තත්ත්වය කෙරෙහි කරුණු දෙකක් ඇත.

1. මෙවැනි පිළිවෙළක් නොවීම සෑම වේලාවන් (දිනයන්) හිම ඇතිවේ නම්, එකල්හි පිටවෙන රුධිර '**ඉස්තිහාදත්**' යනු වේ. ඉස්තිහාදත්වට අයත් නීතිරීති සියල්ල මෙයට ද යෙදෙන්නේ ය.
2. මෙම පිළිවෙළක් නොවීම වනාහි සමහර වේලාවන් (දිනයන්) හි ඇතිවුවත්, පිරිසිදු ව සිටින කාලය සම්බන්ධ ව විද්වතුන් අතර මත භේද ඇත. එනම්, එය ඇත්තෙන්ම ඔසප් වීමට අදළ නීතිරීන් නොයෙදන පිරිසිදු ව ඇති කාලයක් ද? නැතිනම් එය ඔසප් වීම ඇති කාලයට අයත් කොටසක් ද? යන මේවා මත භේදයන්ට තුඩු දුන් හේතූන් ය.

ඉමාම් ෂාෆිඊ (රහ්) තුමා, සෙයිකුල් ඉස්ලාම් ඉබ්නු තෛමියියා (රහ්) තුමා, ඉමාම් අබූ හනීෆා (රහ්) තුමාගේ මද්හබය යනාදීන්ගේ මතය අනුව මෙම තත්ත්වය ඔසප් වීමේ කොටසකි. මන්ද යත්, මෙහි '**කස්සාහ් අල් බර්ද්**' ව නොපෙනෙයි. මෙහි දී මෙම තත්ත්වය පිරිසිදු තත්ත්වයක් බව සිතන්න වුවහොත් එය ස්ත්‍රීන්ට මහත් දුෂ්කරතාවයක් ද පීඩාවක් ද දෙනවා විය හැක. නියත වශයෙන් ම මෙය ඉස්ලාමීය ප්‍රතිපත්තිවලට ප්‍රතිවිරුද්ධ තත්ත්වයකි.

අනෙක් අතින්, **හන්බලි මද්හබයේ** ඉතා ප්‍රකට මතය නම්: 'රුධිර පිටවුවහොත් එය ඔසප් වීම වේ' යන්නය. එහෙත්, ඔසප් වූ කාලය ද පිරිසිදු ව සිටින කාලය ද එක් වී ඔසප්වීම කෙරෙහි අධික කාලයක් (මෙම මද්හබය අනුව දින පහළොහක්) ගත වුවහොත්, එවිට එම තත්ත්වය 'ඉස්තිහාදත්' බවට සැලකිය යුතුය. (හන්බලි මද්හබයේ ෆික්හ් ග්‍රන්ථය වන) '**අල් මුඃනි**' යේ කර්තෘ මෙසේ කියා ඇත.: "දිනකට වඩා අඩු ව රුධිර පිටවීම නවතී නම්, ඇය පැහැදිලි සාක්ෂියක් නොදුටු විට, එය පිරිසිදු තත්ත්වයක් බවට කිව නොහැක. උදහරණයක් වශයෙන්, ඇයගේ ඔසප් වීමේ අවසානයේ දී (රුධිර) පිටවීම නවතින්නේය: නැතහොත්, ඇය '**කස්සාහ් අල් බර්ද්**' ව දකින්නේ ය."[25]

මෙම ග්‍රන්ථයේ කර්තෘ, "අල්මුඃනිගේ මෙම අදහස ඉහත සඳහන් අදහස් දෙකට ම අතරැති, මධ්‍යස්ථ එකක් වෙයි. යහපත් දෙය දන්නේ අල්ලාහ් පමණය!" යනු කියයි.

පස්වෙනු ව: රුධිරවල ඇති වියලි තත්ත්වය: ස්ත්‍රියක් තමාට තෙත් වූ යමක් පිටවෙන බව දකින්නේ ය. මෙය ඔසප් වී ඇති අවස්ථාවෙහි සිදුවේ නම්, නැතහොත් පිරිසිදු වීමට පෙර වූ තත්ත්වය සමග සම්බන්ධ වී තිබේ නම්, මෙය ඔසප් වීම වේ. එහෙත්, පිරිසිදු වූවායින් පසුව මෙය සිදුවන්නේ නම්, එය ඔසප් වීම නොවේ.

---

24. එහි ම (Ibid) වෙළුම: 1, පි : 190
25. අල් මුඃනී, වෙළුම: 1, පි: 355

4

# ඔසප් වීම හා සම්බන්ධ නීතිරීතීන්!

ඔසප් වීම හා සම්බන්ධ ව නීතිරීතීන් රාශියක් ඇත. මෙහි ඉතා අවශ්‍යවන නීතිරීතීන් පමණක් ගෙන දැක්වීම ප්‍රමාණවත් යයි අපි සිතමු.

## 1 - අස් සලාත් (නැමදීම)

ස්ත්‍රීන් ඔසප් වී සිටින කාලවලදී 'ෆර්ල්' (අනිවාර්ය) වන හෝ 'සුන්නත්' (අනිවාර්ය නො) වන හෝ කිසිදු සලාතයක් ඉටුකිරීම තහනම් කොට ඇත. යම් සලාතයක් ඉටුකළ යුතු නියමිත වේලාව තුළ, එම සලාතයේ සම්පූර්ණ රකඅත් එකක් ලබාගන්න හැකිවවුවොත් හැර, එම සලාතය ඉටුකිරීම ඇයට අනිවාර්ය නොවේ. මෙය තවත් සවිස්තර ව දැනගැනීම පිණිස පහත සඳහන් උදහරණ සාවදාන ව කියවන්න.

**පළමෙනි උදහරණය:** යම් ස්ත්‍රියකට ඉර බැස ගිය පසුව ඔසප් වීම ඇති වේ. එවිට, මෑරිබ් සලාතයේ රකඅත් එකක් ඉටු කරන කාල ප්‍රමාණයක් ඇය පිරිසිදු ව පසුවී ඇත. මේ නිසා, ඇය සම්පූර්ණයෙන් පිරිසිදු වූවාට පසු එම මෑරිබ් සලාතය සම්පූර්ණ ව ඉටුකළ යුතුය.

**දෙවෙනි උදහරණය:** යම් ස්ත්‍රියකට ඉර උදවීමට පෙර ඔසප් වීම නතර වෙයි. එවිට, ෆජ්ර් සලාතයේ රකඅත් එකක් පමණක් ඉටුකිරීමට අවශ්‍ය කාල ප්‍රමාණයක් ඇත. එහෙයින් ඇය සම්පූර්ණයෙන් තමාව පිරිසිදු කරගත් පසුව එම ෆජ්ර් සලාතය සම්පූර්ණ ව ඉටුකළ යුතුය.

මෙම උදහරණ දෙකෙන් අපට වැටහෙන තවත් සත්‍යයක් නම්, ඇයට සලාතයේ රකඅත් එකක් ඉටුකිරීමේ කාලය නොලැබුණු විට, එනම් එයට උවමනා කාල ප්‍රමාණය නොලැබුණු විට, ඇය එම සලාතය ඉටුකිරීම අනිවාර්ය නොවන බව ය.

නබි (සල්) තුමා පැවසුවේ ය:
"එක සලාතයක රකඅත් එකක් (එම සලාතය ඉටු කළයුතු නියමිත වේලාව තුළ) යමෙක් ලබාගන්නේ ද, එම තැනැත්තා සලාතය ලබාගත් කෙනෙක් වෙයි."[26]

මෙම හදීසය තුළින් අපට වැටහෙන අනෙක් සත්‍යය නම්, එක සලාතයක රකඅත් එකක් එයට නියමිත වේලාව තුළ යමෙක් නොලබාගන්නේ ද, එම තැනැත්තා සලාතය නොලබාගත් කෙනෙක් වන බවය.

**විග්‍රහයක්:** සමහර විට, යම් ස්ත්‍රියකට අසර් සලාතයේ රකඅත් එකක් එම සලාතය ඉටුකළ යුතු නියමිත වේලාව තුළ ලබාගත හැකිවෙයි. එවිට, ඇය ලුහර් සලාතය අසර් සලාතය සමග ඉටුකළ යුතු අනිවාර්ය තත්ත්වයකට එළඹෙන්නේ ද? නැතහොත් එම ස්ත්‍රිය ඉෂා සලාතයේ රකඅත් එකක් එම සලාතය ඉටු කළයුතු නියමිත වේලාව තුළ ලබාගතහොත්, ඇය මෑරිබ් සලාතය ඉෂා සලාතය සමග ඉටුකළයුතු අනිවාර්ය තත්ත්වයකට එළඹෙන්නේ ද?

---

26. මූලාශ්‍රය: සහීහුල් බුහාරී (අරාබි-ඉංග්‍රීසි) වෙළුම: 1, පි: 322, හදීස් අංකය: 554.

මේ සම්බන්ධ ව විද්වතුන් අතර මතභේද ඇත. එහෙත්, නිවැරදි මතය නම්, ඇයට කිනම් සලාතය ලබා ගත්න හැකි වූවේ ද එම සලාතය පමණක් ඉටුකළ යුතු ය. මෙය නබි (සල්) තුමාගේ හදීසයක් අනුව ලබාගත් අදහසක් වේ.

එතුමා පැවසුවේ ය:

"ඉර බැස යෑමට පෙර අසර් සලාතයේ රකඅත් එකක් කවරෙකු ලබාගන්නේ ද, එම තැනැත්තා අසර් සලාතය ලබා ගත්තෙක් වෙයි. (දෙදෙනා ම එකඟ වී ඇත.)"[27] මෙසේ නැතිව, "එවිට ඔහු/ඇය ලුහර් සලාතය සහ අසර් සලාතය ලබා ගත්තේ ය." යනු නබි (සල්) තුමා නොපැවසුවේය. තවද, ලුහර් සලාතය ඉටුකිරීම අනිවාර්ය බව ද එතුමා පැවසුවේ නැත. මෙය, ඉමාම් මාලික් (රහ්), ඉමාම් අබූ හනීෆා (රහ්) ආදීන්ගේ මතය වේ.

**තවත් විග්‍රහයක්:**

යම් ස්ත්‍රියක් ඔසප් වීම ඇති වී සිටිය දී (තක්බීර්, තස්බීහ්, තහ්මීද් [28] යනාදිය තුළින්) අල්ලාහ් ප්‍රසංශා කිරීම, (කෑම් බීම් ගැනීම වැනි) ක්‍රියාවන් පටන්ගන්නා විට 'බිස්මිල්ලාහ්' කීම, හදීස් ඉගෙන ගැනීම, ඉස්ලාම් සම්බන්ධ ව ඇති සාකච්ඡාවන් හි සහභාගි වීම, අල්ලාහ් වෙත ප්‍රාර්ථනා කිරීම, කුර්ආන් පාරායනා කිරීමට සවන්දීම යනාදිය ඉස්ලාමීය ප්‍රතිපත්තිවලට පටහැනි නොවේ. ආයිෂා (රලි) තුමියගේ කියමනක් මෙයට සාක්ෂි වේ. එතුමිය මෙසේ කීවාය: "මම ඔසප් වී සිටියදී නබි (සල්) තුමා මගේ මඩොක්කුවේ හාන්සිවී කුර්ආනය පාරායනා කළේය."[29] (බුහාරි, මුස්ලිම්)

නබි (සල්) තුමා පැවසූ බව උම්මු අතියියා (රලි) තුමිය මෙසේ වාර්තා කරයි:

"බොහෝ විට තිරයෙහි පිටුපසට වී සිටින අවිවාහක ස්ත්‍රීන් හා වැඩිහිටි ගැහැණු ළමයින් හෝ බොහෝ විට තිරයෙහි පිටුපසට වී සිටින අවිවාහක ස්ත්‍රීන් හා ඔසප් වී සිටින කල වූ ස්ත්‍රීන් හෝ (තිවෙයින්) පිටත ඇවිත් යහපත් කාර්යයන්හි හවුල් විය යුතුයි: එමෙන් ම, සැබෑ ඊමාන්ධාරීන්ගේ ආගමික රැස්වීම්වලට ද සහභාගි විය යුතුයි. එහෙත්, ඔසප් වූ තත්ත්වයේ පසුවන ස්ත්‍රීන් මුසල්ලාවෙන් (සලාත් කරන ස්ථානයෙන්) ඈත් වී සිටිය යුතුයි."[30]

**තවත් විග්‍රහයක්:**

ඔසප් වී සිටින කල යම් ස්ත්‍රියක් ශබ්ද නගා කුර්ආනය පාරායනා නොකර, එය බලා හෝ (ඇයගේ සිතින්) නිශ්ශබ්ද ව හෝ කුර්ආනය පාරායනා කිරීමට අවසර ඇත. විද්වතුන්ගෙන් බොහෝ දෙනෙක් ඇය කුර්ආනය ශබ්ද නගා පාරායනා කිරීමට තහනමක් නැතැයි ද යන අදහස දරති. ඉමාම් බුහාරි (රහ්) තුමා, ඉබ්නු ජරීර් අත් තබරී (රහ්) තුමා, ඉබ්නු අල් මුන්දිර් (රහ්) තුමා, ඉමාම් මාලික් (රහ්) තුමා, ඉමාම් ෂාෆිඊ (රහ්) තුමා (මෙතුමාගේ කලින් වූ කියමනක් තුළින්) යනාදී හූ "ඇය 'ආයත්' (කුර්ආන් වාක්‍ය) පාරායනා කිරීම අනුමතකර ඇත" යන අදහස දරති.

---

27. මූලාශ්‍රය: සහීහ් මුස්ලිම් (ඉංග්‍රීසි-අබ්දුල් හමීද් සිද්දිකිගේ පරිවර්තනය, දරුල් අරබි, බේරූත්, ලෙබනාන් ප්‍රකාශනයක්) වෙළුම: 1, පි: 298, හදීස් අංකය: 1266
28. තක්බීර් : 'අල්ලාහු අක්බර්' (අල්ලාහ් අති ශ්‍රේෂ්ඨය) යනු කීම: තස්බීහ්: සුබ්හානල්ලාහ් (අල්ලාහ් උතුම් වූවෙකි) යනු කීම: තහ්මීද්: 'අල්හම්දුලිල්ලාහ්' (ප්‍රසංශා සියල්ල අල්ලාහ්ට පමණය) යනු කීම
29. මූලාශ්‍රය : සහීහුල් බුහාරි (අරාබි-ඉංග්‍රීසි) වෙළුම: 1, පි:179, හදීස් අංකය: 296
30. දෙදෙනාම එකඟ වෙයි. මූලාශ්‍රය: සහීහුල් බුහාරි, (අරාබි - ඉංග්‍රීසි), වෙළුම: 1, පි: 192, හදීස් අංකය 321

සෙයිකුල් ඉස්ලාම් ඉබ්නු තෛමියියා (රහ්) තුමා මෙසේ පැවසුවේ ය: "ඇය කුර්ආනය පාරායනා කිරීම වළක්වාලන සුන්නාහ්වක් නැත."

"ඔසප් වී සිටින කල ස්ත්‍රියක් හා 'ජනාබාහ්'[31] ඇත්තාවූ කෙනෙක් කුර්ආනයේ ඇති කිසිවක් පාරායනා නොකළ යුතුයි" යන හදීසය දුර්වල එකකි. හදීස් ශිල්පයෙහි ගැඹුරු ඥනයක් ඇති විද්වතුන් සියලු දෙනාගේම ඒකමතික නිගමනය ද මෙය ම වේ.

ඇත්ත වශයෙන් ම නබි (සල්) තුමාගේ කාලයේ විසූ ස්ත්‍රීන්ට ද ඔසප් වීම නොතිබුණා නොවේ. (සලාතය ඉටුකිරීමෙහි ඔවුන්ට දුන් අවවාද මෙන්) ඔවුහු කුර්ආනය පාරායනා කිරීම නොකළ යුතු නම්, එය එතුමා අනුගාමිකයන්ට පැහැදිලිව ම විස්තර කොට දෙන්නට තිබුණි. එතුමාගේ භාර්යාවන් මේ ගැන නිසි ලෙස දැන සිටියේ නම් මහජනයාට කියා දෙන්නට තිබුණි. තව ද, නබි (සල්) තුමා මෙය තහනම් කළ බව කවුරුන් හෝ වාර්තා නොකර තිබියදීත්, එදත් ස්ත්‍රීන්ට ඔස්ප්වීම ඇතිව තිබුණු විට මෙය නොකළ යුතුයි යනු නබි (සල්) තුමා තහනම් නොකොට තිබියදීත් අද මෙය තහනම් කළ නොහැකිය. මේ අනුව, කුර්ආනය මුවින් පරායනය කිරීම හරාම් (තහනම්) නොවේ.[32]

මෙම ග්‍රන්ථයේ කර්තෘ මෙසේ කියයි :

" (ඔසප් වී සිටින කාලය තුළ ස්ත්‍රීන් කුර්ආනය පරායනා කිරීම) සම්බන්ධව විද්වතුන් අතර මත භේද තිබෙන හෙයින්, ඔසප්වීම තිබෙනා ස්ත්‍රියක්, ගුරුවරියක් හෝ යම් විභාගයකට තමාගේ පාඩම් මාලාව සූදානම් කරන කෙනෙක් හෝ එවැනි නොවැළැක්විය හැකි තත්ත්වයක සිටින විට හැර, අනෙක් අවස්ථාවන්හි කුර්ආනය මුවින් ශබ්ද නගා පාරායනා නොකර සිටීම ඉතා යහපත් ය".

## 2 - අස් සව්ම් (උපවාසයේ යෙදීම)

ස්ත්‍රීන්ට ඔස්ප්වීම ඇති වී තිබිය දී 'ෆර්ල්' (අනිවාර්ය) වන හෝ 'සුන්නත්' (අනිවාර්ය නොවන) හෝ කිසිදු උපවාසයක යෙදීමට අනුමැතිය නොමැත. එහෙත්, අනිවාර්ය (ෆර්ල්) උපවාසයේ යෙදීම අතහැරුණු දිනයන් ඌණපූර්ණය කිරීම සඳහා නැවත උපවාසයේ යෙදීම අනිවාර්ය වේ.

ආයිෂා (රළි) තුමිය මෙසේ පැවසුවා ය.:

"අපි එය (ඔසප්වීම ඇති ව තිබුණා වූ කාලය) පසු කළෙමු. එවිට, අපගේ උපවාසයන් සම්පූර්ණ කරන (ඌණ පූර්ණ කරන) මෙන් අණ කරනු ලැබුවෙමු. එහෙත්, අපි සලාතය ඌණපූර්ණ කරන මෙන් අණකරනු නොලැබුවෙමු."[33]

---

31. ජනාබාහ් : ස්ත්‍රී පුරුෂයන් ශාරීරික ආශ්වාදයේ යෙදීමෙන් හෝ සිහිනෙන් හෝ ධාතු පිටවුන තත්ත්වය මෙසේ කියනු ලැබේ. මෙවිට අනිවාර්ය ස්නානයක් නොගෙන සලාතය හෝ වෙනත් නැමදීම්වලට අදාළ ක්‍රියාවන්හි යෙදීම හෝ කළ නොහැකිය. වතුර පාවිච්චි කරන්න බැරි තත්ත්වයක් ඇතොත් 'තයම්මම්' කර නැමදීම් යනාදිය කළ හැක.

32. ඉමාම් ඉබ්නු තෛමියියා (රහ්) තුමාගේ 'අල් ෆතාවා', වෙළුම : 26, පි : 191

33. මෙය සහීහ් මුස්ලිම් ග්‍රන්ථයෙන් උපුටා ගන්නා ලදී. වෙළුම: 1, පි: 191

ස්ත්‍රියක් උපවාසයේ යෙදී සිටින විට, ඉරබැස යෑමට මොහොතකට කලින් වුවද, ඇයට ඔසප්වීම ඇති වුවහොත්, ඇයගේ උපවාසය අවලංගු වී යන්නේය. ඇයට මෙය ඇති වූයේ උපවාසය අනිවාර්ය වූ දිනයක නම්, ඇය පිරිසිදු වූවායින් පසුව ඌණ පූර්ණ කිරීම සඳහා නැවත ඉටුකළ යුතුය; සමහර විට, උපවාසයේ යෙදී සිටින ස්ත්‍රියකට ඔසප්වීම ඇති වෙන බව හැඟෙයි: නමුත් ඉර බැස ගිය පසුව තෙක් ඇයට රුධිරපිටවුනේ නැත; මෙම අවස්ථාවෙහිදී, ඉතාමත් නිවැරදි අදහස් අනුව ඇයගේ උපවාසය සම්පූර්ණ වෙයි; අවලංගු වන්නේ නැත. හේතුව, ස්ත්‍රියගේ ශරීරය ඇතුළත ඇති රුධිර සම්බන්ධ ව නීති රීතීන් කිසිවක් නැත.

"යම් ස්ත්‍රියකට සිහිනෙන් ධාතු පිටවුවොත් ස්නානය කිරීම අවශ්‍ය වන්නේ ද? " යනු නබි(සල්) තුමාගෙන් විමසූ විට, "ඔව්, ඇය යමක් පිටවෙනා දකින්නේ නම්! " යනු එතුමා පිළිතුරු දුන්නේය[34]. මෙයින් නබි (සල්) තුමා, යමක් පිටවීම හරිහැටි දැකීම අනුව තීරණයක් දුන්නා හැර, (ඇතුලේ සිට එළියට) යමක් මාරුවීම කෙරෙහි තීරණයක් නොදුන්නු බව පැහැදිලිය. මෙලෙස ඔසප්වීමෙහි ද යමක් පිටවීම හරිහැටි දැකීම අනුවය , ඒ සඳහා වූ නීති රීති යෙදෙන්නේ.

1 - යම් ස්ත්‍රියකගේ ඔසප්වීම ඉර උදාවීමෙන් (ෆජ්රයට) පසුවත් නොනැවතුණේ නම්, එදින ඇගේ උපවාසය පිළිගත නොහැකි ය. ඉර උදාවී මොහොතකින් පසුව ඇය පිරිසිදු වූවද, එදින උපවාසය පිළිගනු නො ලැබේ.

2 - ඇය ෆජ්රයට කලින් (ඔසප්වීමෙන්) පිරිසිදු වී උපවාසයේ යෙදෙන්නේ නම්, ෆජ්රය පසුවී අනිවාර්ය (ෆර්ල්) ස්නානය නො කළත් ඇයගේ උපවාසය පිළිගනු ලැබේ. ජනාබාත් වී සිටින්නෙකුගේ තත්ත්වයට මෙය සමාන වේ. කෙනෙක් උපවාසයේ යෙදීමේ චේතනාවෙන් (නියියතයෙන්) යුතුව ෆජ්රයට පසුවත් ඔහු/ඇය අනිවාර්ය (ෆර්ල්) ස්නානය නොකළත් ඔහුගේ/ඇයගේ එදින උපවාසය පිළිගත හැකිය. මෙය පහත සඳහන් හදීසයට එකඟ වේ.

ආයිෂා (රලි) තුමිය පැවසුවා ය:
"නබි (සල්) තුමා ජනාබත් ව (එනම් එතුමා තමාගේ භාර්යාවන් සමඟ සංසර්ගයේ යෙදීමෙන් පසු) ඇති තත්ත්වයේ අවදි වී රමළාන් මාසයේ උපවාසයේ යෙදුණේ ය" [35]

# 3 - තවාෆ් (කඃබාව වටේ වාමාර්තව යාම)

ඔසප් වී සිටින කල ස්ත්‍රීන් (අනිවාර්ය/අනිවාර්ය නොවන) කිසිදු තවාෆයන් (කඃබාව වටේ වාමාවර්තව යාම) ඉටු කිරීම තහනම් කොට ඇත. ආයිෂා (රලි) තුමිය හජ් සමයෙහි ඔසප් වීමට පත් වී සිටියාය. එවිට, එතුමියට නබි(සල්) තුමා මෙසේ පැවසුවේය :

"(හජ් සමයෙහි) හාජී කෙනෙක් ඉටු කළ යුතු කාර්ය සියල්ලම ඉටු කරන්න. එහෙත් (ඔසප්වීමෙන්) පිරිසිදු වන තුරු කඃබාව තවාෆ් කිරීම පමණක් නොකරන්න"[36] මේ හැර හජ් කර්තව්‍යයට අයත් අනෙක් කාර්යයන්හි යෙදීමට අවසර ඇත. එහෙයින්, යම් ස්ත්‍රියක් තවාෆ් හෝ සයි (සෆා මර්වා කඳුගැට අතර සක්මන් කිරීම) නම් වූ කාර්යයන්හි යෙදීමෙන් මොහොතකට පසුව හෝ ඇයට ඔසප්වීම ඇති වුවහොත්, ඇය ඉටුකළ මෙම කාර්යයන්ට කිසිදු හානියක් වන්නේ නැත.

---

34. මූලාශ්‍රය : සහීහුල් බුහාරි (අරාබි - ඉංග්‍රීසි) වෙළුම: 1, පි : 171 - 2
35. ආයිෂා (රලි) තුමිය මෙසේ පැවසුවාය: "රමළානයෙහි සිහිනෙන් ධාතු පිට වූ නිසා නොව (සංසර්ගයේ යෙදීම නිසා) නබි (සල්) තුමා ජනාබාත් (කිල්ලට පත්) ව සිටියදී එළි විය: ඉර උදවිය. එවිට එතුමා තම ඇඟ සෝදගෙන උපවාසයේ යෙදුනේ ය." (මූලාශ්‍රය: සහීහ් මුස්ලිම්, වෙළුම: 2, පි: 539)
36. අධෝ ලිපි අංක: 9 බලන්න.

# 4 - සමුගැනීමේ තවාෆයෙන් නිදහස් කිරීම

යම් ස්ත්‍රියක් හජ්, උම්රා යනාදියට සම්බන්ධ වූ කර්තව්‍යයන් සියල්ල ම ඉටුකිරීමෙන් පසුව, තම නිවස (රට හෝ නගරය) කරා යෑමට පෙර ඔසප් වීම ඇතිවී මෙම ඔසප් වීම ඇයගේ ගමනාන්තය දක්වා දික්ගැසේ නම්, ඇය සමුගැනීමේ තවාෆය (කඃබාව වටේ චාමාර්තව යාම)ඉටු නොකර ම පිටත් ව ගිය හැක. ඉබ්නු අබ්බාස් (රලි) තුමා දැන් වූ හදීසයක් මෙයට සාක්ෂි වේ.

එතුමා පැවසුවේ යඃ

"ඔසප් වීම ඇතිවූ ස්ත්‍රීන් හැර අන් සියලු දෙනාම (මක්කාවෙන්) පිටවීමට පෙර ඇති අන්තිම කර්තව්‍යයක් වශයෙන් 'තවාෆ් අල් වදඃ' ව (සමුගැනීමේ තවාෆය) ඉටුකළ යුතු බවට අණ කරනු ලැබුවේ ය. (ඔසප් වීම ඇති වීම නිසා සමුගැනීමේ තවාෆය ඉටු කිරීමට නොහැකි වූ) ස්ත්‍රීන් සමාව දියයුත්තෝ වෙති."[37]

ඔසප් වීම ඇති වූ ස්ත්‍රියක් ශුද්ධ වූ මස්ජිදයට ලඟාවී දුආ (ප්‍රාර්ථනා) කිරීම නුසුදුසු ය. මෙයට හේතුව, මෙය නබි (සල්) තුමාගේ ප්‍රකාශයන්හි නොවීම ය. නමුත් වාර්තා වී ඇත්තේ, "(අනිවාර්ය තවාෆය වන) 'තවාෆ් අල් ඉෆාද' ව ඉටුකිරීමෙන් පසුව ඔසප් වීම ඇතිවුවහොත් (එතැනින්) පිටවී යන්න" යනු ෂෆියියා (රලි) තුමියට නබි (සල්) තුමා පැවසූ බවය. එහෙත්, තවාෆ් අල් ඉෆාද ව හෝ උම්රාවට අදළ තවාෆය ඉටුකිරීමට පෙර යම් ස්ත්‍රියකට ඔසප් වීම ඇතිවුවහොත්, ඇය පිරිසිදු වීමෙන් පසුව මෙම තවාෆයන් ඉටුකළ යුතුය.

# 5 - මස්ජිදයෙහි නැවතී සිටීම

ඔසප් වීම ඇති වූ යම් ස්ත්‍රියක් මස්ජිදයෙහි ('ඊද්' නම් වූ හජ්, සව්ම් උත්සව දිනෙහි සලාත් ඉටුකරන ස්ථානයෙහි පවා) නැවතී සිටීම තහනම්කොට ඇත. නබි (සල්) තුමා පැවසූ බව උම්මු අතියියා (රලි) තුමිය වාර්තා කරන හදීසයක් මෙයට සාක්ෂි වේ.

එතුමිය පැවසුවා යඃ

"බොහෝ විට තිරයෙහි පිටුපස සිටින අවිවාහක ස්ත්‍රීන් හා වැඩිහිටි ගැහැණු ළමයින් බොහෝ විට තිරයෙහි පිටුපස සිටින අවිවාහක ස්ත්‍රීන්හෝ ඔසප් වූ තත්ත්වයෙහි පසුවන ස්ත්‍රීන් හෝ (නිවසින්) පිටත ඇවිත් යහපත් කාර්යයන්හි හවුල් විය යුතුයිඃ එමෙන් ම සැබෑ ඊමාන්ධාරීන්ගේ ආගමික රැස්වීම්වලට සහභාගි විය යුතුයි" මෙසේ කියාගෙන ආ නබි (සල්) තුමා, "එහෙත්" ඔසප් වී සිටින කල ස්ත්‍රීන් මුසල්ලාවෙන් (සලාත් කරන ස්ථානයෙන්) ඈත්වී සිටිය යුතුයි" යනු කියා නිහඬ වූයේ ය."[38]

---

37. දෙදෙනාම එකඟ වූ හදීසය, සහීහුල් බුහාරි (අරාබි-ඉංග්‍රීසි) වෙළුම: 2, පි:469, හදීස් අංකය : 810
38. අධෝලිපි අංක 30 බලන්න.

## 6 - නීත්‍යානුකූල ව සංසර්ගයේ යෙදීම

ස්වාමි පුරුෂයෙක්, තම භාර්යාව ඔසප් වී සිටින කල ඇය සමග සංසර්ගයේ යෙදීම තහනම්කොට ඇත. එමෙන් ම, එවැනි ආශ්වාදයක් ලබාගැනීමට ඇය අවස්ථාවක් සලසා දීමට ද අනුමතිය නොමැත.

අල්ලාහ් මෙසේ පවසයි:

﴿ ويسألونَكَ عن المحيضِ قُلْ هُو أذًى فاعتزلُوا النساءَ في المحيضِ ولا تقربوهنَّ حتـى يطْهُرنْ ﴾ [البقرة ، الآية ٢٢٢]

**"ඔවුහු ස්ත්‍රීන්ගේ මාස් ශුද්ධිය ගැන විමසති. ඊට මෙසේ පවසන්න: එය අපිරිසිදු තත්ත්වයකි. එහෙයින් ස්ත්‍රීන්ගේ මාස් ශුද්ධි කාලයේ ඔවුන්ගෙන් ඈත් වී සිටින්න. ඔවුන් පිරිසිදු තත්ත්වයට යළි එළඹෙනතුරු ඔවුන් වෙත නොයන්න."**

**(අල් කුර්ආන් 2:222)**

මෙහි ඔසප් වීමේ කාලය ගැන සඳහන්කොට ඇත, තවද ස්ත්‍රියගේ යෝනි ප්‍රදේශය මෙහි තහනම් කරනු ලැබ ඇත්තේය. නබි (සල්) තුමා, "ලිංගික සංසර්ගය හැර අන් සියලු දේ කරන්න"[39] යනු පවසා ඇත. ඔසප් වී සිටින කල ස්ත්‍රිය සමග ලිංගික සංසර්ගයේ යෙදීම තහනම්කොට ඇති බව මුස්ලිම්වරු සියල්ලෝම 'ඉජ්මාඃ' නම් වූ ඒකමතික තීරණයට එකඟ වෙති.

අල්ලාහ් සහ විනිශ්චය දිනය කෙරෙහි ස්ථිර විශ්වාසයක් ඇති කවරෙකුට හෝ වේවා මෙය (ලිංගික සංසර්ගය) අනුමතකොට නොමැත. කවරෙකු මෙම කාර්යයෙහි යෙදෙන්නේ ද, හෙතෙම අල්ලාහ්ට හා ඔහුගේ නබි(සල්) තුමාට අවනත නොවී, ඊමාන්ධාරීන්ගේ මාර්ගය හැර අන් මාර්ගයක් අනුගමනය කරන්නෙක් වෙයි.[40]

ඉමාම් ෂාෆිඊ (රහ්) තුමා පැවසූ බව මෙසේ වාර්තා වේ." කවරෙක් මෙම කාර්යයෙහි යෙදෙන්නේ ද ඔහු මහා පාපී ක්‍රියාවක් කළ කෙනෙක් වෙයි." මෙතුමාගේ ගුරුකුලයට අයත් සෙසු විද්වතුන් මෙසේ පවසා ඇත. "යම් කෙනෙක් ඔසප් වී සිටින කල ස්ත්‍රියක් සමග ලිංගික සංසර්ගයේ යෙදීම අනුමත කළ බව සිතන්නේද, හෙතෙම කුෆ්රයෙ (ඉස්ලාමය ප්‍රතික්ෂේප කිරීමෙ) හි වැටුණු කෙනෙක් බව අදහස් කළ යුතු ය."

කෙනෙකුගේ ලිංගික ආවේග හා රාගික හැඟීම් අඩුකර ගැනීමට, ඔහු ඔසප් වී සිටින කල තම බිරිඳගේ තහනම් කළ රහස් ප්‍රදේශ හැර අන් ප්‍රදේශයන් සිප වැළඳ ගැනීමට, ඇය සමග තුරුල් වී සුරතල් බස් දෙඩීමට අනුමතිය ඇත. (ප්‍රශංසා සියල්ල අල්ලාහ්ට හිමි වේ.)

---

39. මූලාශ්‍රය: සහීහ් මුස්ලිම් (ඉංග්‍රීසි) වෙළුම: 1, පි: 175, හදීස් අංකය: 592.

40. අල්ලාහ් අවවාද කරයි. ﴿ وَمَن يُشَاقِقِ الرَّسُولَ مِن بَعدِ مَا تَبَيَّنَ لَهُ الهُدَى وَيَتَّبِع غَيرَ سَبِيلِ المُؤمِنِينَ نُوَلِّهِ مَا تَوَلَّى وَنُصلِهِ جَهَنَّمَ وَسَاءَت مَصِيرًا ﴾

**"තවද, තමාට යහමග පැහැදිලි වූවායින් පසුව, යමෙක් නබිවරයාට විරුද්ධකම් පෑමෙහි යෙදී සිටින්නේ ද, ඊමාන්ධාරීන්ගේ මාර්ගය නොවන මාර්ගයෙ හි යන්නේ ද, අපි ඔහු යන දුර්මාර්ගයෙහි ම යවමු: පසුව, නිරයට ඇතුළු කරමු: එය ඉතා නරක තැනකි."**

(අල් කුර්ආන් 4:115)

එහෙත්, අපි අමතක නොකළ යුතු වැදගත් කාරණයක් ඇත. එනම්, යම් ස්වාමි පුරුෂයෙක් තම භාර්යාව ඔසප් වී සිටින කල ඇයගේ පෙකනියටත් දණහිස් දෙකටත් අතර ඇති ප්‍රදේශය යම් දෙයකින් නොවසා සමීප නොවිය යුතුය. ආයිෂා රලි තුමිය, "එතුමා (නබිවරයා) (මා ඔසප් වී සිටියදී) ඉෂාරයක් (ඉණෙන් පහළ අඳින ඇඳුමක්) අඳින ලෙස නියම කොට, ඉන්පසුව මා සමඟ තුරුල් වී සුරතල් කරයි."[41] යනු කීවාය.

# 7 - දික්කසාදය

යම් කෙනෙක් තම භාර්යාව ඔසප් වූ තත්ත්වයේ පසුවෙද්දී දික්කසාද කිරීම තහනම්කොට ඇත.

අල්ලාහ් පවසයි:

﴿ إِذَا طَلَّقْتُمُ النِّسَاءَ فَطَلِّقُوهُنَّ لِعِدَّتِهِنَّ ﴾[ الطلاق، الآية ١]

**"ඔබ ස්ත්‍රීන් දික්කසාද කරන්නේ නම් ඔවුන්ගේ ඉද්දා (කාලය තීරණය කරන්නට) හැකි පරිදි දික්කසාද කරන්න."**

(අල් කුර්ආන් 65:1)

මෙයින් අදහස් කරනු ලබන්නේ, ස්ත්‍රීන් දික්කසාද කරන අවස්ථාවෙහි ඔවුහු තමාගේ ඉද්දව තීරණය කරගත හැකි තත්ත්වයෙහි සිටිය යුතු බවය. එනම්, එක්කෝ ඔවුහු (ඔසප් වීම, සංසර්ගයේ යෙදීමට මත්තෙන් ආදී තත්ත්වයන්ගෙන්) පිරිසිදු ව, නැතිනම් ගැබ් ගෙන (එම තත්ත්වය මග හැරෙන කාලය දක්වා) සිටිය යුතු ය.

උදහරණයක් වශයෙන්, ස්ත්‍රියක් ඔසප් වී සිටියදී දික් කසාද කළහොත්, ඇයගේ ඔසප් වීම නියමිත ඉද්දවේ එක් කොටසක් බව ගණන් ගනු නොලැබේ.* එයින්, ඇයට ඇයගේ ඉද්දව නිවැරදි ව ගණන් ගන්න නොහැකි වෙයි. තවද, ඇය පිරිසිදු ව සිටිය දී තම සැමියා සමග සංසර්ගයේ යෙදෙන්නියක් ව සිටින විට දික්කසාද කරනු ලබයි නම්, එවිට ඇය තමාගේ ඉද්දව ගැන ස්ථිර අදහසක් නොමැතිව සිටියි. (නැතිනම් ඇය ගැබ්ගත් ස්ත්‍රියක් ව නොසිටියි.) මෙසේ, ඇයගේ ඉද්දව කුමන එකක් ද යනු පැහැදිලිව තීරණය කළ නොහැකි තත්ත්වය, ඇයගේ (පිරිසිදුවක්කිඹද නැතහොත් ගර්භණීණඅද යනුවෙන් වූ) තත්ත්වය පැහැදිලි වනතෙක් ඇය ව දික්කසාද කිරීම තහනම්කොට ඇත.

ඉබ්නු උමර් (රලි) තුමා, තමාගේ භාර්යාව ඔසප් වී සිටියදී දික්කසාද කළ බව දැනගැනීමට ලැබුණුවිට, නබි(සල්) තුමා ඉමහත් කෝපයට පත්වූ බව කියනු ලැබේ. මෙම ආරංචිය ගෙන ආ උමර් ඉබ්නුල් කත්තාබ් (රලි) තුමා වෙත "ඇයව ආපසු ගන්න!" කියා එතුමා පැවසුවේ ය.**

මේ අනුව, යම් කෙනෙක් තමාගේ භාර්යාව ඔසප් වී සිටිය දී දික්කසාද කරන්නේ නම් එය පාපි ක්‍රියාවකි. එයට පශ්චාත්තාපයට පත්වී අල්ලාහ්ගේ සමාව අයැද සිටිය යුතුය; පසුව ඔහුගේ තීරණය වෙනස් කළ යුතුය; තවද, ඇය පිරිසිදුවන තෙක් තමා යටතේ තබාගන්නා අතර ඊලඟ ඔසප් වීම ඇති වෙනතුරු ඉවසීමෙන් සිටිය යුතු ය. ඉතික්බිති ව, ඇය පිරිසිදුවූවායින් පසුව, ඇය සමග සංසර්ගයේ නොයෙදී සිටින තත්ත්වයක, ඈ සමග පවුල් ජීවිතයක් ගත කරන්නේ ද නැතහොත් දික්කසාද කරන්නේ ද යන තීරණ දෙකෙන් එකකට එළඹිය යුතුය.

---

41. මූලාශ්‍රය: සහීහුල් බුහාරි (අරාබි-ඉංග්‍රීසි) වෙළුම:1 පි:180, හදීස් අංකය: 298
* අධෝ ලිපි අංක 21 බලන්න.
** අධෝ ලිපි අංක 21 බලන්න.

ඔසප්වී සිටිය දී ස්ත්‍රියක් දික්කසාද කිරීමට කොන්දේසි තුනක් ඇත:

**පළමුවෙනි කොන්දේසිය:** ස්වාමි පුරුෂයෙක් තමාගේ භාර්යාව සමග ලිංගික සබඳකම් නොපවත්වා ඇත් වී සිටින විට හෝ ඇත්ත වශයෙන් ම ඇය සමග සංසර්ගයේ යෙදීමට පෙර හෝ ඔහු ඇයව දික්කසාද කරන්නේ නම්, එම තත්ත්වයේ ඇයට 'ඉද්දව' කියා යමක් නැත, තවද, ඇයගේ දික්කසාදය අල්ලාහ්ගේ අණට එරෙහි වන්නේ ද නැත.

අල්ලාහ් මෙසේ අණ කරයි:

﴿ فَطَلِّقُوهُنَّ لِعِدَّتِهِنَّ ﴾

"ඔවුන්ගේ ඉද්ද (කාලය තීරණය කරන්නට) හැකි පරිදි දික්කසාද කරන්න."
(අල් කුර්ආන් 65:1)

**දෙවෙනි කොන්දේසිය:** සමහර විට, ස්ත්‍රියක් ගැබ් ගෙන සිටිය දී ඔසප් වීමට පත්වුවහොත්, කළින් විස්තර කළ පරිදි, ඇයගේ ඉද්දව ඇයගේ ඔසප් වීම සමග නොව ඇයගේ ගැබ් ගැනීම සමග සම්බන්ධ වී තිබේ.

**තුන්වෙනි කොන්දේසිය:** යමක් (අල් කුල් - 'Al khul) ලබාගෙන දික්කසාද කිරීම. උදාහරණයක් නම්: අඹු සැමි යුවල අතර නොකඩවා මහත් ප්‍රශ්නයන් පවතී නම් හෝ හිංසා පීඩා හා වෙනස්කම් යනාදියට ලක්වේ නම් හෝ ස්වාමි පුරුෂයා තම භාර්යාව දික්කසාද කිරීම වෙනුවෙන් යමක් ලබාගැනීම අනුමතකොට ඇත. මෙයට ඉබ්නු අබ්බාස් (රලි) තුමා දක්වන හදීසයක සාක්ෂි ඇත.

"තාබිත් බින් කයිස් බින් ෂමාස් නැමැත්තාගේ භාර්යාව නබි (සල්) තුමා වෙත පැමිණ, "යා රසූලුල්ලාහ්! මම තාබිත් වෙත ඇති කල්කිරියාවන්හි හා ඔහුගේ ආගමික වත් පිළිවෙත් හි ඇති අඩු පාඩු ගැන දෙස් නොකියමි. එහෙත්, මුස්ලිම් (කාන්තාවක්) වූ මම (ඔහු සමග තවත් ජීවත් වීමෙන්) ඉස්ලාමයට විරුද්ධ ව හැසිරෙන්න නම් කැමති නැහැ"යි කීවා ය. මෙයට සවන්දුන් නබි (සල්) තුමා, ඔබට ඔබගේ ස්වාමි පුරුෂයා (මහර්[42] වශයෙන්) දුන් ඉඩම ඔහුට ආපසු දෙනවාද?" යනු විමසී ය. "එසේය"යි ඇය පිළිතුරු දුන්නාය. පසුව, නබි (සල්) තුමා තාබිත් දෙසට හැරී, "තාබිත්! ඔබගේ ඉඩම ලබාගන්න: ඇය ව එක්වරක් දික්කසාද කරන්න!"[43] යනු පැවසුවේය.

මෙහි අපගේ අවධානය යොමුවිය යුතු කරුණක් ඇත. එනම්, නබි (සල්) තුමා මෙම අවස්ථාවේ දී 'ඇය ඔසප් වී සිටිනවාද නැද්ද? යනු නොවිමසීම ය. මෙවැනි සාධාරණ හේතු කරනකොට ගෙන යම් භාර්යාවක් තම ඔසප් වීම ගැන නොසලකා දික්කසාදය ඉල්ලා සිටිය හැක. ස්ත්‍රියක් ඔසප් වීම ගැන නොසලකා දික්කසාදය ඉල්ලා සිටිය හැක. ස්ත්‍රියක් ඔසප් පවත්නා කාලය තුළ දික්කසාද කිරීමෙන් ඇයගේ ඉද්දව දික් ගැසී, ඇයට නොයෙකුත් උපද්‍රව ඇතිවිය හැකිය. එහෙත්, මෙම උපද්‍රව නොයෙකුත් හිංසා පීඩා කිරීම්, මහත් ප්‍රශ්න, පවුලේ කෙරෙන වෙනස්කම් ආදිය සමග සසඳා බලන විට ඉතා සුළුපටු වේ. මෙවැනි අවස්ථාවක දික් කසාදයට අනුමැතිය දීමෙන් මෙම අයහපත් තත්ත්වය මගහරවා ගැනීම ඉතාමත් ශීඝ්‍රයෙන් කළයුතු වැදගත් කාර්යයක් වන්නේ ය. මෙම හේතු කරනකොට ගෙනය නබි (සල්) තුමා, තාබිත් බින් කයිස්ගේ භාර්යාවගෙන් ඇයගේ ඔසප් වීම ගැන නොවිමසුවේ![44]

42. මහර්: මනමාලයාගෙන් මනමාලිය ලබාගන්නා දෑවැද්ද.
43. මූලාශ්‍රය: සහීහුල් බුහාරි (අරාබි-ඉංග්‍රීසි) වෙළුම: 7, පි: 150, හදීස් අංකය:197
44. 'අල් මුඝ්නී' හි සඳහන් වී ඇත. වෙළුම: 7, තා-මීම්, පි:52

**සිත යොමුකළ යුතු කරුණක්:** ඔසප් වී සිටින ස්ත්‍රියක් ගැන කිසිවක් කීමට සාක්ෂි නැති නිසා, ඇය සමග විවාහ සබඳකම් තබා ගැනීමට ඉස්ලාමය අනුමතකොට ඇත. නමුත්, ඇය විවාහකර ගන්නා ස්වාමි පුරුෂයා බොහොම ප්‍රවේශමෙන් සිටිය යුතුයි. සමහර විට, ඔහුගේ ලිංගික හැඟීම් හා ආශාවන් මැඩපවත්වා ගන්න බැරි තත්ත්වයක් ඇතිවෙන්න පුළුවන. එවැනි අවස්ථාවක ඔහු, ඇගේ ඔසප් නතර වී ඇ පිරිසිදුවනතෙක්, ඇ සමග තනිව නොසිටිය යුතුයි.

# 8 - දික්කසාදයට අදල ඉද්දව සහ ඔසප් වීම හා ඇති සබඳකම

ස්වාමි පුරුෂයෙක් තමාගේ භාර්යාව සමග පළමුවෙනි සංසර්ගයේ යෙදීමෙන් පසුව හෝ ඇය සමග තනි ව සිටීමෙන් පසුව හෝ, ඔහු විසින් ඇය දික්කසාද කරනු ලැබුවහොත්, ඇය ඉද්ද වශයෙන් ඔසප් වාර තුනක කාලයක් සම්පූර්ණයෙන් රැඳී සිටිය යුතුය. (එයින් ඇය ගැබ් නොගත්, ඔසප් වීම ඇතිවෙන ස්ත්‍රියක් බවට පැහැදිළි වෙයි.) මෙය අල්ලාහ්ගේ පහත සඳහන් කුර්ආන් වාක්‍යයට එකඟවන්නේ ය.

ඔහු පවසයි:

﴿ والمُطَلَّقاتُ يَتَرَبَّصْنَ بأنفُسِهِنَّ ثَلاثَةَ قُروءٍ ﴾[ البقرة، الآية ٢٢٨]

**"දික්කසාද වූ ස්ත්‍රීන්, මාස් ශුද්ධි තුනක් තෙක් බලාපොරොත්තු විය යුතුය."**

**(අල් කුර්ආන් 2:228)**

සමහර විට ඇය ගැබ්ගෙන සිටියහොත් ඇයගේ ඉද්දව දරු ප්‍රසූතිය කරා දික්ගැසෙයි. (ඇය අඩු මාසයේ හෝ මාස් ගණන සම්පූර්ණ වූ ගැබිනියක් වුවත් හෝ නියමය මෙය වේ.)

මේ ගැන අල්ලාහ් මෙසේ පවසයි:

﴿ وَأُولاتُ الأحمالِ أجَلُهُنَّ أنْ يَضَعْنَ حَمْلَهُنَّ ﴾ [ الطلاق، الآية ٤]

**"තවද, ගැබිනියන්ගේ ඉද්ද සීමාව (ඔවුහු දික්කසාද කරනු ලැබ හෝ ඔවුන්ගේ ස්වාමි පුරුෂයන් මරණයට පත්වීමෙන් හෝ ඇතත්) ඔවුන්ගේ දරු ප්‍රසූතියත් සමග අවසන් වේ."**

(අල් කුර්ආන් 65:4)

සමහර විට, වැඩිවියට පත් නොවූ ස්ත්‍රීන්ට මෙන් ඇයට යමක් (ඔසප් වීම) නැතහොත් හෝ ඔසප් වීමේ වයස් සීමාව ඉක්මවා ගියවිට හෝ ශල්‍ය කර්මයකින් ඇයගේ ගර්භාශය ඉවත් කළවිට හෝ මෙවැනි වෙනත් තත්ත්වයන් හි හෝ ඇයගේ ඉද්දව හරියටම මාස තුනක් වේ. අල්ලාහ්ගේ වාක්‍ය මෙයට සාක්ෂි වේ.

අල්ලාහ් පවසයි:

﴿ واللائي يَئِسْنَ مِنَ المَحيضِ من نسائِكُم إنْ ارتَبْتُمْ فَعِدَّتُهُنَّ ثَلاثَةُ أشهرٍ واللائي لَمْ يَحِضْنَ ﴾ [ الطلاق، الآية ٤]

**"ඔබගේ ස්ත්‍රීන්ගෙන්, කවරෙකු ඔසප් වන වයස ඉක්මවා සිටින්නේ ද, ඔවුන් සම්බන්ධ ව ඔබට යම් සැකයක් ඇතිවුවහොත් (ඔබ දැනගන්න:) ඔවුන්ගේ ඉද්දා කාලය මාස තුනක් වේ. තවද, කිනම් ස්ත්‍රීන්ට මේවන තෙක් ඔසප් වීම ඇති නොවුණේ ද ඔවුන්ට අදාළ (සීමා කාලය ද) මෙය වේ."***

**(අල් කුර්ආන් 65:4)**

සමහර විට, ඔසප් ඇතිවෙන යම් ස්ත්‍රියකට යම් යම් (ලෙඩ රෝග, ළදරුවන්ට මව්කිරි දීම යනාදී) හේතු නිසා ඔසප්වීම ඇණ හිටියි. මෙහිදී ඇය තමාට නැවත ඔසප්වීම ඇතිවනතෙක් (එය ඉතා දීර්ඝ කාලයක් වුවත්) ඉද්ද සිටිය යුතුය. එකල්හි ඇය ඉද්ද කාලය ගණන් තියාගත යුතුය. ඇයට ඔසප් ඇති නොවීමට හේතුවූ එම තත්ත්වය වෙනස් වූ පසුවත්, ඔසප් වීම ඇති නොවුවහොත්, එම තත්ත්වය වෙනස් වූ කාලය පටන් සම්පූර්ණ අවුරුද්දක් ඇය ඉද්දවේ සිටිය යුතුය. මෙයයි ඉස්ලාමීය නීති පද්ධතියට සරිලන අදහස ද වන්නේ. ඇයගේ මෙම තත්ත්වය, ඔසප් වීම නැවතීමට හේතුව කුමක් ද යනු නොදන්නා ස්ත්‍රියකගේ තත්ත්වයට සමාන වේ. මැයගේ ඉද්ද කාලය සම්පූර්ණ අවුරුද්දකි. (සාමාන්‍යයෙන් දරු ප්‍රසූතිය වෙනුවෙන් ප්‍රමාණවත් බව තක්සේරු කරනු ලබන) මාස නවයක කාලය ද ඇයගේ නියම ඔසප් වීම සඳහා වූ කාලය වන මාස තුනක කාලය ද මෙහි අඩංගු වේ.

යම් ස්ත්‍රියකට විවාහ ගිවිසුමක් කරනු ලැබ ඇත. නමුත්, ඇය තම ස්වාමි පුරුෂයා සමග හුදකලාව සිටියේ නැත: සංසර්ගයේ යෙදුනේ ද නැත. මෙවැනි තත්ත්වයක ඔවුනතර දික්කසාදයක් වේනම්, ඇය කිසිදු ඉද්දවක් රැකිය යුතු නැත.

අල්ලාහ් මෙසේ පවසයි:

﴿ يا أيُّها الذينَ آمنوا إذا نَكَحْتُمُ المؤمِناتِ ثُمَّ طلَّقْتُموهُنَّ مِنْ قَبْلِ أن تَمَسوهُنَّ
فما لكم عليهِنَّ مِنْ عِدَّةٍ تَعتَدونَها ﴾[ الأحزاب، ٤٩]

**"ඊමාන්ධාරිනි! දේව විශ්වාසය (ඊමානය) ඇති ස්ත්‍රීන් ඔබ විවාහ කරගැනීමෙන් පසුව, ඔවුන් ව ස්පර්ශ කරන්නට පෙර ඔවුන්ව දික්කසාද කළේ නම් ඔවුන්ට ඉද්ද සිටිය යුතු කාලයක් නැත. එහෙයින්, ඔවුනට ත්‍යාගයන් දී ඉතා යහපත් අන්දමින් නිදහස්කොට හරින්න."**

**(අල් කුර්ආන් 33:49)**

# 9 - නිදහස් ගර්භාශය

ගැබ් ගැනීමෙන් නිදහස් වූ ගර්භාශයක් ස්ත්‍රියකගේ ඔසප් වීමේ තත්ත්වයට සමාන ව ඇත. එහෙයින්, එයට ම ආවේනික වූ ඉස්ලාමීය නීතිරීති ද ඇත.

උදාහරණයක් වශයෙන්: විවාහ වූ යම් ස්ත්‍රියකගේ නෑදෑ කෙනෙක් මිය යන බව සිතා ගනිමු. ඔහුට විශේෂයෙන් උරුම වූ දේපොළ ඇත. මෙම අවස්ථාවෙහි එම ස්ත්‍රිය ගැබ්ගෙන

---

* ස්වාමි පුරුෂයා මරණයට පත් වූවිට, ඔහුගේ බිරිඳගේ තත්ත්වය මෙයට වඩා සුළු වශයෙන් වෙනස් වෙයි.

මේ සම්බන්ධ ව අල්ලාහ් මෙසේ පවසයි:
**"ඔබ අතුරින් යමෙකු භාර්යාවන් තබා මිය ගියහොත්, එම භාර්යාවෝ සිවු මසක් හා දස දිනක් (විවාහයෙන්) වැළකී සිටිය යුත්තාහ."**

**(අල් කුර්ආන් 2:234)**

සිටින්නේ ද, නැතහොත්, එම දේපොළ බෙදා දීම සම්බන්ධ ව තීරණයක් ගැනීමේ තත්ත්වයක නොසිටින්නේ ද යනු දැන ගැනීම අවශ්‍ය වේ.

එහෙයින්, ඇයගේ ස්වාමි පුරුෂයා පහත සඳහන් කරුණු මනාවේ පැහැදිලි වනතෙක් ඇය සමග සංසර්ගයේ නොයෙදී සිටිය යුතුය.

අ) ඇය ඔසප් වීම ඇතිවෙන තැනැත්තියක්: ඇයගේ එම තත්ත්වයෙහි ගර්භාශය නිදහස් ව ඇතිහෙයින් උරුමවන දේපොළ සඳහා සුදුසුකමක් නැති බව පැහැදිලි කර ගැනීම.

ආ) එම දේපොළ උරුම වූ තැනැත්තා මරණයට පත්වන විට, ඇය ගැබ්ගෙන ඇති බව ඔප්පු වීම. මෙම අවස්ථාවෙහි, උරුමවන දේපොළ බෙදා දෙනවිට අලුතින් ඉපෙදෙන්නට ඉන්න ළදරුවා ද සැලකිල්ලට යොමුවිය යුතුය.

# 10 - ගුස්ල් (ජල ස්නානය) අනිවාර්ය වීම

ඔසප් වීමට පත් වූ යම් ස්ත්‍රියක් එය නතර වූවාට පසුව (ඔසප් වීමෙන් පිරිසිදු වූවාට පසුව) ජල ස්නානය කිරීම අනිවාර්ය වේ. මේ සම්බන්ධ ව (අබූ හුබෙයිෂ්ගේ දුව වූ) ෆාතිමා හට නබි (සල්) තුමා මෙසේ පැවසුවේය:

"ඔබගේ ඔසප් වීම පටන් ගැනුණු විට සලාතය අත් හරින්න. (සලාත් කරන්න එපා) එය (ඔසප් වීම) නැවතුණු පසු ව ඔබගේ ශරීරයේ (තැවරී) ඇති රුධිර මනාවේ සෝද (සම්පූර්ණ ජල ස්නානයක් කිරීම තුළින් පිරිසිදු කර) ගන්න; පසුව සලාතය ආරම්භ කරන්න."[45]

ජල ස්නානය කිරීමේ දී අවම වශයෙන් ඉටුකළ යුතු යුතුකම් නම්, හිස් මුදුන ඇතුළු ව සම්පූර්ණ ශරීරයම හොඳ හැටි සේදීම වේ. මෙම ජල ස්නානය කෙසේ කළ යුතුද යනු ගැන වූ ආදර්ශය නබි (සල්) තුමාගේ ආදර්ශයෙන් ලද එකකි.

ශක්ල් නම් වූ තැනැත්තාගේ දියණිය වූ අස්මා අනිවාර්ය ජල ස්නානය ගැන නබි (සල්) තුමාගෙන් විමසූ විට, එතුමා පහත සඳහන් ලෙස පැවසූ බවට හදීස් හි වාර්තා වේ.

"ඔබගෙන් සෑම කෙනෙක් ම 'සිත්ර්' ගසේ (කොළ කලවම් වූ) ජලයෙන් හොඳ හැටි ශුද්ධ කරගත යුතුය. පසුව, ඇය තමාගේ හිස මත ජලය වත්කර (හිස කෙස් හි ආරම්භය දක්වා (එම ජලය) යන සේ හොඳහැටි පිරිමැදිය යුතුය. පසුව, ඇය ජලය ගෙන එය (හිස) මත වත්කර ගත යුතුය. ඊට පසුව, කස්තූරි තැවරූ කපු රෙදි කැබැල්ලක් ගෙන, එයින් ශුද්ධ කරගත යුතුය." යනු නබි (සල්) තුමා පැවසුවේ ය."

"එවිට, "එය ගෙන කෙසේ ශුද්ධ කර ගනිම් ද?" යනු අස්මා විමසූ විට නබි (සල්) තුමා 'සුබ්හානල්ලාහ්' යනු අල්ලාහ් ප්‍රසංශා කළහ. "රුධිර තැවැරුණු ලකුණු යනකම් ම ශුද්ධ කරන්න" යනු(නබි(සල්) තුමාගේ භාර්යාවක් වන) ආයිෂා (රලි) තුමිය පිළිතුරු දුන්නාය."[46]

ඔසප් වූ ස්ත්‍රියක් තමාගේ හිසකෙස් හි යටි පැත්ත දක්වා ම ජලය යෑම වළක්වන සේ ඉතාමත් තදව හා කිට්ටුව හිසකෙස් ගොතා ඇත්තේ නම්, අනිවාර්ය ජල ස්නානය කරනවිට හිසකෙස් මුදා (කඩා) දැමීම අනිවාර්ය නොවේ.

---

45. මූලාශ්‍රය: සහීහුල් බුහාරි (අරාබි-ඉංග්‍රීසි) වෙළුම: 1, පි: 196, හදීස් අංකය: 327
46. මූලාශ්‍රය: සහීහුල් මුස්ලිම් (ඉංග්‍රීසි) වෙළුම: 1, පි: 188, හදීස් අංකය: 649

උම්මු සලාමා (රලි) තුමිය නබි (සල්) තුමාගෙන් මෙසේ විමසුවාය:

"මම (මගේ) හිසකෙස් ඉතා කිට්ටුව තදව ගොතා ඇති ස්ත්‍රියකි.

එමනිසා, සංසර්ගයේ යෙදුණු (නැතහොත්, තවත් වාර්තාවක් අනුව ඔසප් වීමට පත් වූ) හෙයින් ජල ස්නානය කිරීමට (මගේ) හිසකෙස් මුද (කඩා) හැරිය යුතු ද?" මෙයට පිළිතුරු දුන් නබි (සල්) තුමා, "නැත, ඔබගේ අත්හි පුරවා ගත් ජලය තුන්වරක් ගෙන හිසමත වක්කර ගතහොත් සෑහේ. පසුව ඔබගේ (ශරීරයමත) ජලය වක්කරගන්න. මෙසේ (කිරීමෙන්) ඔබ පිරිසිදු වන්නේය. යනු පැවසුවේ ය."[47]

ඔසප් වීමට පත්වූ ස්ත්‍රියක් යම් සලාතයකට අදළ අවස්ථාවකදී පිරිසිදු වන්නේ නම්, නොපමාව අනිවාර්ය ජල ස්නානයක් ගත යුතුය. එලෙස ජල ස්නානයක් කළොත් සලාතය පමා නොකර නියමිත වේලාවට ම ඉටුකළ හැකිය. සමහර විට, ඇය ගමනක යෙදී සිටියි: ජලය ද නොලැබෙයි. නැතහොත්, ජලය ලැබුණත් එය පාවිච්චි කිරීමෙන් ඇයට යම් පීඩාවක් (ලෙඩ රෝග හෝ වෙනත් යමක්) ඇතිවෙයි යන භයක් ඇත්තේ නම්, ඇය 'තයම්මුම්'[48] කළ යුතු ය. ඇයට ජලය පාවිච්චි කිරීමට ඇති බාධාව මගහැරෙනතකම් මෙලෙස 'තයම්මුම්' කළ හැකිය. පසුව ජල ස්නානය කළ හැකිය.

යම් සලාතයකට අදළ අවස්ථාවෙහි පිරිසිදු වන යම් ස්ත්‍රීන් සිටියි. ඔවුහු ජල ස්නානය කිරීම පමා කරන්නෝ වන්නාහ. මේ සඳහා ඔවුහු කියන හේතුව නම්, 'එම සලාතයට අදළ අවස්ථාව තුළ තමා පිරිසිදු කරගැනීම අපහසු' බවය. මෙය තමා වෙත පැවරී ඇති වගකීම පැහැර හරින ක්‍රියාවකි. ඇත්ත වශයෙන්, ඔවුහු තමන් පිරිසිදු කර ගැනීමේ අනිවාර්ය ජල ස්නානයට අදළ අනිවාර්ය කටයුතු නිසිලෙස කරගැනීමටත්, එම සලාතය නියමිත වේලාවෙහි ඉටුකිරීමටත් ප්‍රමාණවත් කල වේලාවක් ඇත. පසුව, ඔවුන්ට සම්පූර්ණ නිදහස් වේලාවක් ලැබුණුවිට, අංග සම්පූර්ණ ජල ස්නානයක් කළ හැක.

---

47. මූලාශ්‍රය: සහීහ් මුස්ලිම් (ඉංග්‍රීසි) වෙළුම: 1, පි: 187, හදීස් අංකය: 643

48. **තයම්මුම්:** කෙනෙකු තමාගේ දෑත පිරිසිදු පසෙ හි සෙමින් තබා හෝ ගසා, එම දෑතේ අල්ලෙන්, ඒවායේ පිටපැත්ත එකින් අනෙක පිරිමැදිය යුතුය. පසුව, දෑතේ ඇති දූවිලි ගසාදමා මුහුණ පිරිමැදිය යුතුය. ජලය නොලැබෙන කල්හි මෙය ක්‍රියාවට නැගෙයි.

# 5

# ඉස්තිහාලාහ්

ඉස්තිහාලාහ් යනු ස්ත්‍රියකගේ යෝනිය තුළින් නොනැවතී හෝ ඉතා කෙටි කාලයක් (මාස්පතා දිනයක් දෙකක්) නැවතී නැවත පිටවෙන රුධිරවලට කියනු ලැබේ.

**1 - නොනැවතී පිටවෙන රුධිරය:**

ආයිෂා (රලි) තුමිය මෙසේ වාර්තා කරයි:

"ෆාතිමා බින්ත් අබී හුබෙයිෂ් තුමිය නබි(සල්) තුමා බැහැදැක, 'මම පිරිසිදු නොවෙමි (රුධිර පිටවීම නොනැවතෙයි)' යනු හෝ තවත් වාර්තාවක, 'මට (ඔසප්වන කාලයන් අතර) නොනැවතී රුධිර පිටවෙයි. එසේ හෙයින්, මම අපිරිසිදු වෙමියි'[49] යනු හෝ කීවා ය.

**2 - ඉතා කෙටි කාලයක් නැවතී නැවත පිටවෙන රුධිර**

"නබි (සල්) තුමා වෙත පැමිණි, හම්නාහ් බින්ත් ජහ්ෂ් තුමිය "මාගේ ඔසප් වීම ප්‍රමාණයෙන් වැඩිව ද, ඉවසිය නොහැකිව ද වෙයි" යනු කීවාය."[50]

# ඉස්තිහාලාහ්වෙහි ඇති නොයෙක් තත්ත්වයන්.

1 - **ඉස්තිහාලාහ්වට පෙර, ස්ත්‍රියකගේ ඔසප් වීමෙහි පැහැදිලි කාල චක්‍රයක් ඇත.** ඒ අනුව, නියමිත කාලයන්හි ඇයට ඔසප් වීම ඇතිවෙයි. එවිට සලාතය, උපවාසය වැනි නැමදීම් හි යෙදෙනු සම්බන්ධව, ඔසප් වීමට අදාළ නීතිරීති ඇය විසින් පිළිපදිනු ඇත. ඔසප් වීම ඇතිවෙන නියමිත කාලයේ හැර අන් කාලයන් හි පිටවෙන රුධිර ඉස්තිහාලාහ් ලෙස සලකා එයට අදාළ නීතිරීති පිළිපැදිය යුතුය.

උදහරණයක් වශයෙන්: ස්ත්‍රියක්, තමාට සෑම මාසයකම ආරම්භයේ දී දින හයක් සාමාන්‍ය ලෙස රුධිර පිටවෙනවා දකියි. පසුව, එම රුධිර පිටවීම නොනැවතී යෑමට පටන් ගනියි. මෙවැනි අවස්ථාවක, එම ස්ත්‍රියට සාමාන්‍ය ව මාස්පතා දින හයක් පිටවෙන රුධිර ඔසප් වීම ලෙසත්, ඊට අමතර ව පිටවෙන රුධිර ඉස්තිහාලාහ් ලෙස සැලකිය යුතුය.

ආයිෂා (රලි) තුමිය වාර්තා කරන මෙම හදීසය මෙයට සාක්ෂි වේ:

"මාගේ (ඔසප් වන කාලයන්හි) නොනැවතී රුධිර පිටවෙයි. එසේහෙයින් මම පිරිසිදු නොවෙමි. (එම නිසා) මම සලාතය අත්හරින්න ද?" යනු ෆාතිමා බින්ත් අබී හුබෙයිෂ් තුමිය නබි (සල්) තුමාගෙන් විමසුවාය. (ඊට පිළිතුරු දුන්) නබි (සල්) තුමා, "නැත. එය රුධිර වාහිනියකින් ඇති වන්නකි. ඔබට සාමාන්‍යයෙන් ඔසප් වීම ඇති වෙන දිනයන් හි පමණක් සලාතය ඉටු නොකරන්න. පසුව, (අනිවාර්ය) ජල ස්නානයකොට සලාතය (පටන් ගන්න) ඉටු කරන්න." යනු පැවසුවේ ය."[51]

---

49. මූලාශ්‍රය: සහීහුල් බුහාරි (අරාබි-ඉංග්‍රීසි) වෙළුම: 1, පි: 194, හදීස් අංක 322 හි කොටසකි.
50. මෙය සත්‍ය හදීසයක් බව ඉමාම්වරුන්වන අහ්මද්, අබූදාවුද්, තිර්මිදි යනාදීහු පවසති. ඉමාම් අහ්මද් මෙය සත්‍ය හදීසයක් බව කියන විට, ඉමාම් බුහාරි යහපත් හදීසයක් බව කියයි.
51. මූලාශ්‍රය: සහීහුල් බුහාරි, (අරාබි-ඉංග්‍රීසි), වෙළුම: 1, පි: 194, හදීස් අංකය: 322

'සහීහ් මුස්ලිම්' හදීස් ග්‍රන්ථයේ සටහන් වී ඇති වෙනත් හදීසයක් මෙසේ ය:

"දිගින් දිගටම රුධිර පිටවීම ඇතිව සිටි උම්මු හබීබාහ් බින්ත් ජහ්ස් තුමියට නබි (සල්) තුමා මෙසේ පැවසුවේ ය. "ඔබගේ ඔසප් වීම ඇති වූ සමයෙහි (සලාතයෙන්) ඈත් වී සිටින්න. පසුව සෝද (පිරිසිදු වී) සලාතය ඉටුකරන්න."[52] මෙලෙස ඇය පිරිසිදු වී සලාතය ඉටුකළාට පසුව ඇයගේ අමතර රුධිර පිටවීම ගැන සැලකිලිමත් වීම අවශ්‍ය වේ.

2 - **ඉස්තිහාලාහ්වට පෙර, ස්ත්‍රියකගේ ඔසප් වීමෙහි පැහැදිලි කාල චක්‍රයක් නැත.** එහෙයින්, සාමාන්‍ය ඔසප් වීම් සමයෙහි පිටවෙන රුධිර වලටත් ඉස්තිහාලාහ්වේ දී පිටවෙන රුධිර වලටත් අතරැති වෙනස දැනගැනීමට, ඇය මෙම දෙවිදිහේ රුධිර වල ස්වභාවය ගැන අවධානය යොමුකළ යුතුය. ඔසප් වීම් සමයෙහි පිටවෙන ලේහි ඇති උකුකම, අඳුරු පැහැය, යම් විශේෂ ගන්ධයක් තිබීම යනාදිය තුළින් 'එය ඔසප් වීමට අදාළ රුධිර' බව වටහා ගත හැකිය.

උදහරණයක් වශයෙන්: ස්ත්‍රියක් තමාට දිගින් දිගට ම රුධිර පිටවෙන බව දකියි. එම රුධිර මාසයේ මුල් දින දහය තුළ අඳුරු රත් පැහැයෙන් හා අනෙක් දිනයන් හි පැහැදිලි රතු පැහැයෙන් තිබෙනවා ඇය දකියි. නැතහොත්, මාසයේ මුල් දින දහය තුළ උකුවටත් ඉතිරි දිනයන් හි දියාරුවටත් යනවා දකියි. එසේත් නැතහොත්, මුල් දින දහය තුළ පිටවෙන රුධිරවල, ඔසප් වීම් සමයේ රුධිරවල තිබෙනා ගන්ධය ඇති අතර අනෙක් දිනයන්හි කිසිදු ගන්ධයක් නැති බව ඇයට වැටහෙයි. මේ අනුව, ඇයගෙන් පිටවෙන රුධිර අඳුරු රත් පැහැයෙන්, උකුවට, යම් ගන්ධයක් සහිත ව තිබේ නම් එය ඔසප් වීමේ කාලයයි. ඊට පසුව, නොනැවතී පිටවෙන රුධිර ඉස්ති හාලාහ්වට අයත් රුධිර ලෙස සලකනු ලැබේ.

නබි (සල්) තුමා ෆාතිමා බින්ත් අබී ජහ්ස් තුමියට මෙසේ පැවසුවේ ය:

"ඔසප් වීම ඇති වී රුධිර පිටවෙන විට එය අඳුරු රත් පැහැයට (ඔසප් වීමෙන් පිටවෙන රුධිර බව) දැනගත හැකිව තිබේනම්: එය පිට වූ විට සලාතයෙන් ඈත් වී (ඉටු නොකොට) සිටින්න. එහෙත්, යම් වෙනසක් ඇතිව රුධිර පිටවූවහොත් වුළු හෙවත් දෝවනය කොට සලාතය ඉටු කරන්න. ඒ මක් නිසාද යත්, එය (පිටවෙන්නේ) රුධිර වාහිනියකින් ය."[53]

3 - **ස්ත්‍රියකට, ඇයගේ ඔසප් වීමෙහි පැහැදිලි කාල චක්‍රයක් ද, ඉහත සඳහන් පරිදි වෙනසක් ද නො පෙනෙයි.** එක ම වර්ගයට අයත් රුධිර පිටවීම හෝ අනියම් ලෙස රුධිර පිටවීම හෝ ඉස්තිහාදහ්වෙන් ඔසප් වීම වෙන්කොට බැලීම දුෂ්කර කාර්යයක් කරයි. මෙම තත්ත්වයෙ හි, නොනැවතී හා කුමක් ද යනු තීරණය කිරීමට නොහැකිව ද රුධිර පිටවීමට ලක්වන ස්ත්‍රියක්, අනෙක් බොහෝ ස්ත්‍රීන් මෙන්, රුධිර පිටවෙන්න පටන්ගත් දින පටන්, දින 6-7 ක් ඔසප් වීමට අදළ දිනයන් මෙන් සැලකිය යුතුය. මේ දිනයන්ට අමතර ව රුධිර පිටවෙන දිනයන් ඉස්තිහාලාහ් ලෙස සැලකිය යුතුය.

---

52. මූලාශ්‍රය: සහීහුල මුස්ලිම්, (ඉංග්‍රීසි), වෙළුම: 1, පි: 189, හදීස් අංකය: 654

53. මෙම හදීසය අබුදවුද්, අන්නසාර් ආදීන් වාර්තා කර ඇත: ඉබ්නු හිබ්බාන්, අල් හාක්කිම් ආදීන් සත්‍ය හදීසයක් බව කියා ඇත. මෙම ග්‍රන්ථයේ කර්තෘ මෙසේ සඳහන් කරයි: "මෙම හදීසය වාර්තා කරන්නන්, විවරණය කරන්නන් ගැන විවේචනයන් ඇතත්, සමහර මුස්ලිම් විශාරදයින් මෙය තමන්ගේ සටහන්වල සඳහන් කිරීම ප්‍රයෝගික ව දක්නට ලැබේ. එහෙයින්, බොහෝ ස්ත්‍රීන් හමුවේ ඇතිවෙන සාමාන්‍ය (එනම් දින හයක් හෝ හතක් වූ) කාලය ගැන සිත යොමු කිරීමට වඩා මෙය යෝග්‍ය වන්නේ ය."

උදාහරණයක් වශයෙන්: ස්ත්‍රියක්, මාසයේ පස්වෙනි දින රුධිර පිටවෙන බව පළමුවෙන් දකියි. එදින පටන් නොකඩවා පිටවෙන රුධිරවල වර්ණය, ගන්ධය හා උකුකම යනාදියෙන් කිසිදු වෙනසක් වටහා ගැනීමට ඇයට අපහසුව ඇත. මෙවැනි අවස්ථාවක, මාස්පතා පස්වෙනි දින සිට දින හයක් හෝ හතක් ඇයට ඔසප් වීම ඇතිවෙන දින ලෙස සැලකිය යුතුය. පහත සඳහන් හදීසය මෙයට සාක්ෂි වෙයි:

"වරක් හම්නාහ් බින්ත් ජහ්ස් (රලි) තුමිය නබි (සල්) තුමා වෙත පැමිණ, "යා රසූලුල්ලාහ් මම අධික ප්‍රමාණයෙන් හා ඉවසිය නොහැකි තරමින් ඔසප් වන තැනැත්තියෙක්මි. ඒ ගැන ඔබතුමා කුමක් සිතන්නේ ද? එය මා සලාතය ඉටුකිරීමෙන් හා උපවාසයේ යෙදීමෙන් වළක්වයි" යනු කීවාය. ඊට පිළිතුරු දුන් නබි (සල්) තුමා,

"ඔබ කපුරෙදි කැබැල්ලක් ආරක්ෂක තුවා වශයෙන් (pad) පාවිච්චි කිරීම යෝග්‍ය බව සඳහන් කරමි. එය ඔබගේ රහස් ප්‍රදේශයේ තබන්න. (එවිට) එය (එහි පිටවෙන) රුධිර උරාගනියි" යනුවෙන් පැවසුවේ ය. එවිට, "ඉතා අධික ව පිටවෙයි!" යයි ඇය කීවාය. මෙම හදීසයේ නබි (සල්) තුමා මෙසේ පැවසුවේය: "මෙය ෂෙයිතාන්ගේ ක්‍රියාවක් වෙයි. එම නිසා, ඔබගේ ඔසප් වීම ඇතිවෙන දින ගණන හයක් හෝ හතක් හෝ බව සලකන්න. එය කුමක් බව තිබිය යුතුද යනු දන්නේ අල්ලාහ් පමණය. පසුව සෝද ගන්න: ඔබ ඉතාමත් පිරිසිදුව සිටින බව වැටහේ නම් දින විසිතුනක හෝ විසි හතරක රෑ දවල්හි සලාතය ඉටුකරන්න: තව ද උපවාසයේ ද යෙදෙන්න. මෙය ඔබට ප්‍රමාණවත් වේ."[54]

නබි (සල්) තුමා මෙහි, 'දින හයක් හෝ හතක්' ලෙස පවසා ඇත්තේ හම්නාහ් බින්ත් ජහ්ස් (රලි) තුමිය තමාට කැමති දිනයක් තෝරාගැනීමට නොවේ. එතුමා එලෙස පැවසුවේ, එතුමිය (අනෙක් ස්ත්‍රීන්ගෙන්) තමාගේ වයසට, ශාරීරික තත්ත්වයට, දූ දරුවන්ගේ ගණනට සමානවන අය සමග තම තත්ත්වය සසඳා බලා ගැනීමට ය. එසේ සසඳ බලනවිට ඇයට සමානවන ස්ත්‍රීන්ගේ ඔසප් වන කාලය දින හයක් නම්, ඇයට ද ඒ සඳහා වූ කාලය දින හයක් බව අදහස් කළ යුතුය: සමහර විට, අනෙක් ස්ත්‍රීන්ට දින හතක් නම් ඇයට ද දින හතක් බව අදහස් කළ යුතුය.

# මුස්තහාලාහ්වට එකඟවන කෙනෙක්

ස්ත්‍රියකගේ යෝනිය තුළින් රුධිර පිටවීමට (ශල්‍යකර්මය-SURGERYවෙනි) යම් යම් හේතු තිබිය හැක. මෙවැනි හේතු දෙකක් සඳහන් කරන්නෙමු:

1 - **ශල්‍ය කර්මයක් කිරීමෙන් පසුව ඇයට ඔසප් වීම ඇතිවිය නොහැක.** ගර්භාශය හෝ එහි ඇති බාධක ඉවත් කිරීම උදාහරණයක් වශයෙන් කිව හැක. මෙවැනි තත්ත්වයක දී ඉස්තිහාලාහ්වට අදළ නීති රීති සුදුසු වන්නේ නැත. මෙහිදී, යම් ස්ත්‍රියකට රුධිර පිටවුවහොත්, කහ පාටට යමක් පිටවීමට අදළ නීතිරීති මෙයට ද සුදුසු වන්නේ ය.* එහෙයින්, ඇය සලාතය ඉටු කිරීම, උපවාසයේ යෙදීම යනාදී නැමදීම්වලින් තමන් ව වළක්වා නොගත යුතුය. එම නැමදීම් තිසි පිළිවෙළට ඉටුකළ යුතුය. ස්ත්‍රියකගේ මෙවැනි තත්ත්වයක, ඇය තම සැමියා සමග සංසර්ගයේ යෙදීම ද තහනම්කොට නැත. තවද, මෙසේ පිටවෙන රුධිර නිසා ම ඇය අනිවාර්ය ජල ස්නානය කිරීමද අවශ්‍යවන්නේ නැත. එහෙත්, ඇය ඉතා හොඳ හැටි සෝද, පිරිසිදු වී, අනිවාර්ය (ෆර්ල්) සලාතයේ වේලාව පැමිණිවිට හෝ අනිවාර්ය නොවන (සුන්නත්) සලාතයන් ඉටුකිරීමට සිතුනුවිට හෝ වුළු දෝවනය කරගෙන සලාතය ඉටුකළ යුතුය.

---

54. අධෝලිපි අංක 50 බලන්න.

* මේ සම්බන්ධ ව ඉහත සඳහන් පිටුවල විස්තරකොට ඇත. බලන්න.

**2 - ශල්‍ය කර්මයෙන් පසුව ඇයට ඔසප් වීම නතර වෙයි. යනු නියත වශයෙන් කිව නොහැක.** ඒ කියන්නේ, ඇයට ඔසප් වීම සිදුවිය හැකි බවය. මෙම අවස්ථාවෙහි දී මුස්ත හලාහ්වට (ඉස්තිහාලාහ්වට ලක්වූ ස්ත්‍රියට) අයත් නීති රීති සුදුසු වන්නේය. ඊට පහත සඳහන් හදීසය සාක්ෂි දරයි.

නබි (සල්) තුමා ෆාතිමා බින්ත් අබී හුබෛෂ් තුමියට මෙසේ පැවසුවේය:

"......... එය රුධිර වාහිනියකින් ය. එහෙයින්, නියම ඔසප්වීම ආරම්භ වුවහොත් සලාතයෙන් ඈත් වී සිටින්න. පසුව, එය (ඔසප් වීම) නතර වූවානම්, ඔබගේ ශරීරයෙන් (තැවරී ඇති) රුධිර ඉවත් වන තෙක් සෝද (හොඳට ජල ස්නානයකොට) ඔබගේ සලාතයන් ඉටු කරන්න."[55]

මෙහි නබි (සල්) තුමා, "නියම ඔසප් වීම ආරම්භ වුවහොත්" යනු සඳහන් කිරීම තුළින් මුස්තහලාහ්වට අයත් ස්ත්‍රියකගේ නීතිරීතීන් (ආරම්භයක් හා නිමාවක් ඇති) ඔසප් වීම සිදුවිය හැකි ශක්‍යතාවක් තිබෙනා ස්ත්‍රියටත් සුදුසු වන බවට පැහැදිලි වෙයි. එහෙත්, ස්ත්‍රියකට නිසියාකාරව ම ඔසප් වීම ඇතිවෙන ශක්‍යතාවක් නැතිවිට, ඇයගෙන් පිටවෙන රුධිර එක් ලේ නහරයකින් බව වෙයි.

## මුස්තහාලාහ්වට අදාළ නීතිරීතීන්

යම් ස්ත්‍රියකගෙන් පිටවෙන රුධිර ඔසප් වීමෙන් ද නැතිනම් ඉස්තිහාලාහ්වෙන් ද යන්න තීරණය කළ යුත්තේ කෙසේදයනු ඉහත බැලුවෙමු. ඔසප් වීමට හා ඉස්ති හාලාහ්වට සුදුසු වන නීතිරීතීන් ඒ ඒ අවස්ථාවන්හි පිටවෙන රුධිරවල ස්වභාවය අනුව රඳා පවතී. ඔසප් වීමට අදාළ නීතිරීති ඉහත බැලුවෙමු. ඉස්තිහාලාහ්වට සම්බන්ධ වූ නීතිරීතීන් පහත සඳහන් ස්ත්‍රීන්ට හැර, පිරිසිදු ස්ත්‍රීන්ට සුදුසු වන ලෙස ම සුදුසු වන්නේය.

1. මුස්තහලාහ්වට අයත් ස්ත්‍රීන් තමන්ගේ එක් එක් සලාතය වෙනුවෙන් වෙන වෙන ම වුළු හෙවත් දෝවනය කිරීම අනිවාර්ය වේ. නබි (සල්) තුමා ෆාතිමා බින්ත් අබී හුබෛෂ් තුමියට නියෝග කළේ එලෙස ය. එතුමා, "පසුව එක් එක් සලාතය වෙනුවෙන් වුළු කරන්න."[56] යනුවය නියෝග කළේ. මෙයින් අදහස් වන්නේ, 'යම් සලාතයකට අදළ නියමිත වේලාව ලඟා වූ විට එම ස්ත්‍රීන් වුළු කළයුතු බවය: ඊට ප්‍රථම (වුළු කිරීම) නොවෙයි' යන්නය.
2. ඇය වුළු කරගැනීමට පෙර ශරීරයේ තැවරී ඇති ලේ පැල්ලම් සේදිය යුතුය. තවද, ඇයගේ රහස් ප්‍රදේශයෙහි රෙදි කැබැල්ලක්, ආරක්ෂක තුවා (pad) තබාගත යුතුය. එමගින් පිටවෙන රුධිර උරා ගනියි.

නබි (සල්) තුමා, හම්නාහ් බින්ත් ජහ්ෂ් තුමියට මෙසේ පැවසුවේ ය:

"ඔබ කපු රෙදි (කැබැල්ලක්) ආරක්ෂක තුවායක් පාවිච්චි කිරීම යහපත් බව උපදෙස් දෙමි. එය ලේ උරා ගනියි." එවිට, ඇය, "ඉතා අධිකව පිටවෙයි" යනු කීවාය. "එසේ නම් (තරමක් ලොකු) රෙද්දක් තියන්න" යනු නබි (සල්) තුමා පැවසුහ. ("එවිටත් අධිකව පිට

---

55. මූලාශ්‍රය: සහීහුල් බුහාරි, (අරාබි-ඉංග්‍රීසි), වෙළුම: 1, පි: 183, හදීස් අංකය : 303
56. මූලාශ්‍රය: සහීහුල් බුහාරි, (අරාබි - ඉංග්‍රීසි), වෙළුම: 1, පි: 149, හදීස් අංකය: 228

වෙයි" යනු එම ස්ත්‍රිය කීවාය. එවිට නබි (සල්) තුමා, "එසේ නම් 'තලජ්ජම්' කරන්න" යනු පැවසූ හ) මෙයින් අදහස් වන්නේ, එම ස්ත්‍රියගේ රහස් ප්‍රදේශයෙන් පිටවෙන රුධිර නවත්වා ගැනීම පිණිස කපු රෙදි කැබැල්ලක් ආරක්ෂක තුවා (pad) තබා, එය තදව තබා ගැනීමට ඉණ වටේ පටියක් දමාගත යුතුය. ඊට පසුව පිටවෙන කිසිවකින් ඇයට කරදරයක් වන්නේ නැත. ෆාතිමා බින්ත් හුබෙස් තුමියට නබි (සල්) තුමා මෙසේ පැවසුවේය. "ඔබගේ සාමාන්‍ය එක් එක් සලාතයක් වෙනුවෙන් සෝද වුළු කරගෙන සලාතය ඉටුකරන්න. එවිට කලාලයේ ලේ බිංදු වැටුණත් (ප්‍රශ්නයක් නොමැත)."*

3. සංසර්ගයේ යෙදීම: මෙයට අනුමතිය දීමෙහි විශාරදයින් අතර මතභේද ඇත. ඉතාමත් හරි මතය නම් 'එයට අනුමතිය ඇත' යන්නය. කෙසේද යත්, බොහෝ (දහ දෙනෙක් හෝ ඊටත් වැඩි) ස්ත්‍රීන් නබි (සල්) තුමාගේ කාලයේම 'ඉස්තිහාලාහ්' ව ඇතිව සිටිය හ. එවැනි තත්ත්වයකදීත් අල්ලාහ් හෝ ඔහුගේ වක්තෘ (නබි) තුමා හෝ ඔවුන් තම සැමියන් සමග සංසර්ගයේ යෙදීම වැළැක් වූයේ නැත.

අල්ලාහ් පවසන්නේ මෙසේ ය:

﴿ فَاعۡتَزِلُواْ ٱلنِّسَآءَ فِي ٱلۡمَحِيضِ ﴾ [ البقرة ، الآية ٢٢٢ ]

**"මාස් ශුද්ධි කාලයේ ඔවුන්ගෙන් ඈත් වී සිටින්න."**

**(අල් කුර්ආන් 2:222)**

ස්ත්‍රීන් ඔසප් වී සිටියදී සංසර්ගයේ යෙදීමෙන් ඈත් වී සිටීම අනිවාර්ය බවට පෙන්වන සාක්ෂිය මෙයයි. ඉස්තිහාලාහ් ව ඇත්තාවූ ස්ත්‍රීන්ට සලාතය ඉටුකිරීමට අවසර දී ඇතිහෙයින්, එම තත්ත්වයේ ඔවුන් සමග සංසර්ගයේ යෙදීම ද කිසිදු ප්‍රශ්නයක් නොමැත. ඔසප් වී සිටියදී සංසර්ගයේ යෙදීම වළක්වාලන ලෙස 'කියාස්'** අනුව තීරණය ගැනීම වැරදිය. ඊට හේතුව අවස්ථා දෙකක් එක වගේ නොතිබීමය. 'කියාස්' වෙතින් වූ නිගමනයක් අනුව ගනු ලබන තීරණයන්, වෙනස් වූ තත්ත්වයන් පවත්නා කල්හි අවලංගු වන්නේ ය.

---

* මෙය ඉමාම් අහ්මද්, ඉබ්නු මාජාහ් යන්නවුන් වාර්තා කරති.

** 'කියාස්' යනු කුමක්ද යනු නිසිලෙස වටහා ගැනීමට අධෝ ලිපි අංක 15 කියවන්න.

# 6

# නිෆාස් යනු කුමක් ද?

**නිෆාස්:** ගර්භණී ස්ත්‍රියකගේ දරු ප්‍රසූතියට සම්බන්ධව පිටවෙන රුධිරවලට 'නිෆාස්' යනු කියනු ලැබේ. මෙය දරු ප්‍රසූති සමයෙහි හෝ ඊට පසුව හෝ ඊට පෙර (දින දෙක තුනකට පෙර ප්‍රසූතියේ වේදනාව ඇතිවිට) හෝ පිටවිය හැකිය. සෙයිකුල් ඉස්ලාම් ඉබ්නු තෙමියියාහ් (රහ්) තුමා, "ස්ත්‍රියකට ප්‍රසූතියේ වේදනාවත් සමග රුධිර පිටවුවහොත් එය නිෆාස් වෙයි. එය දින දෙක තුනකට කියා සීමාකොට නැත. මෙම ප්‍රසූති වේදනාව ප්‍රසූතිය දක්වාම දික් ගැසෙයි. එසේ නැතිවිට පිටවූ රුධිර නිෆාසයට සම්බන්ධ නොවෙයි" යනු පවසා ඇත.

මෙය (නිෆාසය) පවත්නා කාල සීමාවක් තිබේද යන්නෙහි විද්වතුන් අතර මත භේද තිබේ. සෙයිකුල් ඉස්ලාම් ඉබ්නු තෙමියියාහ් (රහ්) තුමා මෙසේ පැවසුවේය:

"නිෆාසයට අඩු හෝ වැඩි කාලයක් යනු යම් සීමාවක් නැත. ස්ත්‍රියක් තමාට දින හතළිහකට, හැටකට හෝ හැත්තෑවකට අධික කාලයක් රුධිර පිටවෙනවා දකියි: පසුව එය නවතියි. මෙසේ පිටවෙන ලේ නොනැවතී යයි නම්, එවිට එයට නිෆාස් වශයෙන් දින හතළිහක සීමාවක් තබනු ලැබේ. මෙයට හේතුව, බොහෝ ස්ත්‍රීන් සාමාන්‍යයෙන් ගෙවන කාල ප්‍රමාණය මෙය වීමය."

මෙම ග්‍රන්ථයේ කර්තෘ මෙසේ පවසයි:

"ඉහත සඳහන් පරිදි ස්ත්‍රියකට දින හතළිහකට අධික කාලයක් රුධිර පිටවෙන බව සිතමු. එවැනි අවස්ථාවකදී (පසුගිය ප්‍රසූතියන් හෝ වෙනත් සලකුණු අනුව) ඇයගේ රුධිර පිටවීම නැවතෙන යම් යම් ලකුණු දකින්නට ලැබෙයි නම්, එය නැවතෙනතෙක් ඇය සිටිය යුතුය. ස්ත්‍රියකට මෙවැනි ලකුණු කිසිවක් නොපෙනුණු කල්හි, බොහෝ ස්ත්‍රීන්ගේ තත්ත්වය අනුව දින හතළිහක් සම්පූර්ණ කොට, (ජල ස්නානය කර) පිරිසිදු විය යුතුය.

අනෙක් පැත්තෙන්, එම දින හතළිහ සම්පූර්ණ කිරීමත් සමගම ඇයට ඔසප් වීම ඇතිවුවහොත් එය නවතින තෙක් ඇය ඉවසීමෙන් සිටිය යුතුය. එහෙත්, ඇයගේ නියම ඔසප් වීමේ කාලයත් ඉක්මවා රුධිර පිටවීම සිදුවේ නම්, එවිට ඇය 'මුස්තහාලාහ්' ව සිටින බව සැලකිය යුතු ය. මෙකල්හි ඇය ඉස්තිහාලාහ්වට අයත් නීති රීති පිළිපැදිය යුතුවේ!"

සමහර විට, සාමාන්‍ය වශයෙන් ගණන් ගත් දින හතළිහට පෙර ඇයගේ නිෆාසය නැවතී, පිරිසිදු ස්ත්‍රියක් වන්නේ නම්, නොපමාව ජල ස්නානය කර සලාතය ඉටු කිරීමටත්, උපවාසයේ යෙදීමටත් පුළුවන. තවද ඇය තම සැමියා සමග සංසර්ගයේ යෙදීමට ද, පුළුවන. එක් දිනකටත් වඩා අඩු කාලයක් ඇයගේ රුධිර පිටවීම නැවතීමෙන් ඇය පිරිසිදු වූ බව අදහස් කළ නොහැක. (මෙය අල් මුඃනීයෙහි සඳහන් පරිදි ඇති අදහසකි.)

ස්ත්‍රියක් පැහැදිලි ශාරීරික ලක්ෂණ ඇති මිනිස් ජීවයක් ප්‍රසූති කරනතෙක් ඇයගේ නිෆාසය ස්ථිර කළ නොහැකිය. ඉතා කුඩා ශරීරයක් ලැබුනේ ද, එය වැඩුනු මිනිස් ජීවයක ලක්ෂණයන් පැහැදිලි ව නොපෙන්වන්නේ නම් (භ්‍රෑණ උපතක් නම්) ඒ සමග පිටවුන රුධිර නිෆාසයට අයත් බව කිව නොහැක. එය 'ඉර්ක්' (Irq) රුධිර (ලේ නහරයකින් පිටවුන ලේ) බව කිව යුතුය. මිනිස් ජීවයක් ගර්භාශය තුළ පිළිසිඳගෙන වැඩීමට, එය පිළිසිඳගත් දින පටන් අඩු වශයෙන් දින අසූවක් වෙයි: වැඩිම වුනොත් එය දින අනූවක් වෙයි.

අල් මුජ්ද් ඉබ්නු තෛමියියාහ්[57] මෙසේ පවසා ඇත: "සමහරවිට ඇය දින 80/90 කට පෙර වේදනාවෙන් යුතුව රුධිර පිටවෙන බව දුටුවහොත් ඒ ගැන කල්පනාව යොමු කළ නොයුතුයි. (ඇය පිරිසිදු වී සලාතය ඉටු කිරීම, උපවාසයේ යෙදීම යනාදියෙන් ඈත් වී සිටිය යුතුය. කෙසේ වෙතත්, ඇය තමාගේ ළදරුවා ප්‍රසූති කළවිට, එය වැඩුණු මිනිස් ජීවයක හැඩරුව ගෙන සිටියේ නම්, එකල්හි (80/90 දිනට පෙර වූ) ඇයගේ රුධිර පිටවීම නිෆාස් බව අදහස්කොට, ඇයට අතහැරුණු සලාත්, උපවාසය යනාදිය ඌණ පූර්ණ කිරීම සඳහා නැවත ඉටුකළ යුතුය. සමහර විට, එසේ ඉපදුණු ළදරුවා වැඩුණු මිනිස් ජීවයක හැඩරුව නොපෙන්වන්නේ නම්, එවිට ඇයගේ රුධිර පිටවීම නිෆාස් බව අදහස් කළ නොහැක: අතහැරුණු සලාත් හා උපවාසයන් ඌණ පූර්ණ කිරීම සඳහා නැවත ඉටුකිරීම ද අවශ්‍ය වන්නේ නැත.

# නිෆාසයට අදාළ නීතිරීති

පහත සඳහන් හේතු හැර, නිෆාසයට අදාළ නීතිරීති ඔසප් වීමට අදාළ නීතිරීති හා සමානය.

1 - ඉද්දව නිෆාසයට සම්බන්ධ වූවක් නොවේ. එහෙත්, දික්කසාදයට අදාළ නීතිරීති සමග සම්බන්ධ වූවකි. උදාහරණයක් වශයෙන්: 'තලාක්' (දික්කසාදය) දරු ප්‍රසූතියට පෙර දැන්වූවහොත්, ඉද්දව එම ප්‍රසූතියත් සමග නිමවෙයි. ඒ හැර, එයට නිෆාසයේ කාලය සමග කිසිදු සම්බන්ධයක් නැත. සමහර විට තලාක් (දික්කසාදය) ප්‍රසූතියට පසුව දැන්වූවහොත්, ඇය තමාගේ ඔසප් වීම ඇතිවෙනතුරු බලාපොරොත්තුව සිට ඒ අනුව මින් ඉහත විස්තර කළ පරිදි ඉද්දව ගණන් බැලිය යුතුය.

2 - 'ඊලාඃ' වේ කාලය. 'ඊලාඃ' යනු යම් ස්වාමි පුරුෂයෙක් කාල සීමාවක් නොමැතිව (නැතිනම් මාස හතරකට අධික ව) තම භාර්යාව සමග සංසර්ගයේ නො යෙදෙන බවට දිවිරීම වෙයි. මෙවැනි අවස්ථාවකදී එම භාර්යාව සංසර්ගයේ හැසිරිය යුතු බවට බලකරන්නේ නම්, එම ස්වාමි පුරුෂයා දිවුරුම් දුන් දින සිට මාස හතරක් ඒ සඳහා නියම කළ යුතුය. මෙම කාල සීමාව නිමවූවායින් පසුව (මුස්ලිම් විනිශ්චය කාරයෙකු විසින්) ඔහුගේ භාර්යාව සමඟ සංසර්ගයේ යෙදෙන ලෙස හෝ ඔහුගේ භාර්යාව අයැද සිටින වෙන්වීම ඉටුකරන ලෙස හෝ නියෝග කරනු ලබයි. නිෆාසයේ කාලය ඊලාඃ වේ කාලය ලෙස ගණන් බලනු නොලැබේ. එහෙයින්, මෙම කාල සීමාව තුළ භාර්යාවට නිෆාස් ඇතිවූවහොත්, එයින් පිරිසිදුවන කාලයට සමාන කාලයක් ගණන් බලා ඊලාඃ වේ කාලය සමග එකතු කරනු ලැබේ. මෙය ඔසප් වීමට වඩා වෙනස් වූවකි. එහෙයින්, මෙයට අදාළ කාලය ඊලාඃ වේ කාලය සමග එකතුකර ගණන් බලනු ලැබේ.

3 - වැඩිවියට පත්වීම: නිෆාසය ගැබ් ගැනීමට සම්බන්ධ වූවක් බව පැහැදිලිය. ස්ත්‍රියකට ඩිම්බ කෝෂයෙන් ඩිම්බ මෝචනය වන තත්ත්වය ඇතිවීමට පෙර ගැබ් නොගනියි. (නිෆාසය නොව) ඔසප් වීම, ස්ත්‍රියක් වැඩිවියට පත්වූ බව හඟවයි.

---

57. අල් මුජ්ද් ඉබ්නු තෛමියියා: මෙතුමා ප්‍රකට ඉස්ලාමීය විශාරදයෙකි.

4 - සමහර විට, නිෆාසයට අදළ රුධිර පිටවීම දින හතළිහක් තුළ නැවතී, නැවත හතළිස්වෙනි දින පිටවෙන්නේ නම් එයට කුමක් කිව යුතුද යන ප්‍රශ්නයක් මතුවෙන්න පුළුවන. ඔසප් වීම තුළින් පිටවෙන රුධිර වලට වෙනස් [58] වූ අන්දමින් පිටවෙන මෙය 'සැක සහිතය' යන මතය හනබිලාහ් විශාරදයින්ගේ ප්‍රකට පැවසීම් තුළින් වූවකි. ඔවුන්ගේ මතය අනුව ඇය නියමිත කාලයන්හි සලාතය, උපවාසය යනාදිය ඉටුකළ යුතුය. අනිවාර්ය කාර්යයන් හැර වෙනත් කිනම් කාර්යයන් ඔසප් වීම ඇතිවූ කාලයේ යම් ස්ත්‍රියකට තහනම්කොට ඇත්තේද ඒ සෑමකාර්යයක් ම මෙම ස්ත්‍රියට ද තහනම් වේ. ඔසප් වීම ඇති වූ ස්ත්‍රිය කිනම් කාර්යයන් සඳහා ඌණ පූර්ණ කරන්නේද, එම සෑම කාර්යයන් වෙනුවෙන්ම මෙම ස්ත්‍රියද ඌණ පූර්ණ කළයුතු වේ.

මෙම ග්‍රන්ථයේ කර්තෘ මෙසේ කියයි: "නිෆාසයේ කාලය යනු සඳහන් කරනු ලබන කාලය තුළ නැවතත් රුධිර පිටවෙන්නේ නම් එය ඇයගේ නිෆාසයට අදළ රුධිර වේ. එසේ නැතිවිට, එය ඔසප් වීමේ රුධිර වේ. එහෙත් එය නොනැවතී පිටවෙන්නේ නම්, එවිට එය ඉස්තිහාලාහ් ලේ බව අදහස් වෙයි." මෙම මතය අල් මුෘනිහි* සඳහන් වන මතයට සමීප වූවකි. ඉමාම් මාලික් (රහ්) තුමා පැවසූ බව මෙම ග්‍රන්ථයෙහි මෙසේ සඳහන්කොට ඇත. "ඇයගේ රුධිර පිටවීම නැවතී, දින දෙක තුනකට පසුව නැවතත් පිටවෙයි නම් එය නිෆාසයේ රුධිරය වේ; නැතහොත්, එය ඔසප් වීමේ රුධිරය වේ" සෙයිකුල් ඉස්ලාම් ඉබ්නු තෛමියියාහ් (රහ්) තුමාගේ තේරීම ද මෙම මතය ම වෙයි.

ඇත්තෙන් ම, මෙම රුධිර සම්බන්ධව 'සැකය' යනු කියා යමක් තිබිය නොහැක. එනමුත්, මිනිසුන්ගේ ඥානය, වටහා ගැනීම යනාදිය පදනම්කොට ගෙන මේ ගැන විවිධ අදහස් ඔවුන් තුළ ඇත. අල්ලාහ් අනාවරණය කළ අල්කුර්ආනය, ඔහුගේ නබි මුහම්මද් (සල්) තුමාගේ සුන්නාහ් ව යනාදිය සියලු දෙයක් ගැනම නිසි ලෙස වටහා ගැනීමේ හා විස්තර ලබාගැනීමේ මූලාශ්‍රයන් වන්නේ. උපවාසයේ යෙදීම, තවාෆය ඉටුකිරිම යනාදී කර්තව්‍යයන් **ඔවුන් ජීවේදී පළමු වතාවට යම් වැරදීමක්** ඇතිවූවහොත් හැර එම කර්තව්‍යයන් දෙවරක් ඉටුකරන ලෙස අල්ලාහ් නියෝගකොට නොමැත. තවද, එම කර්තව්‍යයන් නැවත ඉටුනොකර එහි වූ වැරදි නිවැරදි කිරීමට ද නුපුළුවන.

එහෙත්, කවරෙකු හෝ වේවා ඔහුගේ/ඇයගේ ශක්තියේ තරමට ඔවුන්ට අනිවාර්ය වූ නැමදුම් හා අනෙකුත් ක්‍රියාවන් ඉතා යහපත් ව ඉටුකරන්නේ නම්, ඔහු/ඇය තමාගේ වගකීමෙන් නිදහස් වන්නේය.

අල්ලාහ් මෙසේ පවසයි :

﴿ لا يُكَلِّفُ اللهُ نَفْساً إِلاَّ وُسْعَهَا ﴾ [ البقرة ، الآية ٢٨٦]

**"කිසිදු මනුෂ්‍යයකුට දැරිය නොහැකි අන්දමේ බරක් අල්ලාහ් නොපවරයි."**

(අල් කුර්ආන් 2:286)

---

58. ඔසප් වීමෙන්, ලේ පිටවී නැවතුණු පසුව නැවතත් පිටවෙයි නම්, එය නියත වශයෙන් ම ඔසප්වීමේ ලේ වෙයි. උදහරණයක් වශයෙන්: ස්ත්‍රියක් මාස්පතා දින අටක් ඔසප් වීම ඇතිව සිටියි. ඇයට ලේ පිටවීම හතරවෙනි දින සිට දින දෙකකට නැවතුණු බව ඇය කියයි. පසුව හත්වෙනි අටවෙනි දිනයන් හි නැවත ලේ පිටවෙන්න පටන් ගනියි. මෙලෙස නැවත පිටවෙන ලේ නියත වශයෙන් ම ඔසප් වීමේ ලේ වෙයි.

* වෙළුම : 1, පි: 349

නැවතත්, අල්ලාහ් පවසයි:

[التغابن، الآية ١٦] ﴿ فَاتَّقُوا اللَّهَ مَا اسْتَطَعْتُمْ ﴾

**"එහෙයින්, ඔබට හැකි පමණින් අල්ලාහ්ට බිය (භක්ති) ව ජීවත් වන්න."**

(අල් කුර්ආන් 64:16)

5 - නිෆාසයට අදළ කාලය යනු ගණන් ගත් දින හතළිහට පෙර පිරිසිදු වන යම් ස්ත්‍රියක් සමග සංසර්ගයේ යෙදීම ගැන ඇති මතය කුමක්ද? ඔසප්වීම සම්බන්ධ ව, යම් ස්ත්‍රියකට සාමාන්‍යයෙන් ඔසප් වීම ඇතිව තිබෙනා කාලයට පෙර ඇය පිරිසිදුවන්නේ නම්, ඇය සමග සංසර්ගයේ යෙදීමට අවසර ඇත. නමුත්, නිෆාසය සම්බන්ධව හන්බලි මදහබයේ පැහැදිලි මතය අනුව සංසර්ගයේ යෙදීමට කැමැත්තක් දක්වා නැත.

මේ සම්බන්ධ ව ඇති නිවැරදි මතය නම් මෙයට අකැමැත්තක් නොමැති බවය. මෙය ද බොහෝ මුස්ලිම් විශාරදයින්ගේ මතය වෙයි. යමක් සම්බන්ධව කැමැත්තක් නැති බව නම්, ඊට ඉස්ලාමීය නීතිරීතීන් තුළින් සාක්ෂි අවශ්‍ය වන්නේ ය. මේ සම්බන්ධව ඉමාම් අහ්මද් තුමා වාර්තා කරන පහත සඳහන් දෑ හැර වෙනත් සාක්ෂි කිසිවක් නොමැත.

එතුමා වාර්තා කරන්නේ මෙයයි:

"අබී අල් ආස්ගේ පුත් උස්මාන් වෙත ඔහුගේ භාර්යාව, ඇයගේ (නිෆාසයේ) දින හතළිහේ කාල සීමාව සම්පූර්ණ වීමට පෙර ඔහු වෙතට සමීපවෙයි. එවිට, ඔහු (ස්වාමි පුරුෂයා වන උස්මාන්) "එපා!" යනු කීවේය.

මෙම සිද්ධිය, එම ස්ත්‍රියගේ ක්‍රියාව ඇයගේ ස්වාමි පුරුෂයා විසින් එකහෙළාම ප්‍රතික්ෂේප කළ බවට පැහැදිලි සාක්ෂියක් ලෙස නොපෙනෙයි. ඔහු එලෙස කීමට, ඇය නිෆාසයෙන් පිරිසිදු වූයේ ද නැද්ද යනු නොදන්නවා විය හැකි බව සිතන්නට ඇත: නැතහොත්, ඇය සමග සංසර්ගයේ යෙදීමෙන් නැවතත් රුධිර පිටවෙන්න පුළුවන් බව සිතන්නට ඇත: නැතහොත් වෙනත් හේතුන් තිබිය හැකිය. අල්ලාහ් සර්වඥ වේ.

**7**

# ඔසප් වීම වැළැක්වීම: උපත් පාලනය හා ගබ්සාව

ඔසප් වීම වළක්වාලීමට යම් යම් උපක්‍රම යෙදීම කොන්ද්සි දෙකකින් යුතුව අනුමත කළ හැක.

**පළමුවැනි කොන්ද්සිය :**

ස්ත්‍රියට එයින් හානියක් නොවිය යුතුය.

අල්ලාහ් මෙසේ පවසයි :

﴿ ولا تُلْقُوا بِأَيْدِيكُم إِلَى التَّهْلُكَةِ ﴾ [ البقرة ، الآية ١٩٥]

**"තවද, ඔබගේ ම දැතින් ඔබගේ විනාශය හැඩ ගස්වා නොගන්න"**

**(අල් කුර්ආන් 2:195)**

නැවතත්, අල්ලාහ් පවසයි:

﴿ وَلاَ تَقْتُلُوا أَنْفُسَكُمْ إِنَّ اللهَ كَانَ بِكُمْ رَحِيماً ﴾ [ النساء ، الآية ٢٩]

**"තව ද, ඔබව ඔබ විසින් ම නොමරා ගන්න;නියත වශයෙන් ම දැනගන්න: අල්ලාහ් ඔබ කෙරෙහි අපමණ කරුණාවක් දක්වන්නේ ය."**

**(අල් කුර්ආන් 4:29)**

**දෙවෙනි කොන්දේසිය :**

සමහර විට ඔසප් වීම වළක්වන උපකරණ භාවිතා කිරීමෙන් කිසියම් මාර්ගයකින් ස්වාමි පුරුෂයාට අවහිරයක් ඇතිවේ නම්, එවිට ඔහුගේ අනුමැතිය ලබාගැනීම අනිවාර්ය වේ.

උදාහරණයක් වශයෙන්, ස්ත්‍රියක් ඉද්දවේ පසුවෙන බව සිතමු. එම කාලය තුළ ඇයගේ වියහියදම්, ඇයගේ ස්වාමි පුරුෂයා විසින් දැරිය යුතුය. මෙම අවස්ථාවේහිදී ස්වාමි පුරුෂයාගෙන් අධික මුදල් ලබාගැනීමේ චේතනාවෙන් (ඔසප් වීම වළක්වන දේ භාවිතා කර) ඉද්දව දීර්ඝ කිරීමට අනුමතිය නැත. ඇය මේ සම්බන්ධව ඔහුගේ අනුමැතිය ලබාගත යුතුය. එමෙන් ම, ඔසප් වීම වළක්වන දේ භාවිතා කිරීමෙන් යම් ස්ත්‍රියක් පිළිසිඳ නොගන්නා බවට බියක් ඇත්නම්, එවිට ද ස්වාමි පුරුෂයාගේ අනුමැතිය නොමැති ව එවැනි දේ භාවිතා කිරීම අනුමත කළ නොහැකිය.

එහෙයින්, ඉහත සඳහන් කොන්දේසිවලට එකඟව හැර ඔසප්වීම වළක්වන උපකරණ භාවිතා නොකර සිටීම යහපත් වේ. තව ද, මේ සඳහා සැබවින් ම අවශ්‍යතාවක් ඇත්තේ නම් ස්ත්‍රියගේ සෞඛ්‍යය, ආරක්ෂාව යනාදිය සිතට ගෙන හැකි පමණින් ස්වභාවික වූ ක්‍රමයන් පිළිපැදිය හැකි ය.

**ඔසප් වීම ඇතිවීම පිණිස බෙහෙත් භාවිතා කිරීම කොන්දේසි දෙකකින් යුතුව අනුමත කළ හැකිය.**

**පළමුවන කොන්දේසිය :** මෙය අයුතු ලෙස පාවිච්චි නොකළ යුතුය. උදහරණයක් වශයෙන්, ස්ත්‍රියක් තමාට අනිවාර්ය වූ නැමදීම වලින් ඈත් වී සිටීමට මෙය පාවිච්චි නොකළ යුතුයි. රාමලාන් මාසය ළඟාවන විට, එම මාසයෙහි උපවාසයේ යෙදීම, සලාතය ඉටු කිරීම වැනි අනිවාර්ය කර්තව්‍යයන්ගෙන් ඈත් වී සිටීමේ චේතනාවෙන් යුතුව ඔසප් වීම ඇතිවීම පිණිස යම් බෙහෙතක් භාවිතා කිරීම සඳහන් කළ හැකිය. මෙය කොහෙත් ම නොකළ යුත්තකි, දෙනු ලැබූ අනුමැතිය අයුතු ලෙස භාවිතා කිරීමක් වන්නේ ය.

**දෙවෙනි කොන්දේසිය :** ස්ත්‍රියක් ඔසප් වීම පිණිස බෙහෙත් භාවිතා කරන බව සිතා ගනිමු. එයින්, ඔසප් වීම ඇති වී ඇයගේ ස්වාමි පුරුෂයා ඇය සමඟ සම්පූර්ණ සතුට භුක්ති විඳීමට එය අවහිරයක් වේ නම්, එවිට එවැන්නක් භාවිතා කිරීමට ඇය තම ස්වාමි පුරුෂයාගේ අනුමැතිය ලබාගත යුතුය. තව ද, ඇය දික්කසාද වී ඇත්තේ නම්, මෙවැනි යමක් භාවිතා කිරීමෙන් ඇයගේ ස්වාමි පුරුෂයා ඇය වෙත පැමිණීමට ඇති අයිතිවාසිකම් සීඝ්‍රයෙන් නැති වී යයි. හේතුව, මෙවැනි දේ භාවිතා කිරීම තුළින් ඉද්දව සීඝ්‍රයෙන් නිමාවට පත් වීම ය. ඉද්දවේ කාල සීමාව තුළ ස්වාමි පුරුෂයෙක් තම භාර්යාව වෙත ආපසු එන අන්දමේ දික්කසාදයක් පවසා ඇත්තේ නම්, ඒ අනුව, ඉද්දව නිම වීමට පෙර එම ස්වාමි පුරුෂයාට තම භාර්යාව වෙත පැමිණීමේ අයිතිවාසිකමක් ඇත.

# උපත් පාලන ක්‍රමයන් අනුගමනය කිරීමේ අවශ්‍යතාවය

**පළමුව** : ගැබ් ගැනීම සම්පූර්ණයෙන් ම වළක්වාලීම. මෙයට අනුමැතිය නොමැත.
මෙයට හේතුව වනුයේ:

අ) මෙය මුස්ලිම් ජනගහනයේ වර්ධනය අඩුකරයි. ඉස්ලාමීය ෂරීඅතයේ අරමුණ මුස්ලිම්වරුන්ගේ ජනගහනය වර්ධනය විය යුතුයි යන්නයි.

ආ) ස්ත්‍රියකට, තමාගේ දූ දරුවන් සියල්ලෝම නොමැරී ජීවත් වෙයි යනු ස්ථිරවම කීමට අපහසුය. මෙවැනි අවස්ථාක දී ඇය නිත්‍ය වශයෙන් ගැබ් ගැනීම නතර කරගතහොත් ඇයට දූ දරුවන් නැතිව ම මැරෙන්නට සිදුවිය හැකිය.

**දෙවනුව : තාවකාලික ව ගැබ් ගැනීම වළක්වාලීම.** කීප වරක් ම ගැබ් ගත් ස්ත්‍රියක්, නැවතත් ගැබ් ගැනීමෙන් දුර්වල තත්ත්වයකට පත්වෙන බව හැඟෙන්නේ නම්, එවැනි අවස්ථාවකට මෙය සුදුසු වන්නේ ය. තවද, ස්ත්‍රියක් තමාගේ ගැබ් ගැනීම අවුරුදු දෙකකට වරක් බැගින් ක්‍රමවත් බවට තබා ගන්න අධිෂ්ඨාන කොට, ඇයගේ සැමියා ද එයට අවසර දුන්නේ නම්, තව ද ඇය අනුගමනය කරන්න යන උපත් පාලන ක්‍රමයන්ගෙන් ඇයට හානියක් නැති බව වැටහෙන්නේ නම්, ඇයට ඒ සඳහා අනුමැතිය දිය හැකිය. සහාබාවරු (නබිතුමාගේ මිතුරෝ) තමාගේ ශුක්‍ර ධාතු තම භාර්යාවන්ගේ යෝනිය තුලට ප්‍රවිෂ්ඨ වීම වැළැක්වූහ.[59](මෙය අරාබියෙන් අස්ල් යනුවෙන් හැඳින්වේ.) නබි (සල්) තුමා, මොවුන් මෙසේ කිරීම වැළැක්වූයේ නැත. යම් කෙනෙක් තම භාර්යාව සමග සංසර්ගයේ හැසිරෙන සමයෙහි ධාතු පිටවෙන්න යන බව හැඟෙන කළ තම ශිශ්නය ඇයගේ යෝනියෙන් පිටත ගෙන, ධාතු පිට කිරීමට මෙසේ කියනු ලැබේ.

---

59. ජාබිර් (රලි) තුමා මෙසේ වාර්තා කළේය: අපි නබි (සල්) තුමා ජීවතුන් අතර සිටිය කල්හි අස්ල් කිරීම ක්‍රියාත්මක කෙළෙමු."
මූලාශ්‍රය – සහීහුල් බුහාරි (අරාබි-ඉංග්‍රීසි), වෙළුම:7,පි:102

**ගබ්සා කිරීම : මෙය කොටස් දෙකකට වර්ග කළ හැකිය.**

පළමුව : මවකගේ ගර්භාෂය තුළ ඇති කළලය ඉවත් කිරීමට සිතීම. ගර්භාෂය තුළ ඇති කළලයට හුස්ම දුන්[60] පසුව මෙසේ කිරීමට අදහස් කරන්නේ නම්, එය නීති විරෝධී ක්‍රියාවන් බවට කිසිදු සැකයක් නොමැත. හේතුව, එක් ජීවයක් මැරීමේ (නැති කිරීමේ) භයානක ක්‍රියාවක් වීමය. [61] මෙය කුර්ආන්, සුන්නාහ්, ඉජ්මාඃ ආදියේ අදහසට අනුකූල වූ අදහස වේ.

සමහර විට, ගර්භාෂය තුළ ඇති කළලයට හුස්ම දීමට පෙර ගබ්සා කරනු ලබන්නේ නම්, එය අනුමත කළ හැකි බව සමහර විද්වතුන් පවසයි, තවත් සමහරු එය අනුමත නොකරයි. තවත් විද්වතුන් සමහරෙක් එය අලකා (ලේ කැටියක්) ව ඇතිහෙයින් ගබ්සා කිරීමට අනුමත කළ හැකි බව පවසයි. ඒ නම්, ගැබ්ගෙන දින හතළිහකට අඩු කාලයක් ව තිබිය දී එය අනුමත කළ හැකි බව ඔවුන්ගේ මතය වේ. එහෙත්, තවත් සමහරුන්ගේ මතය අනුව කළලය මිනිස් හැඩරුව නොලබනතෙක් මෙය අනුමත කළ හැකි බව පවසයි. කෙසේ වෙතත්, සාධාරණ හේතුන් නොමැති ව කළලය නැතිකිරීමෙන් වැළකී සිටීම යහපත් වේ. උදාහරණයක් වශයෙන්, යම් මවක් ගර්භණියව සිටින්න බැරි තරම් අසනීප ව සිටින්නේ නම්, ඇයගේ කළලය මිනිස් හැඩ රුව ලබා නැති විට, එය නැති කිරීම අනුමත කළ හැකිය. අල්ලාහ් සර්වඥ හා ඥානී වේ.

**දෙවනුව : ගර්භ බීජය නැති කිරීමේ චේතනාව නොවීම.**

ස්ත්‍රියක් ගැබ්ගෙන එහි අවසානයෙහි, ප්‍රසූතියේ සමයෙහි දී මවටත් සිහිති ජීවයටත් හානියක් නොවන සේ ද, ශල්‍ය කර්මයක අවශ්‍යතාවය නොමැති විට ද ඉතා ප්‍රවේශමෙන් කටයුතු කිරීම අනුමත කොට ඇත. සමහර විට ශල්‍ය කර්මයක් අවශ්‍යවුවහොත් ඒ සඳහා අපගේ අවධානය යොමු කළයුතු කරුණු හතරක් ඇත.

අ) මව හා ඇගේ ගර්භාෂයය තුළ ඇති නූපන් දරුවා ද ජීවත් ව ඇත්නම් : මෙවැනි අවස්ථාවක ඇත්තෙන්ම ශල්‍ය කර්මයක් අවශ්‍යවුවහොත් පමණක් එය අනුමත කළ හැක. උදාහරණයක් වශයෙන්, දරු ප්‍රසූතියෙහි යම් කරදරයක් ඇතොත් මෙයට අනුමැතිය දිය හැකි ය. හේතුවඃ ශරීරය භාරකාරත්වයෙන් යුත්තකි. එහෙයින්, මහත් යහපතක් උදෙසා හැර උවදුරකට මග පෑදීම නොකළ යුතුය.

---

60. අබ්දුල්ලාහ් ඉබ්නු මස්ඌද් (රලි) තුමා මෙස් වාර්තා කළේයඃ සත්‍යය කෙරෙහි අනුග්‍රහය ලත් නබි (සල්) තුමා පැවසුවේය : (යම් බීජයක හැඩරුවෙන්) ඔබ සෑවොම ඔබගේ මවගේ ගර්භාෂය තුළ දින හතළිහක් රැස්කොට තබනු ලැබිය. පසුව, ඊට සමාන වූ (දින හතළිහක) කාලයක් තුළ ලේ කැටියක් ලෙසට පත් කරනු ලැබේ. පසු ව, ඊට සමාන වූ (දින හතළිහක) කාලයක් තුළ මාංශ කැබෙල්ලක් ලෙසට පත් කරනු ලැබේ. (එයට හුස්ම පිඹින) මලක්වරයෙක් අල්ලාහ් විසින් යවනු ලැබේ. මෙම හදීසය මුස්ලිම්, බුහාරි යනාදී ග්‍රන්ථයන්හි සඳහන් වී ඇත. කවරෙක් එයට පණ පිඹින්නේද" නම් වූ කොටස මුස්ලිම් හි සඳහන් වෙයි. (සහීහුල් බුහාර්, වෙළුම:8, පි:387, හදීස් අංකය:593)

61. මෙම ග්‍රන්ථයේ කර්තෘ මේ ගැන තවත් ග්‍රන්ථ සමහරෙක සඳහන් කොට ඇත්තේය. ඔහුගේ අල් ෆතාවා අත්තිශාඉයියාහ් නම් වූ ග්‍රන්ථයේ 54 හා 55 වෙනි පිටුවල මෙසේ සඳහන් කරයිඃ මෙය තහනම් කරන ලද ක්‍රියාවකි. තව ද, මෙම සමාජය වර්ධනය විය යුතුයි" යන නබී (සල්) තුමාගේ මතයට ද මෙම ක්‍රියාව විරුද්ධ ය. මෙය මුස්ලිම්වරුන් දුර්වල තත්ත්වයකට ගෙන අවුත් නින්දවට පත්කරන හේතුන් වලින් එකකි. මුස්ලිම්වරුන්ගේ ජනගහනය වර්ධනය වන විට ඔවුහු ශක්තිමත් වනු ඇත.

ඉස්රාඊල් ජනයින්ට අල්ලාහ් මෙසේ පවසයි. ﴿ وأمددناكم بأموال وبنين وجعلناكم أكثر نفيرا ﴾

**"තව ද, සම්පත් වලින් හා දරු සම්පත් වලින් අපි ඔබට උදව් කෙළෙමු. ඔබ ව විශිෂ්ට සමාජයක් බවට ද අපි පත් කෙළෙමු."** (අල් කුර්ආන් 17:6)

නබි සුඅයිබ් (අලෙයි) තුමා තම ජනයාට මෙය මතක් කෙළේය. ﴿ واذكروا إذ كنتم قليلا فكثركم ﴾

**'ඔබ සුළු ජන කොටසක් වශයෙන් සිටි අවස්ථාව මෙනෙහි කර බලන්න. පසු ව, අල්ලාහ් ඔබ ව (මහ සමාජයක් ලෙස) වර්ධනය කෙළේය."** (අල් කුර්ආන් 7:86)

ආ) මව හා ඇගේ ගර්භාෂයේ ඇති නූපන් දරුවා මරණයට පත් වී ඇත්නම්: මෙම අවස්ථාවෙහි ශල්‍ය කර්මයක් අනුමත කළ නොහැක. මක් නිසාද යත්, එයින් කිසිදු යහපතක් නැති බැවින් ය.

ඇ) මව ජීවත් ව සිටින අතර ඇගේ ගර්භාෂය තුළ නූපන් දරුවා මිය ගොස් ඇත්නම් : (මවට කිසිදු උවදුරක් ඇතිවෙයි යනු බියක් නැති නම්) මැරී ඇති ළදරුවා ඉවත් කිරීමට ශල්‍ය කර්මයක් කිරීමට අනුමැතිය තිබේ. මැරුණු එම ළදරුවා ශල්‍යකර්මයකින් හැර ඉවත් කිරීමට බැරි බව පැහැදිලි ය. අල්ලාහ් සර්වඥ ඥානී වේ. එම ළදරුවා මවගේ ගර්භාෂය තුළ තිබීම ඇයගේ අනාගත දරු ප්‍රසූතිවලට හානිකර විය හැකිය. තව ද, ඇයට දරාගත නොහැකි හිංසා පීඩාවන් ගෙනදිය හැකිය. මෙපමණක් නොව, ඇයගේ මුල් ස්වාමි පුරුෂයාගෙන් දික්කසාද වී ඉද්දාවෙ හි සිටිය දී, ඇයට වැන්දඹුවක් ව සිටීමේ තත්ත්වයක් ඇති විය හැකි ය. එහෙයින්, මැරුණු ළදරුවා ශල්‍යකර්මයකින් ඉවත් කිරීම අනුමත කළ යුත්තක් වේ.

ඇ) මව මැරී, ඇගේ ගර්භාෂය තුළ ඇති නූපන් දරුවා ජීවත් ව ඇත්නම් : සමහර විට ළදරුවා ජීවත් නොවන බවට නිගමනය කරන්නේ නම්, එවිට ඇයගෙන් එම ළදරුවා ඉවත් කිරීම අනුමත කළ නොහැක. එහෙත්, ළදරුවා ජීවත් වෙයි යනු දැනගතහොත්, එම ළදරුවාගේ යම් කොටසක් එළියට අවුත් ඇත්තේ නම්, එවිට ශල්‍ය කර්මයක් තුළින් එම ප්‍රසූතියේ කාර්යන් කොට ළදරුවා බේරාගැනීම අනුමත කළ හැකිය. අනෙක් පැත්තෙන් ළදරුවාගේ යම් කොටසක් එළියට ඇවිත් නැති අවස්ථාවක දි ශල්‍ය කර්මයක් තුළින් එම ළදරුවා එළියට ගැනීම ගැන සමහර නීතිවේදීන් දරණ මතය නම්, "එය අංගච්ඡේදයක් * වෙයි" යන්නය.

මේ ගැන ඇති නිවැරදි මතය නම්, මවගේ ගර්භාෂය ශල්‍යකර්මයකින් විවෘත කොට එහි ඇති ළදරුවා එළියට ගැනීමට අනුමත කළ හැකි යන්න වේ. විශේෂයෙන්, වෙන කිසිදු මාර්ගයක් නැති විට. ගර්භාෂය විවෘතකොට නැවතත් පෙර තිබුන ලෙස ම මැසීමේ තරමට ශල්‍ය වෛද්‍ය ක්‍රමය වර්ධනය වී ඇති මෙම යුගයේ මෙයට අනුමැතිය දිය හැකිය. තව ද, මිරුණු කෙනෙකුට වඩා ජීවත් වන කෙනෙක් ව බේරාගැනීම ඉතා උසස් ක්‍රියාවකි, කිසිදු වැරැද්දක් (පාපයක්) නොකළ ජීවයක් ආරක්ෂා කර ගැනීම වගකීමෙන් යුතු වූ කාර්යයකි. අලුත් ජීවය පව්වලින් නිදහස් වූ උතුම් එකකි. අල්ලාහ් සර්වඥ හා ඥානී වේ.

## අවවාදයක් :

ගබ්සා කිරීම අනුමත කරන සෑම අවස්ථාවක ම (ළදරුවාගේ) පියාගෙන් අනුමැතිය ගැනීම අවශ්‍ය වේ. මේ සම්බන්ධ ව මම (ආචාර්ය සාලිහ්) සෙයික් මුහම්මද් බින් සාලිහ් අල් උථෛමීන් තුමා ව පසුගිය හිජ්රි 1413 මුහර්රම් 17 වෙනි දින සිකුරාද (1992 ජුලි 17වෙන දින) හමු වී, "සමහර විට ගැබිනියකට ගබ්සා කිරීමේ සාධාරණ අවශ්‍යතාවයක් තිබු නමුත්, පියාගේ අනුමැතිය ලබා ගැනීම දුෂ්කර නම්, එවිට ඇය ගබ්සා කරගත හැකි ද?" යනු විමසුවෙමි. සෙයික් තුමා, "මෙවැනි අවස්ථාවක දී 'අවශ්‍යතාවය' අනුමැතිය අභිබවා ගොස් ඇත" යනු පිළිතුරු දුන්නේය.

---

(පසුපිට හා සම්බන්ධය)

** ජනගහනයෙන් වැඩි වූ සමාජයක් ස්වයංපෝෂිත වන අතර, ඊ සමාජයකෙරෙහි සතුරන් ද, බියවන බව අප දැනගත යුතු කරුණකි. එහෙයින්, සාධාරණ වූ හේතුවක් නොමැතිව ළදරුවන් ලබාගැනීමේ හැකියාව නැති කර ගැනීම අනුමත කළ නොහැක. උදාහරණයක් වශයෙන්: ස්ත්‍රියක් ගැබ් ගැනීම ඇයගේ ජීවිතයට හානිකර නම් හෝ ඇයගේ ගර්භාෂයෙහි භයානක රෝගයක් වැළදී එය, ඇයගේ ශරීරයේ අනෙක් කොටස් වලටත් පැතිරී ඇයව නැති කිරීමේ උවදුරට ලක් කරන්නේ නම් හැර ළදරුවන් ලබාගැනීමේ වාසනාව නැති කළ නොගත යුතුය".

* අංගච්ඡේදය - අත්පා සිඳ දැමීම

# අවසාන වශයෙන්

මෙම පොතෙහි ඇති මාතෘකාව යටතේ මගේ අදහස් ගෙන දක්වා ඇත්තෙමි. මෙහි ගැබ් වී ඇත්තේ මෙයට අදාළ මූලික අදහස් පමණකි. සැබවින් ම, ස්ත්‍රීන් විඳින දුක් වේදනා ගැන සලකා බලන විට, ඒවා වෙරළක් නැති සමුද්‍රයක් තරම් විශාල බව පෙනේ. යහපත් චේතනාවන් ඇති කවුරු හෝ වේවා, ඔවුන් මෙම මූලික අදහස් නිසිලෙස වටහාගෙන ඉතාමත් සාධාරණ තීරණයන් වෙත එළඹිය හැකි බව මගේ විශ්වාසයයි.

මුෆ්ති* කෙනෙක් තමා අල්ලාහ් සහ ඔහුගේ වක්තෘවරයා ගේ නියමයන් (මහජනයා වෙත) ගෙනෙදෙන කෙනෙක් පමණක් බව වටහා ගත යුතුය. ඔහු අල්ලාහ්ගේ පුස්තකය (කුර්ආනය) හා නබී (සල්) තුමාගේ සුන්නාහ්ව නිසිලෙස පිළිපදින වගකීමෙන් යුත්තෙකි. අල් කුර්ආනයට හා නබිතුමාගේ සුන්නාහ්වට එකඟ නොවන කුමන එකක් වුවත්, එය වැරදි එකක් බව වටහා ගත යුතු ය. එවැනි වැරදි කිසිවක් ක්‍රියාවට නැගීමට හෝ අනුගමනය කිරීමට හෝ තැත් නොකළ යුතු ය. එවැනි යමක් තමාගේ ඉජ්තිහාද්** සම්බන්ධ ව සමාව දිය හැකි මුජ්තහිද්*** කෙනෙක් විසින් ගෙන දැක් වූ එකක් වුවත් එය පිළිනොගත යුතු ය. යම් කාරණයක් සම්බන්ධ ව ඇති ඉජ්තිහාද් නම් වූ තීරණයක් වැරදි බව යමෙක් දැන ගතහොත්, එය ඔහු ප්‍රතික්ෂේප කළ යුතු ය.

මුෆ්ති කෙනෙක් අල්ලාහ් වෙනුවෙන් තම චේතනාවන් පිරිසිදු ව තබා ගැනීම ඉතා වැදගත් වන්නේ ය. තව ද, යහපත් දේ කෙරෙහි ස්ථිරව සිටීමටත්, යොමු වීමටත් අල්ලාහ්ගේ උදව් උපකාරය අයැද සිටිය යුතු ය.

අල් කුර්ආනයේ සහ නබී (සල්) තුමාගේ සුන්නාහ්වෙ හි ඇති කරුණු සම්බන්ධ ව ඔහු (මුෆ්ති) සැලකිලිමත් ව කල්පනා කිරීමත්, පර්යේෂණ කිරීමත්, ඉතා යහපත් ලෙස වටහා ගැනීමත් අවශ්‍ය ය. එමෙන් ම ඉස්ලාමීය විද්වතුන්ගේ අදහස් හා ඔවුන් විසින් දෙනු ලැබූ විස්තර ලබාගෙන කියවීමටත්, වටහා ගැනීමටත් උනන්දු වීම ද මොවුන් විසින් කළ යුත්තකි. නොයෙකුත් අවස්ථාවන් හි ඇතිවෙන තත්ත්වයන් අනු ව ඊට සම්බන්ධ වූ පිරිස විද්වතුන්ගේ අදහස් ලබා ගැනීමට යන්නේ ය. නමුත් ඔවුන්ගේ සිතට සතුට ගෙන නොදෙන තීරණයන් ය ඔවුහු ලබාගන්නේ නැතහොත් කිසිවක් නොලබන්නෝ වෙති. මෙම අවස්ථාවෙ හි ඔවුන්ගේ යහපත් චේතනාව, දැනුම යමක් වටහා ගැනීමේ හැකියාව යනාදිය කෙරෙහි විශ්වාසය තබා තමාගේ අවශ්‍යතාවයන් සපුරා ගැනීමට අල් කුර්ආනය හා නබිතුමාගේ සුන්නාහ්ව වෙත යොමුවන්නේ නම් ඔහු හෝ ඇය පැහැදිලි හා සමීප තීරණයක් වෙත පැමිණෙනවා නියතයි.

මුෆ්ති කෙනෙක් සිතේ තබා ගත යුතු වැදගත් තවත් කරුණක් නම්, ඔහු යම් කරුණක් සම්බන්ධව ආගමික තීරණයක් දීමට ඉක්මන් නොවිය යුතු ය. යම් ප්‍රශ්නයක් ඔහු වෙත ගෙන එනු ලැබුවහොත් ඒ පිළිබඳව මනා අධ්‍යයනයක් කොට කරුණු සොයා බැලීමත් අවශ්‍ය ය. පසු ව ඒ ගැන තීරණයක් දීමට මුෆ්ති කෙනෙක් ඉක්මන් නොවිය යුතු ය. මක්නිසාද යත් ඉක්මන් වීමෙන් වැරදි තීරණයක් දී, එහි ඵල විපාක නිසා පසු ව ලතැවෙන්නට සිදුවිය හැකි බැවිනි.

---

| | | |
|---|---|---|
| * | මුෆ්ති : | ඉස්ලාමීය නීතිරීති ගෙන දක්වන ඉස්ලාමීය විද්වතා. |
| ** | ඉජ්තිහාද් : | අධෝ ලිපි අංක 16 බලන්න. |
| *** | මුජ්තහිද් : | ඉජ්තිහාද් අනුව තීරණයක් ගන්නා තැනැත්තා. |

යම්කිසි මුෆ්ති කෙනෙක් වෙත ගෙනයනු ලබන තමන්ගේ කාර්යයන් කෙරෙහි ප්‍රමුඛ ස්ථානයක් දී උනන්දුවෙන් සලකා බලන බව දැනගන්නා මහජනයා, ඔහු වෙත දැඩි විශ්වාසයක් තබයි. ඔහුගේ තීරණයක් සතුටින් පිළිගනියි. එසේ නැතිව ඔහු තීරණයක් දීමෙහි ඉක්මන් වූ විට, ඔහු වෙත මහ ජනයා තබා ඇති විශ්වාසය නැතිවී යයි. එයින් ඔහු විසින්ම ඔහුගේ කීර්තිය නැති කරගන්නා අතර, අනෙක් අයට ඔහුගේ ඥානයෙන් යහපතක් ලබා ගැනීමට ද නුපුළුවන් වෙයි.

ඉතා උත්කෘෂ්ට වූ අල්ලාහ් වෙත, අප හා අපගේ මුස්ලිම් සහෝදර සහෝදරියන් යහමග යවනමෙන් ප්‍රාර්ථනා කර සිටිමි. තව ද ඔහුගේ ආරක්ෂාව අප සැමට දෙන මෙන් ද, වැරදි හා පාප ක්‍රියාවන් හි යෙදීමෙන් රැකගන්නා ලෙස ද අයැදිමි. ඔහු ඉතාමත් ත්‍යාගශීලීය; අයැදින්නන් හට නොපසුබට ව පිහිට වන්නෙක් ය.

අල්ලාහ්ගේ ශාන්තිය හා සමාදනය කරුණාන්විත වූ නබි (සල්) තුමාටත්, එතුමාගේ පවුලේ සාමාජිකයින් හිත මිතුරන්, එතුමාගේ අඩිපාරේ ගමන් කරන්නන් යනාදීන්ටත් ලැබේවා! පැසසුම් සියල්ල හිමිවන්නේ අල්ලාහ්ට පමණි. ඔහුම ය මෙම උදර සේවය ඉටු කිරීමට කරුණා පූර්වක ව උදව් වූයේ.

අල්ලාහ් අභියස අසරණ තත්ත්වයක සිටින මුහම්මද් බින් සාලිහ් අල් උසෛමීන් වන මම, හිජ්රි 1392 ෂඃබාන් මස 14 වෙනි දින සිකුරාද මෙම කර්තව්‍යය පරිපූර්ණ කෙළෙමි.

***** අල් හම්දුලිල්ලාහ් *****

# 8

# ප්‍රශ්නෝත්තර

මෙම පොතෙහි ඇති යම් යම් කරුණු සම්බන්ධව සෙයික් මුහම්මද් බින් සාලිහ් අල් උසෛමීන් තුමාගෙන් අසන ලද ප්‍රශ්න හා එතුමා දුන් පිළිතුරු මෙහි අඩංගු ය. සහෝදර සහෝදරියන් මේවා කියවා, කල්පනා කර, හොඳ හැටි වටහාගෙන පිළිපැදීම වැදගත් වේ.

## ඔසප් වීම වළක්වාලන උපක්‍රම

**ප්‍රශ්න අංක 1** : රමළාන් මාසය තුළ ඔසප් වීම වලක්වාලන බෙහෙත් පෙති ගැනීම ගැන ආගමික තීරණය කුමක් ද ?

**පිළිතුර** : මෙම බෙහෙත් පෙති ගැනීමෙන් කිසිදු හානියක් නොමැති බවත්, මෙම පෙති ගැනීමට ස්වාමි පුරුෂයාගෙන් අවසර ඇති බවත් පවසන්නේ නම් එය අනුමත කළ හැකිය. කෙසේ වෙතත් මා දන්නා පමණින් එවැනි දේ ස්ත්‍රියට හානි කරය. විශේෂයෙන්, යම් ස්වාභාවික ක්‍රමයක් අනුව ඔසප් වීම ඇති වී රුධිර පිටවෙන බව අපි දනිමු. මෙම ස්වාභාවික ක්‍රමයට විරුද්ධ ව හැසිරී, එය වැළැක්වීම හානියක් සිදුවිය හැකි කාර්යයක් ය. තව ද මෙවැනි පෙති ගැනීමෙන් ස්ත්‍රියකගේ ඔසප් වීමේ චක්‍රයෙහි දෝෂයක් ඇතිවෙන්නට පුළුවනි, මෙයින් ඇයගේ සලාතය නියම වේලාවෙහි ඉටු කිරීමෙහි සැකයක් හා පැටලිල්ලක් ඇති වෙන්නත් පුළුවනි, තව ද, ඇයගේ ස්වාමි පුරුෂයා සමග සංසර්ගයේ යෙදීමට හැකි ද? නො හැකි ද? යන සිත්තැවුල ද ඇති වෙන්නට පුළුවනි. මෙකී නොකී කරුණු නිසා, මෙම පෙති ගැනීම නීති විරෝධී බව මට කීමට නොහැකි වුවත්, මම එයට එකඟ නොවෙමි. එහෙයින් එම පෙති ගැනීමට මම අනුබල ද නොදෙමි.

මම කියා සිටින්නේ, ස්ත්‍රීන්, තමන් වෙනුවෙන් අල්ලාහ් නියම කර ඇති දේ හිතෛෂිව පිළිගත යුතු බව ය. තව ද, නබි (සල්) තුමා, තම භාර්යාව වූ ආයිෂා (රළි) තුමිය උම්රාව වෙනුවෙන් ඉහ්රාම් ඇඳගත් පසුව ඔසප් වීම ඇති වූ විට පැවසූ දේ ගැන ද සිතා බැලිය යුතු ය. නබි (සල්) තුමා, "ආයිෂා! ඔබට ඔසප් වීම ඇතිවූයේ ද ?" යනු ඇසූ හ. ආයිෂා (රළි) තුමිය ඔව්" යනු කීවා ය. එවිට මෙය ආදම්ගේ සියලු ම දූවරුවන්ට අල්ලාහ් නියම කර ඇති දෙයක් වෙයි" යනු නබි (සල්) තුමා පැවසුවේ ය."[62]

එහෙයින්, ස්ත්‍රීන් ඉවසීමෙන් යුතු ව අල්ලාහ්ගෙන් අනුග්‍රහ හා තිළිණ ලබා ගැනීමට උත්සාහ විය යුතු ය. සමහර විට, ස්ත්‍රියකට ඇතිවෙන ඔසප් වීම නිසා සලාතය ඉටු කිරීමට ද උපවාසයේ යෙදීමට ද නොහැකි වේනම්, එකල්හි අල්ලාහ් ප්‍රශංසා කිරීම, දන්දීම, නැති බැරි අයට උදව් උපකාර කිරීම වැනි යහපත් කාර්යයන් පිණිස වූ දොරටුව විවෘත වී ඇත. මෙම කාර්යයන් හි නියුකත්ත විය හැක. මේවා අල්ලාහ්ගේ තෘප්තිය ගෙනදෙන උතුම් ක්‍රියාවන් වේ.

---

62. මූලාශ්‍රය: සහීහුල් බුහාරී. (අරාබි - ඉංග්‍රීසි) වෙළුම:1, පි: 182

## ඔසප් වීමෙන් පසු පිරිසිදු වීම

**ප්‍රශ්න අංක - 2 :** ස්ත්‍රියක් විවාහ වී මාස දෙකකට පසු ව, ඇය ඔසප් වීමෙන් පිරිසිදු වූ පසුව කුඩා ලේ බින්දු පිටවෙනවා දකියි. මෙවැනි අවස්ථාවක ඇයට සලාතය ඉටු කිරීමටත් උපවාසයේ යෙදීමටත් අනුමත කළ හැකි ද ?

**පිළිතුර :** ස්ත්‍රීන්ගේ ඔසප් වීම, විවාහ වීම යනාදිය සම්බන්ධ ව ඔවුන් හමුවේ ඇති ප්‍රශ්නයක් වෙරළක් නැති සමුද්‍රයක තරම් විශාල ය. ඒවායින් සමහර ප්‍රශ්න ඔසප් වීම වළක්වාලන බෙහෙත් පෙති ගැනීමෙනුත් උපත් පාලන බෙහෙත් පෙති ගැනීමෙනුත් ඇතිවෙයි. අතීතයේ ජීවත් වූ මිනිසුන් දැන් පවත්නා නොයෙකුත් ප්‍රශ්නයන් තම ජීවිතයේ දැක නැත. අද ඇති තත්ත්වය වේදනා සහගත ය.

අපි කවුරුත් සිතේ තබාගත යුතු සාමාන්‍ය නීතියක් නම්, ඔසප් සිදු වූ යම් ස්ත්‍රියක් එයින් පිරිසිදු වූ බවට පැහැදිලි සංඥාවක් දකින්නේ නම් ඇය පිරිසිදු ව සිටින කෙනෙක්" බවයි. සුදට යමක් යෑම පිළිබඳව ස්ත්‍රීන් නොදන්නවා නොවේ. ස්ත්‍රියක් පිරිසිදු වූ පසු ව ඇයගෙන් පිටවෙන කහපාටට හුරු ද්‍රවයක් හෝ තෙත මතයෙන් යුතු වූ ද්‍රවයක් හෝ බින්දු ඔසප් වීමට අදළ වූ දේ නොවෙයි. එහෙයින් එම ස්ත්‍රිය සලාතය ඉටු කිරීම උපවාසයේ යෙදීම, තම සැමියා සමග සංසර්ගයේ යෙදීම වැනි කර්තව්‍යයන්ට මේවා තුළින් බාධාවක් ඇතිවෙන්නේ නැත.

උම්මු අතියියා (රළි) තුමිය මෙසේ පැවසුවා ය ! "අපි කහපාටට හුරුව පිටවෙන ද්‍රව්‍ය වැදගත් බව කිසි විටෙක නොසිතුවෙමු." (මෙම හදීසය බුහාරි ග්‍රන්ථයේ සඳහන් වී ඇත.) අබුදාවුද් හදීස් ග්‍රන්ථයහි, පිරිසිදු වූ පසුව[63] යනු සඳහන් වී ඇත.(මෙහි අදහස නම් ඔසප් වීමෙන් පිරිසිදු වූ පසු ව පිටවෙන දේ ඔසප් හා සම්බන්ධ වූවක් නොවන බවයි.)

**අවවාදයක් :** ස්ත්‍රීන් තමන් නියත වශයෙන්ම පිරිසිදු ව සිටින බව දැනගැනීමට පෙර කිසිදු කාර්යයකදී ඉක්මන් නොවිය යුතු ය. සමහර ස්ත්‍රීන්ට ඔසප් වීම ඇති වී එය වියලුණු විගස ජල ස්නානය කිරීමට දුව යයි. එසේ නැතිව, තමා ඔසප් වීමෙන් හොඳ හැටි පිරිසිදු වූවාද යන්න නිශ්චය කරගන්නේ නැත. නබිතුමාගේ මිතුරන්ගේ භාර්යාවන් ඔසප් වූ විට තමන් භාවිතා කළ ආරක්ෂක තුවා (Pad) ආයිෂා (රළි) තුමිය වෙත යවා විස්තර අසා සිටියි. එවිට. "සුදු ද්‍රවයක් පිටවෙනවා දකිනතෙක් (ඔසප් වීමෙන් පිරිසිදු වූ බවට නිගමනය කිරීමට) ඉක්මන් නොවන්න" යනු එතුමිය ඔවුන්ට දන්වයි.

**ප්‍රශ්න අංක - 3 :** තෙතමතයෙන් යුතු ව පිටවෙන ද්‍රව්‍ය ගැන කුමක් කියන්නේ ද ? එය පිරිසිදු ද නොහොත් අපිරිසිදු ද ?

**පිළිතුර :** ඉස්ලාමීය විද්වතුන්ගේ අදහස් අනුව අපි දැන සිටින්නේ ස්ත්‍රී පුරුෂයන්ගේ ලිංගේන්ද්‍රයෙන් හා ගුද මාර්ගයෙන් පිටවෙන දේ වලින් ධාතු හැර අන් සියලු දේම අපිරිසිදු බව ය, ධාතු පමණක් පිරිසිදු වේ. එහෙයින් ස්ත්‍රීන්ගෙන් කුමන දේ පිටවෙන්නේ ද ඒවා අපිරිසිදු ය, එවිට වුළු නම් වූ දෝවනය කිරීම අවශ්‍ය වේ. මේ සම්බන්ධව වෙනත් විද්වතුන් සමග මම සාකච්ඡා කළ පසු ව මා ගත් නිගමනය මෙය වේ.

---

63. වාර්තා කරන්නන්ගේ පෙළ යහපත් ය.

එනමුත් මේ සම්බන්ධ ව මා තුළ තවමත් ප්‍රශ්නයක් ඇත්තේ ය. එනම්, සමහර ස්ත්‍රීන්ට මෙවැනි දේ පිටවීම නොකඩවා ඇත. මෙම තත්ත්වය නොකඩවා මුත්‍රා පිටවෙන කෙනෙකුගේ තත්ත්වය සමග සසඳ, සලාතය ඉටු කිරීමට නියමිත වේලාව ළඟා වූ විට ඇය වුළු කිරීමට තීරණය කළ හැකි ය. මේ සම්බන්ධව මම සමහර වෛද්‍යවරුන් සමග සාකච්ඡා කෙළෙමි. ඒ අනුව මා කියන්නේ මෙසේ පිටවෙන දේ මුත්‍රාශය තුළින් පිටවෙන්නේ නම් මම ඉහත සඳහන් කර ඇති තීරණය එයට අදාළ වේ. සමහර විට එසේ පිටවෙන දේ ප්‍රසූතිය ඇති වෙන තැනින් පිට වෙන්නේ නම් එය සඳහා වුළු දේවනය කිරීම සෑහේ. තව ද, පිටවෙන දේ පිරිසිදු නම්, එවැනි දේ ගැවුණු ඇඳුම් සේදීම අවශ්‍ය නොවන්නේ ය.

**ප්‍රශ්න අංක - 4 :** නිෆාසයට පත් වී සිටින ස්ත්‍රියක් දින හත ළිහට පෙර සලාතය ඉටු කිරීමටත් උපවාසයේ යෙදීමටත් හැකි ව සිටියදීත්, එම දින ගණන සම්පූර්ණ වනතෙක් සිටිය යුතු ද? එසේ නැතිනම්, ඇයගේ රුධිර පිටවීම නැවතී, පිරිසිදු වූ කුමන අවස්ථාවක වුවත් ඇය මෙම නැමදීම් ඉටු කළ හැකි ද ?

**පිළිතුර :** නිෆාසයට පත් වූ ස්ත්‍රියකට නියමිත කාල සීමාවක් නැත. ඇය නිෆාසයේ රුධිර තිබෙනවා දකිද්දී සලාතය ඉටු කිරීම, උපවාසයේ යෙදීම, තම සැමියා සමග සංසර්ගයේ යෙදීම යනාදියෙන් ඈත් වී සිටිය යුතු ය. ඇය නියමිත දින හතළිහට පෙර (සමහර විට 10 වෙනි හෝ 15 වෙනි දින) පිරිසිදු වුවහොත්, ඉහත සඳහන් නැමදීම් හි යහපත් ලෙස යෙදීමටත්, තමාගේ සැමියා සමග සංසර්ගයේ යෙදීමටත් හැකි ය.

නිෆාස ය යනු ශරීරයට සම්බන්ධ වූ යම් ක්‍රියාකාරිත්වයකි. නිෆාසයට අදාළ නීති රීති නිෆාසයට සම්බන්ධ රුධිර තිබේ ද' නැත්නම් නොතිබේ ද' යන්න පදනම් කරගෙන ක්‍රියාවට නගනු ලැබේ. කෙසේ වෙතත් දින හැටකටත් පසුව ස්ත්‍රියකට නොනැවතී රුධිර පිටවෙන්නේ නම්, එවිට ඇය ඉස්තිහාදත් නම් වූ තත්ත්වයට අයත් කෙනෙක් වෙයි. මෙම අවස්ථාවෙහි දී දින හතළිහෙන් සාමාන්‍ය දිනයන් තමාගේ නියම ඔසප් වීමේ දිනයන් බව තීරණයකොට, එම දිනයන්හි සලාතය ඉටු කිරීම, උපවාසයේ යෙදීම, තම සැමියා සමග සංසර්ගයේ යෙදීම යනාදියෙන් ඈත් වී සිටි යුතු ය. එම දින හතළිහෙන් පසුව ඇය ඉස්තිහාලාත් නම් වූ තත්ත්වයේ සිටිනා බව තීරණයකාට, ජල ස්නානය කිරීමෙන් පසු ව සලාතය ඉටු කළ යුතු ය.*

## රුධිර පිටවීම හා උපවාසය

**ප්‍රශ්න අංක - 5 :** රමළාන් මාසයෙහි ඔසප් වීම ඇති වූ හෙයින් උපවාසයේ යෙදීමට නොහැකි වූ දිනයන් ඌණ පූර්ණ කිරීම සඳහා වෙනත් දිනයන් හි උපවාසයේ යෙදීමට ( කලා ඃ කිරීමට) අපොහොසත් ස්ත්‍රියක් ඒ සඳහා කුමක් කළ යුතු ද ?

**පිළිතුර :** ඊමාන්ධාරී ස්ත්‍රීන් මෙලෙස හැසිරීම කණගාටුදායක තත්ත්වයකි. මෙය සමහර විට නොදැනුවත්කම නිසා හෝ කම්මැලිකම නිසා හෝ වෙනවා ඇත. මෙම කාරණා දෙකම වැරදි ය. මේවා ඉවත් කර ගැනීමට - එනම්, නොදැනුවත්කම මඟහැර ගැනීමට දැනුවත්කම ඇත්තන්ගෙන් අසා දැනගැනීම ද, කම්මැලිකම මඟහැරී මට අල්ලාහ් සහ ඔහුගේ දඬුවම් ගැන බිය වීම ද අවශ්‍ය වේ.

---

* ඉස්තිහාදත් සහ නිෆාස් යනාදිය ගැන වූ පරිච්ඡේදය බලන්න

එම නිසා ඉහත සඳහන් පරිදි හැසුරුණු ස්ත්‍රියක් පශ්චාත් තාපයට පත් වී අල්ලාහ්ගෙන් සමාව අයැදිය යුතු ය. ඒ සමගම ඇයට අතහැරුණු උපවාසයේ දින ගණන හැකි පමණින් උත්සාහ වී දැනගෙන ඒ වෙනුවෙන් වෙන දිනයන්හි උපවාසයේ යෙදීම ('කලාඃ') කළ යුතු ය. එවැනි ස්ත්‍රීන් අයැද සිටින සමාව පිළිගෙන සමාව දෙනමෙන් මම ද අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කරමි.

**ප්‍රශ්න අංක - 6 :** ස්ත්‍රියක් හැටපස් වියට පා තබයි. පසුගිය අවුරුදු දහනවය තුළ ඇයට කිසිම ළමයෙකු ඉපදුනේ නැත. දැන් අවුරුදු තුනක් ඇයට රුධිර පිටවෙයි. ඇය උපවාසයේ යෙදීමට කුමක් කළ යුතු ද ? තව ද, ඇයගේ එම තත්ත්වයේ සිටින ස්ත්‍රීන් (සලාතය, උපවාසය සම්බන්ධව) කුමක් කළ යුතු ද ?

**පිළිතුර :** මෙම තත්ත්වයේ සිටින ස්ත්‍රියක් ඇයගේ නියමිත ඔසප්වීමේ කාලය තුළ සලාතය උපවාසය යනාදියන් ඈත් වී සිටිය යුතු ය. උදහරණයක් වශයෙන් : ඇයගේ නියමිත ඔසප් වීම මාසයේ ආරම්භ දින හයෙහි දී ඇතිවෙයි. මේ අනුව ඇය සෑම මාසයක ම මුල් දින හය තුළ සලාතය ඉටු කිරීම උපවාසයේ යෙදීම යනාදිය නොකළ යුතු ය. ඉනික්බිති ව ඇය ජල ස්නානය කොට පිරිසිදු වී සලාතය හා උපවාසය ඉටුකළ යුතු ය. ඇය සලාතය ඉටු කිරීමට පෙර තමාගේ රහස් ප්‍රදේශය හොඳ හැටි සෝද, ආරක්ෂක තුවායක් (Pad) තබාගත් පසු ව වුළු දේවනය කළ යුතු යි. අනිවාර්ය (ෆර්ල්) සලාතයට නියමිත වේලාවහි ඇය මෙය කළ යුතු ය. අනිවාර්ය සලාතය නියමිත නොවූ වේලාවන් හි අනිවාර්ය නොවන (සුන්නත්) සලාත් ඉටු කරන විට ද ඇය මෙසේ කළ හැකි ය.

මෙවැනි ස්ත්‍රීන් මෙවැනි අවස්ථාවන් හි මුහුණ දිය යුතු මෙම දුෂ්කරතාවයන් නිසා යම් සහනයක් ඇත. එනම්, ඔවුහු ලුහර් හා අසර් සලාතයන් ඒකාබද්ධ (ලුහරයට හෝ අසරයට නියමිත වේලාවෙහි) ඉටු කිරීමට ද, මඃරිබ් හා ඉෂා සලාතයන් එකාබද්ධ (මඃරිබයට හෝ ඉෂාවට නියමිත වේලාවෙහි) ඉටු කිරීමට ද අනුමත කළ හැකි ය. (එහෙත්, සලාතයන් කෙටි කර ඉටු කිරීමට නොහැකිය) මෙලෙස, එක් දිනක පස් වේලක් ඉටු කළ යුතු සලාතය වෙනුවෙන් (උදෑසන ෆජ්ර් සලාතයත් සමග) තුන් වේලක් ඉටු කිරීමට කටයුතු සලසා ගත හැක. මෙවැනි අනිවාර්ය (ෆර්ල්) සලාතයන් වෙනුවෙන් කරන වුළුවෙන් ඇය තමාගේ අනිවාර්ය නොවන (සුන්නත්) සලාතයන් ද ඉටුකළ හැකි ය.

**ප්‍රශ්න අංක - 7 :** නිෆාසයට පත් වූ ස්ත්‍රියක් රමළාන් මාසයෙහි තමාගේ දින හතක උපවාසයෙහි නොයෙදුණා ය. ඇය ඒ වෙනුවෙන් නැවත ( කලාඃ) උපවාසයේ යෙදුනේ ද නැත. එයට ඇය පැවසූ හේතු ව, ඇය අසනීප වී සිටි බව ය. ඉන් පසුව ළඟ වූ රමළාන් මාසයෙහි ද ඇය තවත් දින හතක් උපවාසයේ යෙදීම පැහැර හැරියාය. මෙහිදී ඇය පැවසූ හේතුව, ඇය තම ළදරුවාට කිරිදෙන බව ය. මෙවැනි අවස්ථාවක දී ඇය කළ යුත්තේ කුමක් ද ?

**පිළිතුර :** සැබවින්ම ඇය අසනීප වී, පළමුව අතහැරුණු දින හතේ උපවාසය ඌණ පූර්ණ ('කලාඃ') කිරීමට නොහැකි වූයේ නම්, අනෙක් රමළාන් මාසය පැමිණ අවසන් වූ විට ද, ඇයට සමාව ඇත. නමුත්, ඇය අසනීප නොවී, කම්මැලිකම නිසා උපවාසයේ යෙදීම පැහැර හැරියේ නම්, ඇය මහා පාපයක් කළ තැනැත්තියක් වන්නා ය. ඒ සඳහා ඇය අල්ලාහ්ගෙන් සමාව අයැද සිටිය යුතු ය.

ආයිෂා (රළි) තුමියට (යම් රමළාන් මාසයක) අතහැරුණු උපවාස යන් ඌණ පූර්ණ ( කලාඃ) කිරීමට සෑබාන් මාසය දක්වා ම නොහැකි විය. සෑබාන් යනු රමළාන් මාසයට පෙර ඇති මාසයයි. මේ ගැන එතුමියම මෙසේ පැවසුවා ය. සමහර විට, මම රමළානයෙහි ටික දිනක් (උපවාසයේ නොයෙදී) පැහැර හරිමි. එහෙත් ඒවා ඌණ පූර්ණ ( කලාඃ) කිරීමට සෑබාන් මාසයේ හැර (වෙන මාසයක) ලැබෙන්නේ නැත."[64]

එහෙයින් ස්ත්‍රියක් මෙසේ හැසිරීම සම්බන්ධව ඇයට සමාව දීමට සෑහෙන කරුණු ඇත්නම් ඇය තමාට අත හැරුනු උපවාසයන් සඳහා අවුරුද්දකට (හෝ අවුරුදු දෙකකට) පසුව හෝ ඌණ පූර්ණ ( කලාඃ) කිරීමට පුළුවනි.

**ප්‍රශ්න අංක - 8 :** ගැබිණියක් විපතට පත් වීම නිසා ඇයගේ ගර්භාශය තුළ වූ ගර්භ බීජය නැති වූ අතර අධික ලෙස රුධිර පිටවීමට ද ලක් වූවා ය.මෙය, ඇය ගැබ්ගත් ආරම්භ අවස්ථාවෙහි සිදු විය. එම නිසා, ඇය උපවාසයේ නොයෙදී සිටීමට අනුමතිය තිබේ ද ? නැතහොත් උපවාසයේ යෙදිය යුතු ද ? තව ද, ඇය තමාගේ උපවාසය බිඳ ගතහොත් (If she break her fasting) එයින් ඇය පවක් කරන බව පැවසිය හැකි ද?

**පිළිතුර :** ඉමාම් අහ්මද් තුමා පැවසූ පරිදි, මම සඳහන් කරන කරුණු මෙසේ ය. ගැබිණියකුට ඔසප් වීම නැත. ස්ත්‍රියක් ගැබ්ගත් පසු ඇයගේ සාමාන්‍ය ඔසප් වීම නවතින්නේ ය. අල්ලාහ් ස්ත්‍රීන්ට ඔසප් වීම ඇතිකර ඇත්තේ එය තුළින් කළලයට(Embryo) පෝෂණදායී දේ සැපයීමේ හේතුවෙන් ය" යනු සමහර විද්වත්හු පවසති. යම් විටක ස්ත්‍රියක් ගැබ්ගත් විට ඇයගේ ඔසප් වීම නතර වෙයි. කෙසේ වෙතත්, සමහර ස්ත්‍රීන්ට ගැබ්ගත් පසුවත් ඔසප් වීම නොකඩවා තිබෙන්නේ ය. මෙය සාමාන්‍ය ඔසප් වීම බව අපි සලකනු ලැබේ. මක්නිසාද යත්, මුල් අවධියේ වූ ඔසප් වීමට ගැබ් ගැනීම නිසා කිසිදු බලපෑමක් සිදු වූයේ නැත. මෙම අවස්ථාවෙහි දී ඔසප් වීමට අදළ සියලුම නීතිරීති මෙයට ද අදළ වන්නේ ය.

තවත්, විවිධාකාරව රුධිර පිටවෙන අවස්ථාවන් ද ඇත. යමක් ඉස්සීම, වැටීම හෝ එවැනි වෙනත් හේතූන් නිසා මෙම රුධිර පිටවීම ඇතිවෙයි. ඒ හැර ඔසප් වීමෙන් මෙසේ නොකෙරේ. නමුත් එය යම් රුධිර වාහිනියකින් වන රුධිර පිටවීමක් ය.එහෙයින් රුධිර පිටවීමෙන් ගැබිණියකගේ සලාතයට හෝ උපවාසයට කිසිම බාධාවක් ඇති නොවෙයි. ඇයගේ තත්ත්වය පිරි සිදු ස්ත්‍රියකගේ ම තත්ත්වය වේ.

එහෙත් විපතක් නිසා යම් ස්ත්‍රියකගේ ගර්භාශයෙහි ඇති කළලය එළියට ආ කල (ගබ්සාව වූ කල) එය පැහැදිලි මිනිස් හැඩ රුව ඇති එකක් වේ නම්, එවිට ඇයගෙන් පිටවෙන රුධිර නිෆාසය හා සම්බන්ධ වන බව ඉස්ලාමීය විද්වතුන්ගේ මතයයි. එහෙයින් ඇය සලාතය, උපවාසය යනාදියෙන් ඈත් වී සිටින අතර යහපත් ලෙස පිරිසිදු වනතෙක් තම සැමියා සමග සංසර්ගයෙද නොයෙදී සිටිය යුතු යි. සමහර විට ඇයගේ ගර්භාශයෙන් නිකුත් වූ කළලය මිනිස් හැඩරුව නොමැති එකක් වේ නම්, නරක් වූ රුධිර පමණි. එයින් ඇයගේ සලාතය උපවාසය ආදියට කිසිදු බාධාවක් නැත. මවකගේ ගර්භාශය තුළ ඇති කළලය මිනිස් හැඩ රුව ගැනීමට අඩු ම වශයෙන් දින 81 ක් ගතවන බව ඉස්ලාමීය විද්වතුන් පවසා ඇත. මෙය පහත සඳහන් හදීසයට එකග වෙයි.

නබි (සල්) තුමා පැවසූ බව අබ්දුල්ලාහ් ඉබ්නු මස්ඌද් (රළි) තුමා මෙසේ දන්වා ඇත.

"ඔබ සැවොම ඔබගේ මවගේ ගර්භාශය තුළ දින හතළිහක් රැස්කොට තබනු ලැබිය. පසු ව ඊට සමාන වූ (දින හතළිහක) කාලයක් ලේ කැටියක් ලෙසට පත් කරනු ලැබීය. පසු

---

64 මූලාශ්‍රය බුහාරි (අරාබි - ඉංග්‍රීසි) වෙළුම :1, පි: 98, හදීස් අංක : 171

ව ඊට සමාන වූ (දින හතළිහක) කාලයක් තුළ මාංශ කැබෙල්ලක්ලෙසට පත් කරනු ලැබිය. පසුව අල්ලාහ් මලක්වරයෙක් යවා කරුණු හතරක් ලියන ලෙස නියෝග කරයි. එම කරුණු නම් : ඔහුගේ ආහාර ප්‍රමාණය, ඔහුගේ වයස, ඔහු (මරණින් පසු ජීවිතයෙහි) අවාසනාවන්ත කෙනෙක් වන්නේ ද නැතහොත් වාසනාවන්ත කෙනෙක් වන්නේ ද ? ......"[65]

මවගේ ගර්භාශ ය තුළ ඇති කළලය දින 81 ට පෙර මිනිස් හැඩ රුව ගැනීමට නුපුළුවන. නමුත් සමහර ඉස්ලාමීය විද්වතුන්ගේ මතය අනුව මෙම කාල සීමාව දින 90 ක් වේ.

## ඔසප් වීම සහ සලාතය

**ප්‍රශ්න අංක - 9 :** යම් සලාතයකට නියමිත කාලය එළඹී ටික වේලාවකට පසු ව ස්ත්‍රියකට ඔසප් වීම ඇති වූයේ නම් එම තත්ත්වයට අදළ නීතිරීති මොනවා ද ? තව ද, යම් සලාතයකට නියමිත කාලය නිම වීමට පෙර ඇය පිරිසිදු වුවහොත් එම තත්ත්වයට අදළ නීතිරීති මොනව ද?

**පිළිතුර :** යම් සලාතයකට නියමිත කාලය තුළ ස්ත්‍රියකට ඔසප් වීම සිදු වුවත්, ඊට පෙර ඇය පිරිසිදු ව සිටිය දී එම සලාතය ඉටු නොකළේ නම්, පහත සඳහන් හදීසය අනුව ඇ මහහැරුණු එම සලාතය ඌණ පූර්ණ ( කලාඃ ) කළ යුතු ය. "කවරෙකු හෝ සලාතයක රකඅත් එකක් (එයට නියමිත වේලාව තුළ) ලබාගත්තේ නම්, එවිට ඇය එම සලාතය ලබා ගත්තේ ය."* එහෙයින්, සලාතයේ රකඅත් එකක් ඇයට ලබාගන්න හැකි වී, ඉන්පසු ව නිසි පරිදි සලාතය ඉටු කිරීමට පෙර ඔසප් වීම සිදු වුනොත් එවිට ඇය පිරිසිදු වූවායින් පසු ව එම සලාතය ඌණ පූර්ණ ( කලාඃ) කිරීම අවශ්‍ය වේ.

යම් සලාතයකට නියමිත කාලය නිමවීමට පෙර ඇගේ ඔසප් වීම නැවතුනේ නම්, ඇය (ජල ස්නානය කොට) පිරිසිදු වී එම නියමිත සලාතය ඉටු කළ යුතුය. ඇයගේ ඔසප් වීම නැවතී, ඉර උදවීමට පෙර සලාතයේ රකඅත් එකක් ඉටුකිරීමේ කාලවේලාව තිබුනේ නම්, ඇය පිරිසිදු වූ පසු ව එම ෆජ්ර් සලාතය නිසිලෙස ඌණ පූර්ණ ('කලාඃ) කළ යුතු ය. තව ද ඇයගේ ඔසප් වීම නැවතී මධ්‍යම රාත්‍රියට පෙර සලාතයක රකඅත් එකක් ඉටුකිරීමේ කාලවේලාව තිබුනේ නම්, එවිට ඉෂා සලාතය ඌණ පූර්ණ ('කලාඃ) කිරීම ඇය වෙත අනිවාර්ය වන්නේ ය. එහෙත්, ඇයගේ ඔසප් වීම මධ්‍යම රාත්‍රියට පසු ව නවතී නම්, එවිට ඇය ඉෂා සලාතය ඌණ පූර්ණ ('කලාඃ) කිරීමට අවශ්‍ය වන්නේ නැත. නමුත් එදින අලුයම ෆජ්ර් සලාතය නිසිලෙස ඉටු කළ යුතු ය. අල්ලාහ් පවසයි:

﴿ فإذا إطمئننتم فأقيموا الصلاةَ إنّ الصلاةَ كانت على المؤمنينَ كتاباً موقوتا ﴾

**"තව ද, සතුරු උවදුර කෙරෙහි බිය පහ වී ගියේ නම් නියමිත පිළිවෙළට සලාත් හි නිරතවන්න. ඇත්තෙන් ම නියමිත වේලාවට සලාතය ඉටුකිරීම ඊමාන්ධාරීන් කෙරෙහි අනිවාර්ය යුතු කමකි."**

(අල් කුර්ආන් 4 : 103)

---

65. අධෝ ලිපි අංක 60 බලන්න.
* අධෝ ලිපි අංක : 26 බලන්න.

මෙම සලාත් වනාහි පැහැදිලිව ම සඳහන් කොට ඇති සලාත් වේ. මේවා නියමිත වේලාවන් හි ඉටුකිරීම අනිවාර්ය වේ. ඒ හැර මෙම සලාතයන් මේවාට නියමිත වේලාවට පෙර හෝ පසුව ඉටුකිරීමට කිසිවෙකුට අනුමැතිය නැත.

**ප්‍රශ්න අංක - 10 :** ස්ත්‍රියක් ෆජ්ර් සලාතයට පෙර ඔසප් වීමන් පිරිසිදු වන බව සිතා ගනිමු. නමුත් එම සලාතයට නියමිත වේලාව ආරම්භ වූ පසුව ඇය ජල ස්නානය කොට පිරිසිදු වී එදින උපවාසයේ යෙදුණා ය. ඇයගේ මෙම උපවාසය නිවැරදි බවට පිළිගත හැකි ද ?

**පිළිතුර :** රමළාන් මාසය තුළ ෆජ්ර් සලාතය වෙනුවෙන් නියමිත කාලය ආරම්භ වීමට මිනිත්තුවකට පෙර, යම් ස්ත්‍රියක් (ඔසප් වීම නතර වී) පිරිසිදු වුවහොත් එදින, ඇය උපවාසයේ යෙදිය යුතු ය. එලෙස වූ ඇයගේ උපවාසය නිවැරදි වේ. එය ඌණ පූර්ණ ('කලා':) කිරීම ද අවශ්‍ය නොවේ. හේතුව ඇය ෆජ්ර් සලාතය ළඟා වනතුරු ජල ස්නානය නොකළත්, ඔසප් වීම නතර වූ විගස උපවාසය් යෙදීම ය. මෙය යම් කෙනෙකුට සිහිනෙන් තෙත් වීම නැතහොත් ජනාබාහ් වේ තත්ත්වයේ සිටීම වැනි තත්ත්වයන්ට සමාන වේ. ඔහු (ෆජ්ර් සලාතයට පෙර ආහාර ගෙන) 'සහර්' කොට, උපවාසයේ යෙදී, ෆජ්ර් සලාතයට පසු ව ජල ස්නානය කළ හැකි ය.

සමහර ස්ත්‍රීන් සවස් කාලයෙහි උපවාසය නිම කරගත් පසු ව, ඉෂා සලාතයට පෙර ඔසප් වීමට පත්වුවහොත් ඔවුහු යෙදුණු උපවාසය නිෂ්ඵල වී ගිය බවට දුක්වෙයි. මෙසේ දුක්වීම වැරදි බව ඔවුන් ට මම අවවාද කිරීමට කැමැත්තෙමි. ඔවුන්ගේ ඔසප් වීම ඉර බැස ගිය (මඃරිබ් සලාතයට පසුව) විනාඩියකින් පසු ව සිදු වුව ද එදින ඔවුන් යෙදුනු උපවාසයට කිසිදු හානියක් වන්නේ නැත. එය නිවැරදි ය. එය නිසියාකාරව සම්පූර්ණ කළ උපවාසයක් වෙයි. ඒ ගැන කිසිදු සැකයක් ඇති කර ගැනීමට අවශ්‍යය නැත.

## හජ්, උම්රා සමයයෙ හි ඔසප් වීමට පත් වීම

**ප්‍රශ්න අංක - 11 :** ස්ත්‍රියක් හජ් සමයෙහි ඔසප් වෙයි. නමුත් ඇය ඒ ගැන කිසිවෙකුට කීමට ලැජ්ජා වෙයි. (එම තත්ත්වයේම) ඇය මස්ජිදුල් හරාමය තුළ ට පිවිසී සලාතයේ යෙදෙයි, තවාෆ්, සඃර් යනාදියෙ හි ද යෙදෙයි. මෙලෙස හැසුරුණු ඇය කුමක් කළ යුතු ද ?

**පිළිතුර :** ඔසප් වී සිටින ස්ත්‍රියක් තමාගේ නිවෙසෙහි හෝ මක්කාවෙහි හෝ වෙනත් කිසිදු ස්ථානයක හෝ සලාත් නොකළ යුතු ය. එයට අනුමැතිය නැත. නබි (සල්) තුමා, "ඔසප් වී සිටින ස්ත්‍රියක් සලාතය ඉටු කිරීම, උපවාසයේක් යෙදීම යනාදිය නොකරයි යනු ඇත්ත නොවෙයි ද ?"[66] යනු ඇසුවේ ය.

ස්ත්‍රියක් ඔසප් වී සිටිය දී සලාතය හා උපවාසය ඉටු නොකළ යුතු යි යන්න සියලුම ඉස්ලාමීය විද්වතුන්ගේ ඒකමතික - ඉජ්මාඃවට අයත් - තීරණය වේ. මෙම ස්ත්‍රිය තමාගේ මෙම ක්‍රියාවට පශ්චාත්තාපපයට පත් වී අල්ලාහ්ගෙන් සමාව අයැද සිටිය යුතු ය. තවද එම අවස්ථාවෙහි ඇය ඉටුකළ තවාෆය ද වලංගු නැත. එම තවාෆය ඌණ පූර්ණ ('කලා':) කළ යුතුය. එනම්, ඒ වෙනුවෙන් වෙනත් තවාෆයක් ඉටු කළ යුතු ය. එලෙස ඇය ('කලා':) තවාෆයක් ඉටු කරන තුරු ඇයගේ සැමියා ඇය සමග සංසර්ගයේ නොයෙදී සිටිය යුතු ය. සමහර විට මෙම වරද විවාහ නොවූ ස්ත්‍රියක් කළේ නම්, ඇය මෙම වරදට නිවැරදි කිරීමක් වශයෙන් නැවත තවාෆය ඉටු කරනතුරු, ඇය විවාහ ගිවිසුම් ඇති කරගත නොයුතු ය. අල්ලාහ් සර්වඥ හා ඥනී වේ. ඇය ඉටු කළ 'සඃර්' ය වලංගු බව දැක්වීමට වැදගත් සාක්ෂි ඇත. මෙම සාක්ෂි අනුව තවාෆයට පෙර 'සඃර්' ඉටු කිරීම අනුමත කළ හැකි ය.

---

66. මූලාශ්‍රය : සහීහුල් බුහාරි (අරාබි - ඉංග්‍රීසි) වෙළුම : 1, පි : 182, හදීස් අංකය : 301

**ප්‍රශ්න අංක - 12 :** ස්ත්‍රියක් ඔසප් වී සිටිය දී මීකාත්[67] ය පසුකර යයි. නමුත්, ඇය ඉහ්රාම් ඇන්දේ නැත. ඇය පිරිසිදු වනතෙක් මක්කාවේ ම සිටියි. පිරිසිදු වූවාට පසු ව එහිදී ම ඉහ්රාම් අඳියි. මෙය අනුමත කළ හැකි ද ? අනුමත නොකෙළේ නම් කුමක් කළ යුතු ද ?

**පිළිතුර :** මෙය අනුමත කළ ක්‍රියාවක් නොවේ. ස්ත්‍රියක් තමාගේ ඉහ්රාම් ඇඳුම මීකාතයෙහි ම ඇඳිය යුතු ය. ඇය ඔසප් වී සිටිය දී ද මීකාතය පසුකර නොයායුතු යි. එවිට ඇයගේ ඉහ්රාමය වලංගු ය. මේ සඳහා වූ සාක්ෂි අබුබකර් (රළි) තුමාගේ භාර්යාව වන අස්මා බින්ත් උමෛස් තුමියගේ ජීවිතයෙහි ඇත. එතුමිය හජ් කර්තව්‍යය ඉටු කිරීමට යන අතර මඟදී දරුවෙක් ප්‍රසූතය කරයි. එවිට නබි (සල්) තුමා, තමාගේ සමුගැනීමේ හජ් කර්තව්‍යය ඉටු කිරීමට පැමිණ දුල් හුලෙෆාවෙහි[68] ඇති මීකාතයෙහි සිටියි. ඇය "මෙම අවස්ථාවෙහි කුමක් කළ යුතු ද ?" යනු අසා නබි (සල්) තුමා වෙත කෙනෙක් යවයි. "ජල ස්නානය කරන්න, ඉස් තද්පිර්සී[69] කර ඉහ්රාම් අඳින්න"[70] යනු නබි (සල්) තුමා පැවසූ හ. ඔසප් වීමේ රුධිර නිෆාසයේ රුධිර මෙන් ය. මෙයින් අදහස් වන්නේ කුමක් ද යත්, ස්ත්‍රියක් නිෆාසයේ රුධිර පිරිසිදු කරන ලෙස ම ඔසප් වීමෙන් පිටවෙන රුධිර ද පිරිසිදු කර ඉහ්රාම් ඇඳිය යුතුයි යන්න ය.

ඉහ්රාම් ඇඳ සිටින නමුත් ඔසප් වූ ස්ත්‍රියක්, තමා පිරිසිදු වනතෙක් මස්ජිදුල් හරාමයට ඇතුල් විය නොයුතු ය. තවාෆය ද නොකළ යුතුය. උම්රා සමයෙහි ඔසප් වීමට පත් වූ ආයිෂා (රළි) තුමියට නබි (සල්) තුමා මෙසේ පැවසුවේ ය. "සියලු ම වන්දනාකරුවන් ඉටුකරන කර්තව්‍යයන් (ඔබද) ඉටු කරන්න. එහෙත් ඔබ පිරිසිදු වනතෙක් කෑබාව තවාෆ් නොකරන්න."[71]

තව ද තමාගේ ඔසප් වීමෙන් පිරිසිදු වූ පසු ව තවාෆය හා සෑර් ය ඉටුකළ බව ආයිෂා (රළි) තුමිය පැවසුවාය. මෙය සහීහුල් බුහාරි හදීස් ග්‍රන්ථයේ සඳහන් වී ඇත. මෙයින් දන්වනු ලබන්නේ : ස්ත්‍රියකට, ඉහ්රාමයෙහි සිටියදී හෝ තවාෆය ඉටු කිරීමට පෙර ඔසප් වීම ඇතිවුවහොත්, ඇය පිරිසිදු වී ජල ස්නානය කරන තෙක් තවාෆය හා සෑර් ය ඉටු නොකළ යුතු බව ය. ඇයට තවාෆයටපසු ව ඔසප් වීම ඇතිවුවහොත් ඇයට සෑර් ය ඉටුකර තමාගේ හිසකෙස්වලින් ටිකක් කපා උම්රාවට අදළ කර්තව්‍යයන් සියල්ලම ඉටු කළ හැක. මෙයට හේතුව සෑර් ය ඉටුකිරීමට ඔසප් වීමෙන් පසු පිරිසිදු වී සිටිය යුතු යයි කොන්දේසියක් නොවීම ය.

---

67. මීකාත් : 'මවාකීත් නම් වූ බහු වචනයේ ඒක වචනය මීකාත් වේ. හජ් හෝ උම්රා ඉටු කිරීමට යන්නෙක් ඉහ්රාම් ඇඳීම අවශ්‍ය වේ. මෙම ඉහ්රාමය අඳින ස්ථානයට මෙම නම යෙදේ.
68. දුල් හුලෙෆාහ් : මදීනාවේ සිට මක්කාවට යන මාවතේ හයවෙනි සැතපුම් කණුවෙහි ඇති ස්ථානයේ නම
69. ඉස්තද්පිර්ස් : ස්ත්‍රියගේ ඔසප් වීමේ සමයෙහි රහස් ප්‍රදේශයේ තදව ඇඳ ගන්නා රෙදි කැබැල්ලක (Pad) නම
70. මූලාශ්‍ර :සහීහ් මුස්ලිම් (ඉංග්‍රීසි) වෙළුම: 2, පි: 598 - 599 හදීස් අංක: 2762, 2763
71. අධෝ ලිපි අංක 9 බලන්න.
72. මූලාශ්‍රය : සහීහුල් බුහාරි (අරාබි-ඉංග්‍රීසි) වෙළුම: 1, පි:188,189, හදීස් අංක: 314,316

## ඔසප් වීම සහ දික්කසාදය

**ප්‍රශ්න අංක - 13 :** කරුණාකර වෙනස් කරන දික්කසාදයට අදාළ කොන්දේසි මොනවාද යනු විස්තර කරන්න. දික්කසාද වූ ස්ත්‍රිය ඉද්දවෙහි පසුවෙද්දී ඇයගේ සැමියාගේ නිවසෙහි සිටිය යුතු ද ? නැතහොත් ඇය තම පවුලට අයත් නිවෙසෙහි සිටිය යුතු ද ?

පිළිතුර : දික්කසාද වූ ස්ත්‍රිය තම ඉද්ද කාලය තම සැමියාගේ නිවෙසෙහි ම ගෙවිය යුතු ය. ඒ හැර, ඇයගේ සැමියා ඇයව (තම නිවෙසෙන්) බැහැර කිරීම නීති විරෝධී ක්‍රියාවකි.

අල්ලාහ් නියෝග කරයි :

﴿ لا تُخرِجوهُنَّ مِنْ بُيوتِهِنَّ ولا يَخرُجْنَ إلاَّ أنْ يأتِينَ بفاحِشةٍ مُبَيِّنةٍ وتِلكَ حُدُودُ اللهِ وَمَن يَتَعَدَّ حُدُودَ اللهِ فَقَدْ ظَلَمَ نَفْسَهُ ﴾ [الطلاق الآية ١]

**"(ඉද්ද සමයෙහි) එම ස්ත්‍රීන් ප්‍රසිද්ධ ව පාපකාරී ක්‍රියාවක් කළොත් මිසඔවුන්ව ඔවුන්ගේ නිවෙස්වලින් ඔබ බැහැර නොකරන්න, ඔවුන් ද බැහැර වී නොයන්න. මේ අල්ලාහ් විසින් පනවන ලද සීමාවන්ය. යමෙක් අල්ලාහ්ගේ සීමාවන් ඉක්මවා යන්නේද, ඔහු තමා විසින් ම අකටයුත්තක් කරගත්තා වෙයි."**

(අල් කුර්ආන් 65-1)

නමුත්, සමහර මිනිසුන් කුමක් කරන්නේ ද යත්, ඔවුහු දික්කසාද කළ ඔවුන්ගේ භාර්යාවන් එම භාර්යාවන්ගේ දෙමාපියන්ගේ නිවෙස්වලට පිටත් කර යවන්නේ ය. මෙය වැරදි ක්‍රියාවක් පමණක් නොව අල්ලාහ්ගේ නියෝගයන්ට ද විරුද්ධ වූවකි. ඉහත සඳහන් අල්කුර්ආන් වාක්‍යයන්හි ඔවුන්ව තම නිවෙස්වල ම තබාගත යුතු බව පවසන අල්ලාහ්, එසේ තබාගැනීමේ යහපත කුමක් ද යනු මෙසේ පවසයි :

﴿ لا تَدْرِي لَعَلَّ اللهَ يُحْدِثُ بَعْدَ ذَلِكَ أمراً ﴾ [ الطلاق, الآية ١ ]

**"එයට පසු ව, (සාමදාන ව යා හැකි) යම් වාතාවරණයක් අල්ලාහ් ඇතිකරන්නට පුළුවන යන්න (ඔබගේ භාර්යාව දික්කසාද කළ) ඔබ නොදන්නෙහි ය."**

(අල් කුර්ආන් 65:1)

එහෙයින්, මුස්ලිම්වරුන් තමන්ගේ සියලු ම කාර්යයන් හි ඉස්ලාමීය මාර්ගයේ යනවා හැර, අල්ලාහ්ගේ නීති රීති හා සීමාවන් ඉක්මවා යන වැරදි නොකර සිටිය යුතුයි.

ඇය තම සැමියාගේ නිවෙසෙහි සිටිය දී තමා අලංකාර වත් කර ගැනීමටත්, තම සැමියා සමඟ සතුටු සාමීචිව කථා කිරීමටත්, අනුමැතිය ඇති සෑම කාර්යයක් ම කිරීමටත් හැකිය. මෙවැනි අවස්ථාවක ඇය නොකළ යුත්තේ සැමියා සමඟ සංසර්ගයේ යෙදීම ද, ඊට පොළඹවන කාර්යයන්හි යෙදී සිටීම ද වෙයි. මෙම කාර්යයන් අනිවාර්යයෙන්ම නොකළ යුතුය. මේ අතර "මම ඔබව ආපසු භාර ගනිමි." යනු පවසා, ඇයව තමාවෙත ලබා ගැනීමේ චේතනාවෙන් (නියියතය ඇතිව) ඇයගේ සැමියා ඇය සමඟ සංසර්ගයේ යෙදීමට ද පුළුවන.

දික්කසාද වූ ස්ත්‍රියකගේ ඉද්දාව සම්බන්ධව ඉතා වැදගත් කරුණු ටිකක් පැහැදිලි කරනු කැමැත්තෙමි.

එම කරුණු මෙසේය :

ඇය තමාගේ සැමියා සමඟ සංසර්ගයේ යෙදීමට පෙර හෝ ඔහු සමඟ කිසිවිටෙක තනිව රැඳී සිටීමට පෙර හෝ දික්කසාද කරනු ලැබුවේ නම්, එවිට ඇයට ඉද්දා යනු යමක් නැත. ඇය දික්කසාද කරනු ලැබූ විගස, ඇය කැමති නම් (වෙන කෙනෙකු) විවාහ කර ගත හැකිය. නමුත්, එම සැමියා ඇය සමඟ තනිව සිටියේ නම් හෝ සංසර්ගයේ යෙදුනේ නම් හෝ, එවිට ඇය ඉද්දාවේ සිටිය යුතුය. ඇයගේ ඉද්දාව පහත සඳහන් අනෙක් කොන්දේසි සමඟ සම්බන්ධ වී ඇත්තේ ය.

අ) ඇය ගැබ්ගෙන සිටියි නම්, ඇයගේ ඉද්දාව ප්‍රසූතිය තෙක් දික්ගැසෙයි. ඇය ගැබ් ගෙන සිටින කාලය කෙතරම් හෝ වේවා, ඒ ගැන සැලකිල්ල යොමුකරන්නේ නැත. උදාහරණයක් වශයෙන්: ඔහු ඇයව උදේ වරුවේ දික්කසාද කරයි, දවල් වීමට පෙර ඇයට ප්‍රසූතිය සිදුවෙයි. එපමණයි, ඇයගේ ඉද්දාවේ කාල සීමාව එතැනින් නිමවෙයි. ඔහු ඇයව මුහර්රම් මාසයේ දික්කසාද කරයි, ඇයට දුල්හජ් මාසයේ ප්‍රසූතිය සිදුවෙයි. එවිට ඇයගේ ඉද්දා කාල සීමාව මාස දොළහක් වෙයි. මෙය මෙසේ වීමට හේතුව, ගැබිණියකගේ ඉද්දා කාල සීමාව කොපමණ ද යනු පැහැදිලිවම අල්ලාහ් දන්වා ඇති බැවිනි.

ඔහු මෙසේ පවසයි:

﴿ وَأُولاتُ الأَحْمالِ أَجَلُهُنَّ أَنْ يَضَعْنَ حَمْلَهُنَّ ﴾ [ الطلاق، الآية ٤ ]

**"තවද, ගැබිණියන් හට (ඔවුනු දික්කසාද කර හෝ ඔවුන්ගේ ස්වාමිපුරුෂයන් මරණයට පත් වී හෝ ඇත්තේ නම්)ඉද්දා කාලය ඔවුන්ගේ දරු ප්‍රසූතයෙන් නිම වෙයි".**

**(අල් කුර්ආන් 65:4)**

ආ) ඇය ගැබිණියක් නොවෙයි. එහෙත් ඔසප් වීමට පත්වෙන කෙනෙක් විය හැක. එවිට ඇයගේ ඉද්දාව දික්කසාද කළ දින පටන් සම්පූර්ණ මාස තුනක කාල සීමාව වෙයි. උදාහරණයක් වශයෙන් : ඇයට පළමු ඔසප් වීම ඇති වී පිරිසිදු වෙයි. (එය පළමු සීමාවය.) දෙවෙනි ඔසප් වීම ඇති වී පිරිසිදු වෙයි. (මෙය දෙවෙනි සීමාවය). අවසානයෙන්, ඇයට තුන්වෙනි ඔසප් වීම ඇති වී පිරිසිදු වෙයි. (මෙය තුන්වෙනි සීමාවය.) මෙම එක් එක් කාල සීමාව අතර ඇති කාල ප්‍රමාණය සම්බන්ධව ඉද්දාව ස්වාධීන වෙයි.

**උදාහරණයක් වශයෙන්** : ඇය තම දරුවාට කිරි දෙන කාලයේදී දික්කසාද කරනු ලබන බව සිතමු. එහෙයින්, ඇයට අවුරුදු දෙකකට අධික කාලයක් පසුවුවද ඔසප් වීම ඇති නොවූයේය. මෙම අවස්ථාවෙහි ඇයගේ අනෙක් ඔසප් වීම් දෙකම ඇතිවෙන තුරු ඇය ඉද්දාවෙහි සිටින බව සැලකිය යුතුය. මෙහි ඇති වැදගත් කාරණයක් නම් ඔසප් වීම් තුනේ සීමාවන් අතර ඇති කාල ප්‍රමාණය ගැන (එය වැඩි හෝ අඩු බවට) සැලකිල්ල යොමු කරන්නේ නැත යන්නය. ඉද්දාව වශයෙන් ඔසප් වීම් තුනක් සම්පූර්ණ කළ යුතුය.

අල්ලාහ් මෙසේ පවසයි :

﴿ والْمُطَلَّقاتُ يَتَرَبَّصنَ بأنفسِهِنَّ ثلاثةَ قُروءٍ ﴾[البقرة ، الآية ٢٢٨]

**දික්කසාද වූ ස්ත්‍රීන් මාස් ශුද්ධි තුනක් තෙක් බලාපොරොත්තු විය යුතුය".**

**(අල් කුර්ආන් 2:228)**

ඈ) ඇය වැඩිවියට පත්නොවූ නිසා හෝ වයස්ගත වීම නිසා හෝ ඔසප් වීම සිදු නොවුවහොත්, එවිට, අල්ලාහ්ගේ නියෝගය අනුව ඇයගේ ඉද්දා කාල සීමාව මාස තුනක් වේ.

අල්ලාහ්ගේ නියෝගය මෙයයි :

﴿ واللائي يَئِسنَ من المحيضِ من نسائِكُم إن ارتَبتُم فَعِدَّتُهُنَّ ثلاثةَ أشهُرٍ واللائي لم يَحِضْنَ ﴾

**"ඔබගේ ස්ත්‍රීන්ගෙන්, කවර අය තමන්ට මාස් ශුද්ධිය ඇති නොවෙයි' යනු බලාපොරොත්තු නැතිව සිටින්නේ ද ඔවුන් ගැන (ඉද්දාව ගණන් ගැනීමේ දී) ඔබට සැකයක් ඇතිවුවහොත්, (ඔබ දැනගන්න) ඔවුන්ගේ ඉද්දා කාලය මාස තුනක් වේ. තව ද, කිනම් ස්ත්‍රීන්ට (වැඩිවියට පත්නොවූ හෙයින්) මේ වනතෙක් මාස් ශුද්ධිය ඇති නොවුනේ ද ඔවුනු සඳහා වූ ක්‍රියා මාර්ගය ද මෙයම වේ."**

**(අල් කුර්ආන් 65:4)**

ඈ) ඔසප් වීමට පත් වීගෙන සිටි ස්ත්‍රියකට යම් යම් දන්නා හේතූන් නිසා එය නතර වෙයි. (උදාහරණයක් වශයෙන් : ඇයගේ ගර්භාෂය ඉවත් කිරීම වැනි දේ කිව හැක.) එලෙස නැවතුනු ඔසප් වීම නැවත ඇතිවෙන්නේ ම නැත. මෙම ස්ත්‍රියගේ ඉද්දා කාල සීමාව ඔසප් වීමේ කාල සීමාව ඉක්මවා ගිය වයස්ගත ස්ත්‍රීන්ගේ කාල සීමාව වැනිය. එනම්, මාස තුනක් වේ.

ඉ) යම් යම් දන්නා හේතූන් නිසා තමාගේ ඔසප් වීම නැවතුණු බව දැනගත් ස්ත්‍රියක්, එම හේතූන් නැති වී නැවත ඔසප් වීම ඇතිවනතෙක් බලාපොරොත්තු විය යුතුය. ඇයගේ ඉද්දාව සම්පූර්ණ ඔසප් වීමේ මාස තුනක කාල සීමාව වේ.

ඊ) සමහර විට, නොදන්නා හේතූන් නිසා ඇයගේ ඔසප් වීම නැවතුණු බව වැටහෙන්නේ නම්, ඉස්ලාමීය විද්වතුන්ගේ මතය අනුව ඇයගේ ඉද්දා කාල සීමාව අවුරුදු එකක් වේ. ගැබ්ගත් කාල සීමාවන් තුන වෙනුවෙන් මාස නවයක් ද, ඉද්දාව වෙනුවෙන් වූ මාස තුනක් ද මෙහි අඩංගු වේ.

අවසාන වශයෙන්, කිනම් ස්ත්‍රියකගේ විවාහ ගිවිසුම, "අල් කුල්" හේතු කරණකොට ගෙන හෝ වෙනත් මාර්ගයන් තුළින් හෝ අවලංගු වේනම්, එවිට ඇයගේ ඉද්දා කාල සීමාව එක් ඔසප් වීමේ කාල සීමාව පමණි.*

---

4 වෙනි පරිච්ඡේදයේ, දික්කසාදය ගැන වූ 7 වෙනි උපමාතෘකාව යටතේ ඇති 3 වෙනි වගන්තිය බලන්න.

- මෙම පොතේ අනේක තැන් හි ඊමාන්, ඊමාන්ධාරීන්, මූඃමින්වරු යන වචන ඇත. 'ඊමාන්' යන්නෙ හි තේරුම 'විශ්වාසය' නම් වේ. ඊමාන්ධාරීන් හෝ මූඃමින්වරු හෝ කියන්නේ 'විශ්වාසවන්තයන්' යන අදහසිනි.

ඉස්ලාමීය ඉගැන්වීම් අනුව පහත සදහන් ප්‍රධාන කරුණු හයම විශ්වාස කිරීම 'ඊමාන්' යනු කියනු ලැබේ; එම විශ්වාසය ඇත්තා වෙයි.

| | අරාබි භාෂාවෙන් කියවෙන මෙය සිංහලට නගා මෙසේ කියන්න. | | මේවායේ තේරුම |
|---|---|---|---|
| 1. | ආමන්තුබිල්ලාහි | – | අල්ලාහ්ගේ ඒකීයභාවය |
| 2. | ව මලාඉක්කතිහී | – | (ඔහුගේ) මලාඉකාවරු |
| 3. | ව කුතුබී හී | – | (ඔහුගේ) පුස්තක |
| 4. | ව රුසුලිහී | – | (ඔහුගේ) නබී (වක්තෘ) වරු |
| 5. | වල් යව්මිල් ආ හිර් | – | විනිශ්චය දිනය |
| 6. | වල්කද්රි හයිරිහී වසර්රිහි මිනල්ලාහි තආලා | – | හොඳ නොහොඳ සියල්ලම අල්ලාහ්ගේ පෙරමිනුම අනුව ක්‍රියාවෙයි. |

---

මෙම පොතේ වරහන් තුළ යොද ඇති කෙටි අක්ෂර මුළුමනින් උච්චාරණය කළයුතු ආකාරය හා ඒවායේ තේරුම පහත සදහන් වෙයි.

1. (සල්) සල්ලල්ලාහු අලෛහි ව සල්ලම්
   (අල්ලාහ්ගේ ශාන්තිය හා ආශිර්වාද එතුමාට ලැබේවා!)

2. (අලෛ) අලෛහිස්සලාම්
   (අල්ලාහ්ගේ ශාන්තිය එතුමාට ලැබේවා!)

3. (රළි) රළියල්ලාහු අන්හු (පිරිමින්)

4. (රළි) රළියල්ලාහු අන්හා (ස්ත්‍රීන්)
   (අල්ලාහ්ගේ කරුණාව එතුමාට / එතුමියට ලැබේවා!)

5. (රහ්) රහ්මතුල්ලාහි අලෛහි
   (අල්ලාහ්ගේ කරුණාව එතුමාට ලැබේවා!)

ⓒ المكتب التعاوني للدعوة والإرشاد بالبديعة ، ١٤١٦هـ
فهرسة مكتبة الملك فهد الوطنية أثناء النشر
العثيمين ، محمد بن صالح
الدماء الطبيعية للنساء/ ترجمة شريف الدين محمد منصور .
٦٤ ص ، ١٧ × ٢٤ سم
ردمك ٠ _ ٢٢ _ ٧٩٩ _ ٩٩٦٠
( النص باللغة السنهالية )
١ _ الحيض ( فقه إسلامي ) ٢ _ الطهارة ( فقه إسلامي )
أ _ منصور ، شريف الدين محمد ( مترجم ) ب _ العنوان
ديوي ٢٥٢,١ ١٦/٠٥١٤
رقم الإيداع : ١٦/٠٥١٤
ردمك : ٠ _ ٢٢ _ ٧٩٩ _ ٩٩٦٠

# الدماء الطبيعية للنساء

تاليف

فضيلة الشيخ / محمد بن صالح العثيمين

تَرجَمَهُ للسنهالية

شريف الدين محمد منصور

سنهالي - ٦٥

# الدماء الطبيعية للنساء

تأليف فضيلة الشيخ

**محمد بن صالح العثيمين رحمه الله**

ترجمه للسنهالية

**شريف الدين محمد منصور**

ردمك: ٠-٢٢-٧٩٩-٩٩٦٠

The Co-operative office for Call & foreigners Guidance at Sult

المكتب التعاوني للدعوة والإرشاد وتوعية الجاليات بسلطانة
تحت إشراف وزارة الشؤون الإسلامية والأوقاف والدعوة والإرشاد
هاتف: ٤٢٤٠٠٧٧ ناسوخ: ٤٢٥١٠٠٥ ص ب ٩٢٦٧٥ الرياض ١١٦٦٣ بريد إلكتروني E.mail : Sultanah22@hotmail.com